වාර්ෂික වාර්තාව - 2021

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව

ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව
120/7, විද්‍යා මාවත, කොළඹ 07
දුරකථන අංකය: 011-2675176 ෆැක්ස්: 011-2675136
ඊ-මේල්: admin@nrc.gov.lk වෙබ්: www.nrc.gov.lk

පටුන

පටුන 1

දැක්ම සහ මෙහෙවර 2

අරමුණු 3

කාර්යයන් 4

කවුන්සිලය (2021-01-01 සිට 2021-12-31දක්වා) 5

කාර්ය මණ්ඩලය 6

සභාපතිතුමාගේ පණිවුඩය 7

ප්‍රධාන විධායක නිලධාරි වාර්තාව 8

පසුගිය වර්ෂ 3 සඳහා අදාල මූල්‍ය සුවිශේෂිතාවන් 12

ජාතික පර්යේෂණ සභාවේ වැඩසටහන් 14

2021 වසරේ විශේෂ අවස්ථා 18

ඉලක්කමත පදනම් බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන 18

අන්වේෂකමත පදනම් පර්යේෂණ ප්‍රදාන 22

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන 24

රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතා වැඩසටහන 25

ඉක්මන් ප්‍රතිචාර හා විශේෂ ප්‍රදානයන් 27

වෙනත් වැඩසටහන් 30

වාර්ෂික ගිණුම් – 2021 (ඇමුණුම I) 37

විගණකාධිපති වාර්තාව (ඇමුණුම II) 38

සම්බන්ධවීම සඳහා තොරතුරු 39

දැක්ම

“දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට
ශ්‍රී ලංකාව පත් කිරීම”

මෙහෙවර

“මූලික හා ප්‍රායෝගික පර්යේෂණ ප්‍රවර්ධනය,
මූල්‍යනය හා පහසුකම් සැපයීම සහ අධීක්ෂණය සහ
ශ්‍රී ලංකාවේ මානව සම්පත් වර්ධනය තුළින්
දැනුම හා විද්‍යාව පදනම් කරගත්
සංවර්ධිත රටක තත්ත්වයට ශ්‍රී ලංකාව පත්කිරීම”

අරමුණු

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ 2016 අංක 11 දරණ පනත හා අනුකූලව, ජාතික පර්යේෂණ සභාවේ අරමුණු වන්නේ;

- ❖ රට තුළ ක්‍රියාකාරී විද්‍යාත්මක සහ තාක්ෂණික ප්‍රජාවක් ගොඩනැංවීම අරමුණු කරගනිමින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම පිණිස පහසුකම් සපයාදීම සඳහා රජයට සහායවීම;
- ❖ ජාතික අවශ්‍යතාවන් සඳහා දායකත්වය සපයන පර්යේෂණ පදනමක් සංවර්ධනය කිරීම පිණිස උසස් අධ්‍යාපන ආයතනයන්හි, රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි සහ වෙනත් රාජ්‍ය ආයතනයන්හි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළව සිදුකෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය සහ ඒ සඳහා පහසුකම් සැලසීම; හා
- ❖ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගීතාවය අපේක්ෂා කිරීම;

කාර්යයන්

- සභාවේ අරමුණු ළඟා කරගනු වස් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රය හා අදාළ පර්යේෂණයන් සිදුකිරීම සඳහා ප්‍රතිපාදන සලසාදීම;
- පර්යේෂණ සඳහා රජය විසින් සිදුකරනු ලබන ආයෝජනයන් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කරනු පිණිස, උසස් අධ්‍යාපන ආයතන, රාජ්‍ය අංශයේ පර්යේෂණ ආයතන සහ වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදී ඇති ප්‍රතිපාදන හා සම්බන්ධ විද්‍යා හා තාක්ෂණික පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය හා සුපරීක්ෂණය සිදුකිරීම;
- සභාවෙහි කාර්යයන් කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පිරියත, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ආනයනය කිරීම සහ පිළිගත් දේශීය හෝ විදේශීය ප්‍රභවයන් වෙතින් උපකරණ, අරමුදල් සහ අනෙකුත් සහායයන් ලබාගැනීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් පිළිබඳව සිදුකෙරෙන පර්යේෂණයන්හි වාර්තා, වාර සඟරා සහ පත්‍රිකා ඒකරාශී කිරීම, මුද්‍රණය සහ ප්‍රකාශයට පත්කිරීම;
- දේශීය හෝ විදේශීය විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි සිදුකෙරෙන විද්‍යාත්මක අධ්‍යයනයන් හෝ විද්‍යාත්මක කාර්යයන් සඳහා ශිෂ්‍යත්ව සහ අධිශිෂ්‍යත්ව පිරිනැමීම;
- විද්‍යාව හා තාක්ෂණයට අදාළව සිදුකෙරෙන පර්යේෂණ හා නවෝත්පාදන පිළිගැනීමට ලක්කිරීමේ සහ ඒවාට සම්මාන ප්‍රදානය කිරීමේ ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීම;
- විද්‍යාව හා තාක්ෂණය සහ අදාළ විෂයයන් ආශ්‍රිතව සිදුකෙරෙන පර්යේෂණ පිළිබඳ දේශන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

කවුන්සිලය (2021-01-01 සිට 2021-12-31 දක්වා)

සභාපති

- මහාචාර්ය එස්.එච්. දොඩම්පහල

අනෙකුත් සාමාජිකයින්

- මහාචාර්ය එන්.එල්.වී.වී. කරුණාරත්න
- මහාචාර්ය කේ.ජී.එස්.සී. ජයරත්න
- මහාචාර්ය ආර්.ටී. සේරසිංහ
- මහාචාර්ය එම්.ඩී.ඒ.එල්. රණසිංහ
- මහාචාර්ය ඕ. අමරසිංහ
- ආචාර්ය ඒ.ඩී.පී.ද එස්. අරුණතිලක
- ආචාර්ය බී.සී.එස්. පෙරේරා (2021.06.30 දින ඉල්ලා අස්විය)
- ආචාර්ය එම්.එන්. ගමගේ
- ආචාර්ය ඒ. ඒ. පැස්කුවල්
- මහාචාර්ය පී.සී.ජී. බණ්ඩාරනායක (2021.09.22 දින පත්කරන ලදී)

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ නියෝජිත

- පී.එම්. ධර්මතිලක (2021.08.09 දින සිට)

භාණ්ඩාගාර නියෝජිත

- එස්. හෙට්ටිආරච්චි මිය (2021.04.08 දින සිට)

කාර්ය මණ්ඩලය

2021.12.31 දිනට

ප්‍රධාන විධායක නිලධාරි: එම්.සී. රාජපක්ෂ

සහකාර අධ්‍යක්ෂ (විද්‍යාත්මක කටයුතු): පි. කේ. ඒ. එස්. ආර්. නෝනිස්

සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන): ආර්. ඩී. එස්. දිසානායක

විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	කේ.එන්.කේ. දිසානායක
විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	එස්.එස්. කටුගම්පල
විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	එම්.එස්. පෙරේරා
විද්‍යාත්මක/පර්යේෂණ නිලධාරී:	බී.එම්.එන්.සී. කරුණාරත්න
පරිපාලන නිලධාරි:	ඒ.කේ.ඩි.එම්. පෙරේරා
ගිණුම් නිලධාරි:	ඒ.ඊ්.කේ. දයාරත්න
ප්‍රසම්පාදන නිලධාරි:	ඩබ්.ඩී.ටි.ඩි. වික්‍රම

කළමනාකරණ සහකාර:	එස්.එච්.එස්. ප්‍රියංකර
කළමනාකරණ සහකාර:	එම්.ඩී.ටී. මධුෂානි
කළමනාකරණ සහකාර:	එම්.එස්. සෙව්වන්දි
කළමනාකරණ සහකාර:	එම්.ඒ.කේ.එල්. පෙරේරා
කළමනාකරණ සහකාර:	කේ.ඒ.ඩී.එම්. කුමාරසිංහ
කළමනාකරණ සහකාර:	එන්.ඊ්. අත්තනායක
කළමනාකරණ සහකාර:	ඩබ්.ජී.පී. ප්‍රියදර්ශන
කළමනාකරණ සහකාර:	ඩබ්.එස්.ඩී. පෙරේරා

රියදුරු:	කේ. කේ.ටී. සඳරුවන්
රියදුරු:	එස්.එස්. ජයසිංහ

සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික පර්යේෂණ සභාවේ 2021 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට ලැබීම සතුටකි.

කෝවිඩ්-19 වසංගතය නැවත මතුවීම හා පශ්චාත් කොවිඩ් ආර්ථික අර්බුදය හමුවේ මුහුණදුන් බාධාවන් මධ්‍යයේ වුවද, ජාතික පර්යේෂණ සභාව සිය කාර්යයන් සාර්ථකව සිදුකරනු ලැබීය. 2021 වසරේදී දේශීය හා ජාත්‍යන්තර පර්යේෂකයින්, ව්‍යවසායකයින් හා වෙනත් පාර්ශවකරුවන් ගණනාවක් සමග අත්වැල් බැඳ ගතිමු. අභියෝගයන්ට මුහුණ දෙමින් අපගේ විද්‍යාඥයින්ට ඉහළම පිළිගැනීමක් ලබාදීම අපගේ අරමුණයි.

කොවිඩ්-19 වසංගතය මගින් පර්යේෂණ ඇතුලු සෑම අංශයකම පාහේ කැපීපෙනෙන බලපෑමක් ඇතිකරනු ලැබීය. ජාතික පර්යේෂණ සභාව කොවිඩ්-19 එන්නත් සම්බන්ධයෙන් අදාල බලධාරීන්ට සිය නිර්දේශ ලබාදුන් අතර එන්නත් ලබාගැනීමේ වාසි පිලිබඳව මහජනතාව දැනුවත් කරන ලදී. දේශපාලන බලාධිකාරියේ සෘජු නිර්දේශයන් හරහා මාධ්‍ය සාකච්ඡා, ජන මාධ්‍ය ඔස්සේ පවත්වන ලද විද්වත් සාකච්ඡා මෙන්ම මහජන වෙබිනාර් ගණනාවක් මගින් මෙය සිදුකරනු ලැබීය. පිළිකා හා කසළ කළමනාකරණය යන ජාතික වැදගත්කමකින් යුත් නැගි එන ගැටලු දෙකක් සඳහා පිළියම් සෙවීම සඳහා වසර තුල විශේෂ ව්‍යාපෘති දෙකක් වෙනුවෙන් අරමුදල් සපයනු ලැබීය. ජාතික පර්යේෂණ සභාව විසින් කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ පිළිකා සඳහා ප්‍රතිකාර කිරීම ඉලක්ක කරගත් අග්නිදිග ආසියාවේ පළමු පිළිකා හදුනාගැනීමේ හා පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා සහය දක්වන ලදී. මෙම ඉලක්කගත රසායන චිකිත්සක පර්යේෂණ මගින් ඉලක්කගත නොවන ප්‍රතිකාර හේතුවෙන් සෑම වසරකම සිදුවන ජීවිත හානි ගණනාවක් වළක්වා ගැනීම අරමුණු කෙරේ. අනවශ්‍ය පිළිකා ප්‍රතිකාර වැළැක්වීම මගින් රජයට හා මහජනයාට විශාල මූල්‍යමය ඉතිරියක් ද අපේක්ෂා කෙරේ. හැකි ඉක්මනින් රටේ කසළ බැහැර කිරීමේ ගැටළුවට විසඳුමක් ලබාදීම පිණිස අපගේ දෙවන විශේෂ ව්‍යාපෘතිය වන ‘‘කාර්යක්ෂම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා දේශීය ක්ෂුද්‍රජීවී ගහණය වෙන්කර ගැනීම’’ සඳහා මූල්‍යාධාර සපයනු ලැබීය. යෝජිත මූලික ව්‍යාපෘතියේ සොයා ගැනීම් මගින් ශ්‍රී ලංකාවේ සන අපද්‍රව්‍ය ගැටළුව සඳහා තිරසාර විසඳුමක් ලබාදීමට මග සළසනු ඇත. තවද, කොළඹ ශ්‍රී ලංකා ජාතික රෝහලේ කම්පනය ලේඛණගත කිරීමේ පද්ධතිය (Trauma Registry System) ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සරිලන පරිදි යාවත්කාලීන කිරීම සඳහා ඔස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය සමග සහයෝගීතාවයක් ආරම්භ කරනු ලැබීය. ඊට අමතරව ජාතික පර්යේෂණ සභාව විසින් 2021 වසරේදී ද ආයතනයේ පහත සඳහන් වැඩසටහන් ද සාමාන්‍ය පරිදි ක්‍රියාත්මක කරනු ලැබීය; අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, සමාජ සුභසාධක වැඩසටහන සහ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන.

කවුන්සිල සාමාජිකයින් හා ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන ලද දායකත්වය අගය කරන අතරම 2021 වසර තුල ජාතික පර්යේෂණ සභාවට ලබාදුන් සහය හා දිරිමත් කිරීම වෙනුවෙන් නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයට ද මාගේ කෘතඥතාවය පලකරනු කැමැත්තෙමි.

මහාචාර්ය හේමන්ත දොඩම්පහල
සභාපති

ප්‍රධාන විධායක නිලධාරි වාර්තාව

ජාතික පර්යේෂණ සභාවේ 2021 වසරේ වාර්ෂික වාර්තාව සඳහා පණිවුඩයක් ලබාදීමට මා මෙය අවස්ථාවක් කරගනිමි. කොවිඩ්-19 පශ්චාත් වසංගතය තත්වය හේතුවෙන් මෙම වසර ආයතනයට අනපේක්ෂිත අභියෝග ගෙන දුන් වසරක් විය.

ලංකාවේ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාල පර්යේෂණ සඳහා මූල්‍යාධාර ලබාදෙන ප්‍රමුඛ ආයතනය ලෙස ජාතික පර්යේෂණ සභාව පර්යේෂණ වැඩසටහන් ගණනාවන් සඳහා පහසුකම් සලසන අතර ගුණාත්මක පර්යේෂණ කෙරේ වැඩි අවධානයක් යොමුකරන ආයතනයක් වන එමගින් විද්‍යාඥයින්ගේ පර්යේෂණ සඳහා පිළිගැනීමක් ලබාදීම මෙන්ම ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය සමග යමින් පර්යේෂණ ප්‍රතිඵල මගින් ඇතිවන බලපෑම ඇගයීම සිදුකරනු ලැබේ.

මහාචාර්ය හේමන්ත දොඩම්පහල මහතාගේ සභාපතිත්වයෙන් යුක්තව පෙර වසර සඳහා පත්කරන ලද කවුන්සලය 2021 වසර සඳහා ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. ජූනි මාසයේදී එහි සමාජිකයෙකු වන ආචාර්ය බී.සී.එස්. පෙරේරා මහතා වෘත්තිමය කටයුත්තක් හේතුවෙන් ඉල්ලා අස්වූ අතර 2021 සැප්තැම්බර් මාසයේදි මහාචාර්ය පී.සී.ජී. බණ්ඩාරනායක මහතා කවුන්සිලය සඳහා පත්කරනු ලැබීය.

මෙම වසරේදී අපට භෞතික රැස්වීම් හා ඉසව් සීමාකිරීමට සිදුවූ නමුත් මාර්ගගත ක්‍රමයට සිදුකළ හැකි කවුන්සිල රැස්වීම්, ප්‍රගති සමාලෝචන රැස්වීම්, තේරීම් කමිටු රැස්වීම් ආදී සියළු කාර්යයන් අඛණ්ඩව සිදුකරනු ලැබීය. රජය විසින් පසුගිය වසරේදී හඳුන්වා දෙන ලද නිවසේ සිට රාජකාරි කිරීමේ (WFH) නව සංකල්පය සමග කාර්ය මණ්ඩලය විසින් කාර්යයන් බොහොමයක් මාර්ගගතව සිදුකරනු ලැබූ අතර මූල්‍යමය කරුණු භෞතික හා මාර්ගගත ක්‍රමය යන දෙයාකාරයෙන්ම සිදුකරනු ලැබීය.

ජාතික පර්යේෂණ සභාවේ කාර්යයන් වනුයේ විවිධ ආකාරයේ විද්‍යාත්මක හා තාක්ෂණික පර්යේෂණ ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සැපයීම, ඒවායේ ඵලදායි ක්‍රියාත්මකවීම සාක්ෂාත් කිරීම මෙන්ම විද්‍යාඥයින් සඳහා ජාතික පිළිගැනීමක් ලබාදීමේ ක්‍රමයක් වැඩිදියුණු කිරීම සහ පෞද්ගලික ව්‍යවසායන් විසින් සිදුකරන පර්යේෂණ සඳහා පහසුකම් සැලසීම වේ.

2021 වර්ෂය තුළදී ජාතික පර්යේෂණ සභාව විසින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය; අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා වැඩසටහන, ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන, විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන, සමාජ සුභසාධක වැඩසටහන සහ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන. ඊට අමතරව පවත්නා වසර තුළ නව වැඩසටහන් තුනක් හඳුන්වා දෙනු ලැබීය; ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගිතා වැඩසටහන, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන වැඩසටහන්හි විශිෂ්ඨතාවන් සඳහා ජීවිත කාලයේ එක්වරක් ලබාදෙන සම්මාන, සහ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ වැඩසටහන - 2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම.

අන්වේෂක මත පදනම් පර්යේෂණ ප්‍රදාන වැඩසටහන පසුගිය වසර 22 පුරාම ක්‍රියාත්මක විය. එය විද්‍යාඥයින්ට නවෝත්පාදන පර්යේෂණ සිදුකිරීමට මෙන්ම නව දැනුම නිර්මාණය කිරීම සඳහා පහසුකම් සලසන තරගකාරී ප්‍රදාන යෝජනා ක්‍රමයකි. වාර්ෂිකව සිදුකරන විවෘත අයදුම්පත් කැඳවීමේදී අයදුම්කරුවන්ට කිසියම් විද්‍යාත්මක ක්ෂේත්‍රයකින් අයදුම්කළ හැකිවේ. 2021 වසර ආරම්භයේදී පෙර වර්ෂයේ සිට මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගත් පර්යේෂණ යෝජනා 23ක් විය. ඒ අනුව පශ්චාද් උපාධි අධිශිෂ්‍යත්ව 18ක් හා පශ්චාත් ආචාර්ය උපාධි අධිශිෂ්‍යත්ව 2ක් පිරිනමමින් ප්‍රදානයන් 22ක් පිරිනමනු ලැබීය.

නිපුණතා සංවර්ධන, වෘත්තිය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් ජාතික පර්යේෂණ සභාව විසින් ‘‘අමාත්‍යාංශයේ ප්‍රමුඛතා ප්‍රදාන’’ යන මැයෙන් විශේෂයෙන් අයදුම්පත් කැඳවනු ලැබීය. මෙම වැඩසටහනෙහි අරමුණ වන්නේ දේශීය ඖෂධ පැලෑටි, විලවුන්, හා ඖෂධීය ආහාර (nutraceuticals) සඳහා විද්‍යාත්මක අගය එකතුකිරීම මගින් අපනයන ආදායම් උපයා ගැනීමවේ.

ජාතික පර්යේෂණ සභා ඉතිහාසයේ පළමුවරට මාර්ගගතව අයදුම්පත් කැඳවනු ලැබීය. මෙම ප්‍රදානයන් අන්වේෂක මත පදනම් පර්යේෂණ ප්‍රදානයන්ට සමාන වන නමුත් ව්‍යාපෘති කාලසීමාව වෙනස්වේ (මාස 18), උපරිම පිරිවැය රු.මිලියන 2.5කට සීමාවන අතර ව්‍යාපෘතිය මගින් අපනයන වෙළඳපළ සඳහා වන නිෂ්පාදනයන් බිහිකළ යුතුය. ලැබුණු අයදුම්පත් 17 ඇගයුම් කර ඇති අතර කවුන්සිලයේ අවසන් අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. මේ සඳහා 2021 වසරේ අයවැය මගින් රු. මිලියන 16.3ක් වෙන්කර තිබේ.

ජාත්‍යන්තර ප්‍රකාශන 61, ආචාර්ය උපාධි 6, විද්‍යාපති පශ්චාත් උපාධි ශිෂ්‍යයින් 8ක් සිය උපාධි සම්පූර්ණ කිරීමත් සමගින් වසර තුළ අන්වේෂක පදනම් ප්‍රදාන 100කට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මකව පැවතිණ. ප්‍රදානයන් 41ක අවසන් ප්‍රගති සමාලෝචනය නිමකර ඇති අතර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ 96ක් හා දේශීය සම්මන්ත්‍රණ 68ක් හරහා පර්යේෂණයන්හි සොයාගැනීම් ප්‍රචලිත කරනු ලැබීය.

2012දී ආරම්භ කරන ලද රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා (PPP) වැඩසටහන මගින් රජයේ පර්යේෂණ හා සංවර්ධන ආයතන හා විශ්වවිද්‍යාලයන්හි විද්‍යාඥයින් හා පෞද්ගලික අංශය අතර හවුල්කාරිත්වයන් සඳහා පහසුකම් සැලසේ. මෙම ව්‍යාපෘති මගින් විසඳුම් ලබාදිය යුතු පර්යේෂණ ක්ෂේත්‍ර හා ඒවායේ වාණිජමය ශක්‍යතාවය හඳුනාගැනේ. වසර තුල අයදුම්පත් තුනක් ලැබුණු අතර ඒවායේ ඇගයීම් සිදුකෙරෙමින් පවතී. වසර තුල PPP ව්‍යාපෘති සඳහා අයදුම්පත් 7ක් ලැබුණු අතර ඉන් 3ක පර්යේෂණ හා සංවර්ධන කාර්යයන් නිමකරනු ලැබ ඇති අතර අවසන් ඇගයුම් සිදුකෙරෙමින් පවතී. "TomEJC අඹ ප්‍රභේදය අපනයනය කෙරෙහි අහිතකර ලෙස බලපාන පසු අස්වනු රෝග හා ආබාධයන් පිළිබඳව අධ්‍යයනය හා ඒවා කළමනාකරණය කිරීම" පිළිබඳ ප්‍රදානයෙහි අවසන් ඇගයුම් සිදුකර ඇත. පර්යේෂණ ප්‍රදානයේ කටයුතු නිමකරනු ලැබූ අතර අවසන් තීරණ හා ප්‍රතිඵල පිළිබඳව නිගමනය කල යුතුව ඇත. TomEJC mango අඹ ප්‍රභේදය මුහුණ දෙන ප්‍රශ්ණ සඳහා විසඳුම් සහිතව එම ප්‍රදානය සාර්ථක ලෙස නිමකර ඇත.

පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම තුලින් ජාතික වශයෙන් වැදගත් ගැටලු සඳහා දිගුකාලීන විසඳුම් සොයාගැනීම සඳහා 2013 වසරේදී ඉලක්ක මත පදනම් බහු-විෂයානුබද්ධ (TO) පර්යේෂණ වැඩසටහන ආරම්භකරනු ලැබීය. මෙම වසරේදී ප්‍රදානයන් පිරිනමනු නොලැබූ නමුත් 2022 වසර සඳහා අයදුම්පත් කැඳවනු ලද අතර ලැබූ පූර්ව යෝජනා 29 ඉදිරි කාලයේදී සභාවේ පරීක්ෂණයට ලක්කරනු ඇත. ක්‍රියාත්මකව පවතින ව්‍යාපෘති 6ක් ඇගයීම හා අධික්ෂණය කිරීම සඳහා වසර තුළ ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වනු ලැබීය. 2014 වසරේදී ආරම්භකරන ලද ව්‍යාපෘති පහෙන් තුනක් වන "වාහකයින් පාලනය මගින් ශ්‍රී ලංකාවේ ඩෙංගු පාලනය සඳහා මෙහෙයුම් ආකෘතියක්, ආරක්ෂක නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් ඒකරාශි කිරීම පිළිබඳ අංගසම්පූර්ණ පර්යේෂණ යෝජනාවක්", "කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂී තත්ත්වය ළඟාකර ගැනීම සඳහා කිරි කර්මාන්තය වැඩිදියුණු කිරීම" යන කිරි සම්බන්ධ ප්‍රදානය හා "ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම" යන කෘෂිකාර්මික ප්‍රදානයෙහි කටයුතු නිමකර ඇති අතර අවසාන ඇගයීම සිදුකරනු ලැබීය. ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය විසින් සමාලෝචන ක්‍රියාවලිවේදී ජාතික පර්යේෂණ සභාවට ලබාදෙන සහය මෙන්ම පර්යේෂණයන්හි ප්‍රතිඵල ප්‍රයෝජනයට ගන්නා මාර්ග සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම වෙනුවෙන් ස්තුතිය පළකිරීමට මෙම අවස්ථාවක් කරගනිමි. මෙම ප්‍රදානයන් තුනම සාර්ථක ලෙස නිමකරන ලද අතර පර්යේෂණයන්හි සොයාගැනීම් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවායේ ප්‍රතිඵල අදාල අමාත්‍යාංශ වලට හා බලධාරීන්ට දන්වනු ලැබීය. දැනට ක්‍රියාත්මක ප්‍රදානයන් මගින් ප්‍රතිඵල ගණනාවක් ලැබී ඇති අතර ඉන් සමහරක් මේ වනවිටත් ඒවායේ පාර්ශවකරුවන් සමග ක්‍රියාත්මක කර ඇත.

තම පර්යේෂණයන් ජාත්‍යන්තර තත්වයට ළඟාකරගත් විද්‍යාඥයින්ට හිමිවිය යුතු පිළිගැනීම ලබාදීම සඳහා විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන (PASR) වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. 1999 වසරේ සිට ක්‍රියාත්මක මෙම වැඩසටහන මගින් විද්‍යාත්මක ප්‍රකාශනයන්හි ගීඝ්‍ර වැඩිවීමත් සමගින් ශ්‍රී ලංකාවේ පර්යේෂණයන්හි තත්වය වැඩිදියුණු කිරීම සඳහා සුවිසල් දායකත්වයක් ලබාදී ඇත. ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වැඩසටහනක් වන PASR වැඩසටහන ලෝක විද්‍යා දිනයට සමගාමීව නොවැම්බර් මාසයේදී පවත්වනු ලබන නමුත් වසංගත තත්වය හේතුවෙන් පසුගිය නොවැම්බර් මස නොපැවැත්වූ අතර මෙම වසරට කල්තබන ලදී. දහතුන්වන ජනාධිපති සම්මාන උළෙල වන මෙහිදී සම්මාන පිරිනැමීම සඳහා 2018 වසර තුළ

ප්‍රකාශන සිදුකළ විද්‍යාඥයින් 317 දෙනෙක් නම්කරනු ලැබීය. මහජන ඒකරාශිවීම් සම්බන්ධයෙන් කොවිඩ්-19 හා අදාල සීමාකිරීම් හේතුවෙන් 2021 අප්‍රේල් 6 වන දින ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ ශ්‍රවණාගාරයේදී පැවැත්වූ මෙම උළෙල සඳහා සම්මානලාභීන් 20 දෙනෙකුට පමණක් ආරාධනා කරනු ලැබීය.

2021 වසර තුළ නව වැඩසටහන් තුනක් හඳුන්වා දෙන ලදී. (1) විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයන් සඳහා ලබාදුන් කැපීපෙනෙන දායකත්වය, නායකත්වය හා සාර්ථකත්වය වෙනුවෙන් විශේෂ ඇගයීමකට ලක්විය යුතු පුද්ගලයින්ට උපහාර දැක්වීම සඳහා 'විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදනයන්හි විශිෂ්ඨත්වය සඳහා වන ජීවිත කාලීන සම්මාන' ලෙස නම්කරන ලද නව සම්මාන ප්‍රදානයක් ආරම්භ කරන ලදී. කමිටුව පත්කරන ලද නමුත් පශ්චාත්-වසංගත තත්වය සළකා එහි කාර්යයන් ඊලඟ වසරට කල්තබන ලදී. (2) ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතා වැඩසටහන - ඔස්ට්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය, මොනෑෂ් විශ්වවිද්‍යාලය හා ඔස්ට්‍රේලියානු භෘදවිද්‍යා ආයතනය හා නේපාල සංවර්ධන පර්යේෂණ ආයතනය සමග සහයෝගීතා ව්‍යාපෘති තුනක් සම්බන්ධයෙන් සාකච්ඡා සිදුකෙරෙමින් පවතී. (3) පර්යේෂණය සඳහා වැයවන සම්පත් උපරිම ඵලදායිතාවකින් කළමනාකරණය කිරීමේ වගකීම ජාතික පර්යේෂණ සභාවට පැවරී ඇත. සියලු පර්යේෂණ ආයතනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල සඳහා මාස 06ක කාලයක් සඳහා නිරීක්ෂකයින් ලෙස කවුන්සිල සාමාජිකයින් පත්කිරීමට හා ක්‍රියාත්මක කිරීමේ සැලසුම සකස් කිරීමට පෙර කවුන්සිලයට වාර්තා කිරීමට සාකච්ඡා හා යෝජනා කරනු ලැබීය.

සුභසාධක වැඩසටහන මගින් ජාතික පර්යේෂණ සභාව සමාජය සමග සම්බන්ධ කෙරේ. ජාතික පර්යේෂණ සභාව විසින් විවිධ විෂයයන් සම්බන්ධයෙන් මහජන වෙබිනාර් 10ක් සංවිධානය කරනු ලැබූ අතර ඉන් 7ක් ජාතික විද්‍යා සතියට සමගාමීව පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා විද්‍යානිවර්ධන සංගමයේ සහයෝගීතාවය ඇතිව පුවත්පත් දැන්වීම් 12ක් පළකරනු ලැබිය. ඉලක්කගත ප්‍රදානයන්ගේ ප්‍රතිඵලයක් ලෙස ලෝක ජල දිනයේදී (මාර්තු 22) ජල ගීතය හඳුන්වාදීම අපගේ කැපී පෙනෙන සුභසාධක ඉසව්වක්වේ. කොවිඩ්-19 නැවත ඇතිවීම හේතුවෙන් භෞතික ඉසව්/ක්‍රියාකාරකම් දැඩිව සීමාකර ඇති අතර සභාවේ සාර්ථක ව්‍යාපෘති පිලිබඳ වාර්තාමය විඩියෝ පටයක් නිමකිරීම හා එය යූටියුබ්හි පළ කිරීම 2021 වසරේ ලද තවත් ජයග්‍රහණයකි. සභාපති වන හේමන්ත දොඩම්පහල මහතා විසින් ජනමාධ්‍ය ඔස්සේ කොවිඩ් එන්නත් පිළිබඳව මහජනයා අතර දැනුවත්භාවය ඇතිකිරීම හා කොවිඩ්-19 පාලනය කිරීම සඳහා අදාල බලධාරීන්ට නිසි නිර්දේශ ලබාදීම මගින් අවස්ථා කීපයකදීම සිය දායකත්වය ලබාදෙන ලදී.

පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම්පත් හතරක් ඉදිරිපත්කර ඇති අතර මීට පෙර ඉදිරිපත් කරන ලද අයදුම්පත් දෙකක් සඳහා පේටන්ට් බලපත්‍ර ලබාදී ඇත. මෙම වසරේදී එක් PPP ප්‍රදානයක් මගින් රාජ්‍ය භාගය ලැබී ඇත. ඉලක්ක මත පදනම් කෘෂිකාර්මික හා කිරි ගවයන් සම්බන්ධ ව්‍යාපාති දෙකෙහි බලපෑම් ඇගයීමේ අධ්‍යයන සිදුකරනු ලැබීය. මුහුදු කැකිරි පිළිබඳ ඉතා සාර්ථක වූ තවත් අධ්‍යයනයක් නිමකර ඇති අතර පර්යේෂණයන්හි ප්‍රතිඵල ප්‍රමාණ කිරීම සඳහා බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය ඉදිරි වසර වලදී තවදුරටත් වැඩිදියුණු කරනු ඇත.

2021 අප්‍රේල් මාසයේදී රුසියානු ෆෙඩරේෂනය විසින් අරමුදල් සපයන ලද 'ශ්‍රී ලංකාවේ ක්‍රිසොලයිට් ඇස්බැස්ටස් වල සුරක්ෂිත භාවිතය' සම්බන්ධයෙන් පිරිනමන ලද ප්‍රදානයක් හතරෙහි ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා රුසියානු හවුල්කරු සමග ක්‍රියාකාරී කමිටු රැස්වීමක් පවත්වනු ලැබීය. ජාතික පර්යේෂණ සභාව රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් ඇස්බැස්ටස් ප්‍රදානයන් සම්බන්ධීකරණය කරනු ලැබීය. මෙම ප්‍රදානයන් හතරෙන් ප්‍රදානයන් තුනක පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ඇති අතර ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසුවේ. කෙසේවුවද අතඇති බිල් කීපයක් පියවා ගත යුතුව ඇත.

ඉහත වැඩසටහන් වලට අමතරව 2021 වසරතුළ මූල්‍යාධර ලබාදුන් විශේෂ ව්‍යාපෘති දෙකකි. ඉන් පළමු ව්‍යාපෘතිය වන 'පිළිකා කලින් හඳුනා ගැනීම සඳහා ජාතික නිර්දේශක රසායනාගාරය' වෙනුවෙන් අරමුදල් ලබාගැනීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී ඇති අතර පළමු අදියර සඳහා ජාතික පර්යේෂණ සභාව මගින් මූල්‍ය සහය ලබාදී තිබේ. මෙය කොළඹ විශ්වවිද්‍යාලය සමග සහයෝගීතා වැඩසටහනක් ලෙස ක්‍රියාත්මකවේ. දෙවන ව්‍යාපෘතිය වූයේ 'බහුවාර්ෂික ප්‍රතිවක්‍රීකරණ ගැටලු විසඳීම සඳහා ජෛව භායනයට ලක්වන ඝන අපද්‍රව්‍ය කාර්යක්ෂම හා ඵලදායී ලෙස දිරාපත් කරන ක්ෂුද්‍රජීවී ගහණයක් හෝ ගහණ වෙන්කර

ගැනීම'යි. මෙම ව්‍යාපෘතිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවය ඇතිව සිදුකෙරේ. මෙම ව්‍යාපෘති දෙකෙහි ජාතික වැදගත්කම සළකා කවුන්සිලය විසින් ඒ සඳහා අනුමැතිය ලබාදී ඇත.

ජාතික පර්යේෂණ සභාවේ සියලු ප්‍රයත්නයන් උසස් මට්ටමකට ගෙන ඒමට අප්‍රතිහත සහයක් ලබාදුන් කවුන්සිල සාමාජිකයින්ට මෙන්ම මෙම වසරේදී ද අපට සහයෝගය දැක්වීම වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ සහ රේඛීය අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ට මාගේ කෘතඥතාවය පළ කරමි.

ජාතික පර්යේෂණ සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 21ක් වන අතර රටේ පැවති කොවිඩ්-19 තත්වය හේතුවෙන් කාර්ය මණ්ඩලයට පුහුණු වැඩසටහන් සඳහා මෙන්ම වාර්ෂික හුරුපුරුදුවීමේ චාරිකාවටද සහභාගි වීමට නොහැකි විය. මෙම දුෂ්කර වසරේදී ආයතනයේ සියලු කාර්යයන් සිදුකරගෙන යාමට සහ ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාකාරකම් නිමකිරීම සඳහා අඛණ්ඩව තම සහය ලබාදුන් කාර්ය මණ්ඩලයට මගේ ස්තූතිය පිරිනමමි.

2021 වසර සඳහා ජාතික පර්යේෂණ සභාවට ප්‍රාග්ධන වියදම් ලෙස රු.මිලි.187.5ක් හා පුනරාවර්තන වියදම් ලෙස රු.මිලි.29.20ක් වෙන්කරනු ලැබූ අතර පිළිවෙලින් රු.මිලි.160.04ක් හා රු.මිලි.26.89ක් ලැබුණි. 2020 මූල්‍ය වසර සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව මගින් ආයතනය සඳහා අංක 2 මතයක් ලෙස ශ්‍රේණිගත කරන ලද තත්වාගණනය කරන ලද මතයක් ලබාදී ඇත. ජාතික පර්යේෂණ සභාව සිය පාර්ශවකරුවන්ට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ආයතනයේ අභ්‍යන්තර ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීමේ කාර්යයන් ආරම්භකර ඇති අතර ඉදිරි වසරේදී ව්‍යාපාර සම්පත් සැලසුම් (ERP) පද්ධතිය ස්ථාපනය කිරීමට අපේක්ෂිතය.

වසර තුල ආයතනය ලභාකරගත් ප්‍රතිඵල දැක්වෙන 2021 වසරේ වාර්ෂික වාර්තාව අභිමානයෙන් ඉදිරිපත් කරන අතර ඉදිරි වසරේදීද අපගේ පර්යේෂණ ප්‍රජාව වෙනුවෙන් සේවය කිරීමට අපේක්ෂා කරන්නෙමු.

මනීෂා සී රාජපක්ෂ
ප්‍රධාන විධායක නිලධාරි

පසුගිය වර්ෂ 3 සඳහා අදාළ මූල්‍ය සුවිශේෂීතාවයන්

වැඩසටහන් (ක්‍රමෝපායන්)		භෞතික ප්‍රගතිය			මූල්‍ය ප්‍රගතිය රු.මිලි.		
	දර්ශකය	2019	2020	2021	2019	2020	2021
ජාතික පර්යේෂණ සභාවේ පොදු පරිපාලනය					23.65	26.50	26.89
පහත වැඩසටහන් සඳහා සංවර්ධන සහය					88.23	75.20	160.04
ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ වැඩසටහන (2014 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් කිසිවක් ආරම්භ නොකෙරිණ	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී	වැඩසටහන් කිසිවක් ආරම්භ නොකෙරිණ			
පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන (2013 වසරේදී ආරම්භ කරන ලදී)	වැඩසටහන් සංඛ්‍යාව	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී	වැඩසටහන් කිසිවක් ආරම්භ නොකෙරිණ	එක් වැඩසටහනක් ආරම්භ කරන ලදී			
අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන වැඩසටහන (1999 වර්ෂයේදී ආරම්භ කරන ලදී)	පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන සංඛ්‍යාව	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 28ක් පිරිනමනු ලැබීය.	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 19ක් පිරිනමනු ලැබීය.	අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන 22ක් පිරිනමනු ලැබීය.	-	-	-

	පිරිනමන ලද ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 20ක් පිරිනමනු ලැබීය	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 22ක් පිරිනමනු ලැබීය	ආචාර්ය උපාධි/ දර්ශනපති උපාධි අධිශිෂ්‍යත්ව 18ක් පිරිනමනු ලැබීය.			
විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන (PASP) වැඩසටහන (2001 වර්ෂයේදී ආරම්භ කෙරිණි)	පවත්වනු ලැබූ සම්මාන උළෙල හා සම්මානලාභී විද්‍යාඥයින් සංඛ්‍යාව	2017 වර්ෂයේ ප්‍රකාශන සඳහා PASP පවත්වන ලද අතර විද්‍යාඥයින් 100 දෙනෙකු සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.	COVID වසංගතය හේතුවෙන් PASP සම්මාන උළෙල නොපැවැත්වූ නමුත් සහරාවල පලවූ ප්‍රමුඛ ප්‍රකාශන 100ක් හා සම්මානලාභීන් හඳුනාගනු ලැබීය	2018 වසරේ ප්‍රකාශන සඳහා වන PASP සම්මාන උළෙල පවත්වනු ලැබූ අතර සම්මානලාභීන් 20%කගේ සහභාගිත්වය ඇතිව ප්‍රකාශන 100ක් සඳහා සම්මාන පිරිනමන ලදී.	-	-	-
වෙනත් වැඩසටහන්: සමාජ සුභසාධන/ මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්	සම්පූර්ණ කරනු ලැබූ ක්‍රියාකාරකම්	සමාජ සුභසාධන වැඩසටහන් 4ක් පවත්වන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 21ක් ප්‍රකාශයට පත්කරන ලදී	එක් සමාජ සුභසාධන ප්‍රදානයක් ඇතුළුව සමාජ සුභසාධන වැඩසටහන් 3ක් පවත්වනු ලැබීය ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 12ක් ප්‍රකාශයට පත්කරන ලදී	COVID-19 හා අදාල සීමාකිරීම් හේතුවෙන් භෞතික වැඩසටහන් වෙනුවට මහජන වෙබිනාර් වැඩසටහන් 10ක් පවත්වන ලදී. එක් සමාජ සුභසාධන ප්‍රදානයක් සඳහා මූල්‍යාධාර ලබාදෙන ලදී. ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණයන් පිළිබඳ පුවත්පත් ලිපි 12ක් ප්‍රකාශයට පත්කරන ලදී.	-	-	-
එකතුව					111.88	101.70	186.93

ඉලක්ක මත පදනම් බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

සංකීර්ණ ගැටලු පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හෝ විසඳුම් ලබාදීම සඳහා හුදකලාවූ පර්යේෂණ මගින් හැකියාව ලැබෙනුයේ අල්ප වශයෙනි. බහුවිෂයානුබද්ධ ප්‍රවේශයක් මගින් සාමාන්‍ය සීමාවන්ට පරිබාහිර ගැටලු නැවත අර්ථ දැක්වීම සහ දුෂ්කර ගැටලු අලුතින් අවබෝධ කරගැනීම හරහා විසඳුම් වෙත එළැඹීමට හැකිවන පරිදි බහුවිධ විෂයයන් වෙතින් සුදුසු පරිදි දායකත්වයන් ලබා ගැනේ.

මෙම වැඩසටහන 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය සමගින් පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් ඉතා කඩිනමින් අවශ්‍ය වන, අතිශය වැදගත් අංශ දහයක් යෝජනාවී ඇත.

රජයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතන සහ විශ්වවිද්‍යාලයන්හි පර්යේෂක කණ්ඩායම් වෙතින් පූර්ව යෝජනා කැඳවන ලදී. රටේ ආර්ථික සංවර්ධනය, සමාජ සුභසාධනය සහ පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින්, ජාතික වශයෙන් අදාළත්වයක් සහිත ගැටලු විසඳාලීම මෙම ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘති හරහා සිදුකිරීමට අපේක්ෂිතය.

ප්‍රතිපත්ති/ ක්‍රමෝපාය හෝ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය දැනුමෙහි පවතින මූලික හිඳස පියවීම, ජාතියට බාධක හෝ අභියෝග එල්ල කෙරෙන ගැටලු විසඳාලීම මෙම ව්‍යාපතිවල අරමුණු වේ. ප්‍රතිපත්ති, ක්‍රමෝපායයන්, නිෂ්පාදන/ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණයන්හි ප්‍රතිඵල යොදාගැනීමේ මාර්ගය සහ ඒවා භාවිතයට ගැනීම පැහැදිළිව හඳුනාගත යුතුය.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයේ ජාතික පර්යේෂණ හා සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (වැදගත් ක්ෂේත්‍ර දහයක්) සමඟ අනුගත වෙමින් ප්‍රමුඛ ක්ෂේත්‍රයන් කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ලැබිණි. එක් ප්‍රදානයක වටිනාකම මිලියන 50ක් වන අතර වසර 5ක කාලසීමාවක් සඳහා මෙම ප්‍රදානයන් සිදුකරයි. ජාතික පර්යේෂණ සභාව විසින් සැලකිය යුතු මහජන මුදල් ප්‍රමාණයක් මෙම ව්‍යාපෘතීන් සඳහා ආයෝජනය කරන බැවින්, මේ සඳහා මූල්‍යනය ඉතා ඉහළ තරඟකාරී පදනමකින් සිදුකෙරෙනු ඇත. වසර 5ක කාලයකට පසු ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵලයක් ලබාදීමේ හැකියාවක් ඇති බවට ජාතික පර්යේෂණ සභාව විසින් සලකනු ලබන, ව්‍යාපෘතින්හි කණ්ඩායමක් වශයෙන් එක්ව ක්‍රියා කළ හැකි කුසලතා සහිත, ඉතා සුදුසු පර්යේෂකයින් පමණක් තෝරාගැනීමට ජාතික පර්යේෂණ සභාව විසින් කටයුතු කෙරෙනු ඇත. පර්යේෂණයන්හි විවිධ අංශ පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයින් විසින් සමගාමීව කටයුතු කිරීමේ වාසිය මෙම බහුවිෂයයන් මත කේන්ද්‍රගත වූ ව්‍යාපෘති හරහා උදාවනු ඇත.

ප්‍රදානයෙහි මෙහෙයුම් සැලසුම් අන්වේෂක මත පදනම් වූ ප්‍රදානයන්ට සමානවේ. කෙසේ වුවද, ප්‍රධාන අන්වේෂකට අමතරව නියෝජ්‍ය නායකයෙකුද පත්කෙරෙනු ඇත. මෙම ප්‍රදාන ලබාදීමෙන් අනතුරුව, ප්‍රකාශිත ප්‍රතිඵලයන් ළඟාකරගන්නා බවට සහතික කරනු පිණිස මෙම ව්‍යාපෘතීන් විධිමත්ව හා දැඩිව නිරීක්ෂණය, සුපරීක්ෂණය සහ ඇගයීමට ලක්කරනු ඇත.

අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන

ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය ආයතන සහ විශ්වවිද්‍යාල මගින් සිදු කෙරෙන අතර ඒ සඳහා රාජ්‍ය ආයතනික අරමුදල්, තරඟකාරී ප්‍රදාන සහ පර්යේෂණ ගිවිසුම් වැනි විවිධ ප්‍රභවයන් වෙතින් අරමුදල් ලබාදේ. විද්‍යාඥයින්ට අවම පරිපාලන අවහිරතා යටතේ සිය පර්යේෂණ කාර්යයන්හි නියැලීමට ඉඩ ප්‍රස්ථා ලබා දීමේ අරමුණින් ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන ආරම්භ කරනු ලැබීය.

ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන මගින් පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය ආයතන වලට තරඟකාරී ප්‍රදානයන් පිරිනමනු ලැබේ. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම වසර ගණනාවක් පුරා ක්‍රමවත් කර ඇති අතර දැන් එය වැඩි හෝ අඩු වශයෙන් පරිසමාප්ත වේ. ප්‍රදානයන් පිළිබඳව වාර්ෂිකව දැන්වීම පලකර විද්‍යාත්මක දැක්ම, ජාතික සංවර්ධනයට ඇති අදාලත්වය මත පදනම්ව ඇගයීම් කරනු ලබන අතර ප්‍රතිඵල ජාත්‍යන්තර සහරාවල පලකරනු ලැබේ.

අයදුම්පත් ඉතා දැඩි ඇගයුම් ක්‍රියාවලියකට ලක්කරනු ලැබේ. තෝරාගත් යෝජනා සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සම්පූර්ණයෙන්ම වගකිවයුතු ප්‍රධාන අන්වේශක වෙත සෘජුවම භාණ්ඩාගාරයෙන් ලබාදෙන අරමුදල් සඳහා වන සුදුසු මුදල් වෙන්කිරීම් කවුන්සිලය මගින් තීරණය කරනු ඇත. උපකරණ, පර්යේෂණ සඳහා භාවිතා කරන ද්‍රව්‍ය ආදිය සඳහා අරමුදල් සලකා බැලේ. එක් එක් ව්‍යාපෘතිය සඳහා බැංකු ගිණුමක් විවෘත කරන අතර ජාතික පර්යේෂණ සභාව විසින් සියලු ගනුදෙනු අධීක්ෂණය කෙරේ. මෙමගින් විද්‍යාඥයින්ට අවම අවහිරතා යටතේ අරමුදල් භාවිතා කිරීම සඳහා සැලකිය යුතු නම්‍යශීලිත්වයක් ලබාදේ. කවුන්සිලය හා ජාතික පර්යේෂණ සභාවේ ලේකම් කාර්යාලය මගින් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම හා ඇගයීම සිදුකරනු ලැබේ.

වත්මන් ප්‍රදානයන් විවිධ ස්වභාවයෙන් යුතු බව මෙහිදී සඳහන් කල යුතුවේ. ශුද්ධ විද්‍යාව පිළිබඳව හා ආහාර, ජලය, පරිසරය හා බල ශක්තිය පිළිබඳ පර්යේෂණ සඳහා අරමුදල් සැපයීමට අමතරව NRC මගින් පසුව ජාතික ආවේක්ෂණය, වාරිමාර්ග පද්ධති, වන ජීවී හා පාරිසරික සංචාරක කර්මාන්තය, කථන පරිවර්තනය, ඉදිකිරීම් හා වාස්තු විද්‍යාව, දුම්රිය මාර්ග සංඥා, ක්‍රීඩා හා වෙනත් ක්ෂේත්‍ර ගණනාවක් සඳහා අරමුදල් ලබාදෙනු ලැබිය.

සියලු වැඩසටහන් සඳහා සරල නමුත් විස්තීර්ණ එක් අයදුම්පත් කට්ටලයක් ඉදිරිපත් කෙරේ. වසර ගණනාවක සිට NRC වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව වැඩිවීම ධනාත්මක ලක්ෂණයකි. මෙම වැඩසටහන සඳහා ඇති අභියෝගය වන්නේ NRC විසින් මෙතෙක් ලභාකරගෙන ඇති ප්‍රගතිය ආරක්ෂා කරගැනීමවේ.

මෙම ප්‍රදානයන්ගෙන් ඉහලම නිමවුම් ලබාගැනීම සඳහා එහි ප්‍රගතිය අධීක්ෂණය හා ඇගයීම සඳහා කවුන්සිලය විසින් නව නීති රීති හා මාර්ගෝපදේශ ගණනාවක් හඳුන්වා දී ඇත.

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන

ජාත්‍යන්තර මට්ටමට ළඟාවූ විද්‍යාඥයින්ට ගෞරව දැක්වීම, ජාතික විද්‍යාත්මක පර්යේෂණයන් ඉහළ නැංවීම යන අභිමතාර්ථයන් පෙරදැරිව විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන ප්‍රදාන වැඩසටහන 2001 වසරේදී ආරම්භ කරනු ලැබිය. 1991 වසරේ සිට මේ දක්වා විද්‍යාත්මක ප්‍රකාශන එළිදැක්වීම පිළිබඳ ජාතික සංඛ්‍යාලේඛන මගින් අනාවරණ වන්නේ ගුණාත්මක විද්‍යාත්මක ප්‍රකාශනවල සංඛ්‍යාවේ ඉහළ නැඟීමේ ප්‍රවනතාවයෙහි මූලාරම්භය විය හැකිය.

2019 වසරේ සිට විද්‍යාඥයෙකු සඳහා තනි පුද්ගලයෙකු ලෙස නොව ප්‍රකාශන (පර්යේෂණය) සඳහා සම්මාන පිරිනමනු ලැබේ. ප්‍රකාශන වලට අමතරව විද්‍යාවට අදාල ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර සඳහා ද සම්මාන පිරිනමනු ඇත. මූලිකවම ශ්‍රී ලංකාව තුල සංකල්පිත හා සිදුකරනු ලබන පර්යේෂණ දිරිමත් කිරීම ජාතික පර්යේෂණ සභාවේ අපේක්ෂාව වන බැවින් ජාත්‍යන්තර සහයෝගිතාවය ඇතිව පර්යේෂණ හා ප්‍රකාශන සිදුකරන අවස්ථාවලදී ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් විසින් දායකත්වය දක්වනු ලබන මට්ටම පිළිබඳව සලකා බලනු ඇත.

කිසියම් විද්‍යාත්මක පර්යේෂණයක් කෙරෙහි පක්ෂග්‍රාහිවීම වැලැක්වීම සඳහා ප්‍රකාශන පෙලගැස්වීම සඳහා යොදාගනු ලැබූ ලකුණුදීමේ ක්‍රමවේදය ප්‍රමිතිකරණය කර ඇත (අදාල කරගනු ලබන නිර්ණායක පදනම්ව) ; එය විනිවිදභාවයෙන් යුතුව සිදුකරනු ලැබේ - උදා. මහජනයාට ඒ සඳහා නිදහසේ ප්‍රවේශවීමට හැකිවේ. Scopus විසින්

පවත්වාගෙන යනු ලබන හා Elsevier BVට අයත් සහරා නම් කිරීමේ දත්ත ගබඩාවක් වන SCImago Journal Rank (SJR) මෙම ක්‍රමවේදය අනුගමනය කරනු ලැබේ. 2018 වසරේදී ජාත්‍යන්තර සහරාවන්හි පළවූ ප්‍රකාශන 100ක් මෙම වසර තුළ සම්මාන පිරිනැමීම සඳහා හඳුනාගනු ලැබිය. මෙවර සම්මාන උළෙල කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා නියමකරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට යටත්ව සම්මානලාභීන්ගෙන් 20%ක සහභාගිත්වය ඇතිව 2021 අප්‍රේල් 06 වන දින පැවැත්විණ.

<u>රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන</u>

ශ්‍රී ලංකාවේ අපේක්ෂිත ආර්ථික සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමේදී අත්‍යාවශ්‍ය සාධකයක් වන ගෝලීය වෙළඳපළ තුළ තරඟකාරීත්වයන් ඇති අගය එකතු කළ නිෂ්පාදන හා සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් මග සලසනු ඇත. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිදු කෙරෙන පර්යේෂණ, ආර්ථිකයේ ප්‍රගමනයට ඉවහල් වන ප්‍රධාන කර්මාන්තයන්හි අවශ්‍යතාවන් සපුරාලන, ඉල්ලුමට සරිලන පර්යේෂණ විය යුතුය.

රාජ්‍ය පර්යේෂණ හා සංවර්ධන පෞද්ගලික කර්මාන්ත-සහයෝගීතා (PPP) වැඩසටහන මඟින්, රටෙහි ආර්ථික සංවර්ධනය කෙරෙහි දායකත්වයක් ලැබෙන පරිදි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම් සහ කර්මාන්තයන්හී ප්‍රධාන හවුල්කරුවන් සම්බන්ධ කිරීම මගින් දේශීය හැකියාවන් ශක්තිමත් කිරීම සිදුකෙරේ. විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා සංවර්ධනයන් ප්‍රවර්ධනය තුලින් අපනයන ආදායම් ඉහළ නැංවීම, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය සහ ආනයන ආදේශක ප්‍රවර්ධනය හරහා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීමේ හැකියාව පවතී. නව්‍ය හෝ වඩා හොඳ තත්ත්වයේ නිෂ්පාදන, ක්‍රියාවලි, සේවාවන්, අගය එකතුකිරීම්, වාණිජමය හැකියාවන් සහිත තාක්ෂණික ගැටලු විසඳීම යනාදිය කෙරෙහි යොමුවූ සියලු නවෝත්පාදක පර්යේෂණයන් මෙම වැඩසටහන සඳහා සලකා බැලෙනු ඇත. විවිධ අංශයන් අතර ඇති කරගනු ලබන සහයෝගීතාවයන් තුලින් කාර්මික පර්යේෂණ සහ සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා විසඳුම් සොයාගනු පිණිස අපගේ පර්යේෂණ විශේෂඥතාවය, වියදම්, සේවාවන් සහ පහසුකම් වඩාත් ඵලදායී ලෙස හුවමාරුකර ගැනීමේ හැකියාව ලැබේ. මෙම සහයෝගීතාවයන් හරහා රාජ්‍ය අංශයේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්හි කාර්යක්ෂමතාවය වැඩිදියුණු කෙරෙනු ඇති අතර ඒ සඳහා ගතවන කාලයද අඩු වනු ඇත. රාජ්‍ය අංශයේ සහයෝගීතාවය සහිත ව්‍යාපාරයක් මඟින් සිදුකරණ පර්යේෂණ හා සංවර්ධන වියදම්වලට අදාලව බදු සහන ලබාදීම හරහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිගැන්වේ. ජාතික අවශ්‍යතාවයන් සඳහා පර්යේෂණ මත පදනම් වූ විසඳුම් ලබාදීම සඳහා රජය - දේශීය ආයතන - අමාත්‍යාංශ - විශ්වවිද්‍යාල - පර්යේෂණ හා සංවර්ධන ආයතන - ව්‍යාපාරික අංශය - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය යන අංශයන් අතර සම්බන්ධීකරණය සඳහා ජාතික පර්යේෂණ සභාව මැදිහත්වේ.

<u>ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන වැඩසටහන</u>

අප අනුමාන කරනවාට වඩා වැඩි වේගයකින් පර්යේෂණ පිළිබඳ අවශ්‍යතාවයන් ඇතිවේ. එය ඉතා ඉක්මනින් පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් අපේක්ෂාකරන ගෝලීය වසංගතයක් හෝ ශාක වලට පැතිරී යන රෝගයක් හෝ රජය විසින් ප්‍රකාශයට පත් කරන ලද හදිසි තත්වයක් විය හැකිය. ජාතික පර්යේෂණ සභාවේ සාමාන්‍ය පර්යේෂණ ප්‍රදාන වැඩසටහන් එක් වසරකට වැඩි කාල පරාසයක් සඳහා සැකසී ඇත. එබැවින්, ඉහත සඳහන් කරන ලද පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් සඳහා සහය ලබාදීම සඳහා ජාතික පර්යේෂණ සභාවේ කෙටි කාලීන පර්යේෂණ වැඩසටහනෙහි හිදසක් පැවතිණ. මෙම හිදස පියවීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් කාල සීමාව මාස 06ක් වන ‘ඉක්මන් ප්‍රතිචාර ප්‍රදාන’ වැඩසටහන ලෙස හඳුන්වන කෙටි කාලීන පර්යේෂණ වැඩසටහනක්

හඳුන්වා දෙනු ලැබූ අතර ප්‍රදානය කරනු ලබන උපරිම මුදල රු. 500,000/-ක් වේ. මෙම ඉක්මන් ප්‍රතිචාර ප්‍රදානයන් යටතේ කොවිඩ්-19 ගෝලීය වසංගතය මැඩලීම අරමුණු කරගත් පර්යේෂණ හා සංවර්ධන මැදිහත්වීම් සඳහා දෙවන ප්‍රදානයන් කට්ටලය පිරිනමන ලදී.

විශේෂ ප්‍රදාන: රජයට අයත් පර්යේෂණ සඳහා මූල්‍යාධාර සපයන ආයතනයක් වශයෙන් ජාතික පර්යේෂණ සභාවේ සාමාන්‍ය අයවැයෙන් කැඳවීම් ඉක්මවා විවිධ ව්‍යාපෘති යෝජනා සඳහා මූල්‍යාධාර ලබාදීම සළකා බලන ලෙස රජයේ ආයතන වෙතින් වසරකට ඉල්ලීම් කීපයක් ලැබේ. මින් සමහරක් ජාතික වශයෙන් ඉමහත් වැදගත්කමකින් යුක්ත වන අතර සමහර එසේ නොවේ. රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක ආයතනයක් වශයෙන් ජාතික පර්යේෂණ සභාව කවුන්සිලයේ පරීක්ෂා කිරීමට යටත්ව එකී යෝජනා සම්බන්ධයෙන් සළකා බැලීමට සහ ජාතික වැදගත්කම පදනම්ව මූල්‍යනය කිරීම මගින් සුදුසු යෝජනා සඳහා සහය දැක්වීමට තීරණය කරන ලදී. 2021 වසරේදී විශේෂ ප්‍රදාන ආරම්භ කිරීම මගින් මෙම තීරණය ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා වසර තුල ක්‍රමවත් අයදුම්පත් කැඳවීමක් සිදු නොවේ. මෙම වැඩසටහන යටතේ 2021 වසරේදී පර්යේෂණ ව්‍යාපෘති 2ක් සඳහා මූල්‍යාධාර සපයන ලදී.

<u>වෙනත් වැඩසටහන්</u>

සුහසාධක වැඩසටහන්: රේඛීය අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පර්යේෂණ ප්‍රදානයන්හි ප්‍රතිඵල පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. තවද අධ්‍යාපනික ප්‍රදර්ශන කුටි සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ප්‍රදානලාභීන් සමගින් ජාතික පර්යේෂණ සභාව ප්‍රදර්ශන ගණනාවක් සඳහා සහභාගිවේ.

මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන: ලොව පිළිගත් සඟරාවන්හි සිය පර්යේෂණයන් පිළිබඳ පළකිරීම සඳහා ප්‍රදානලාභීන් දිරිමත් කෙරේ. ඒ අතරම විද්‍යාඥයින් විසින් සිදුකරන ලද පර්යේෂණ පිළිබඳව මහජනයා දැනුවත් කිරීම පිණිස ඔවුන්ගේ සොයාගැනීම පිළිබඳව පුවත්පත්වල පළකිරීම සඳහා ජාතික විද්‍යා සභාව විසින් පහසුකම් සැලසේ. කාලීන වැදගත්කමක් ඇති විද්‍යාත්මක සොයාගැනීම් ප්‍රචාරය කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡා පවා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

සුහසාධක ප්‍රදානයන්: ජාතික පර්යේෂණ සභාවේ සේවාවන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2020 වසරේ සිට නව පියවරක් ලෙස සුහසාධක ප්‍රදානයන් ආරම්භ කරනු ලැබීය. මෙම ප්‍රදානයන් මගින් රාජ්‍ය ආයතන වලට ආයතනය තුලම ක්ෂේත්‍ර පර්යේෂණයක් මගින් නිර්මාණය කරනු ලබන දැනුම හෝ දත්ත ගබඩා යොදාගනිමින් මහජනයාට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ වාසිය සැලසේ.

2021 වසරේ විශේෂ අවස්ථා

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදාන

2021 ඔක්තෝබර් මාසයේදී NRC විසින් 2022 වසර සඳහා නව ප්‍රදානයන් සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම් පළකරනු ලැබීය.

	2014	2016	2018	2020	2022
ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	60	50	25	49	29
විස්තරාත්මක යෝජනා සඳහා කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	21	13	06	08	අදාල නොවේ
ලැබූ විස්තරාත්මක යෝජනා සංඛ්‍යාව	21	11	05	07	අදාල නොවේ
ඉදිරිපත් කිරීම් සඳහා කෙටි ලේඛනගත කරනු ලැබූ අයැදුම්පත් සංඛ්‍යාව	11	06	03	05	අදාල නොවේ
පිරිනමන ලද ප්‍රදානයන් සංඛ්‍යාව	05	03	01	01	අදාල නොවේ

2014, 2016, 2018 හා 2020 වර්ෂයන්හිදී පිරිනමන ලද ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ ප්‍රදානයන් නවයක් 2020 වසර තුළදී ක්‍රියාත්මකව පැවති අතර, ජාතික පර්යේෂණ සභාවේ ව්‍යාපෘති අධීක්ෂණ උපදේශක, මහාචාර්ය ආර්.බී. මාපා මහතා විසින් ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී. ශ්‍රී ලංකාවේ ව්‍යාප්තව පවතින රෝග නිධානය හඳුනා නොගත් නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අංගසම්පූර්ණ අධ්‍යයනයක් පිළිබඳ ව්‍යාපෘතිය නිමකරන ලද අතර මේ වනවිට ඇගයුම් කරමින් පවතී.

ක්‍රියාක්මකව පවතින ඉලක්කමත පදනම් ප්‍රදාන:

ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ඨ කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම

(ප්‍ර:අ: මහාචාර්ය අයි.බී. ගවරම්මාන සහ නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය ඒ. දංගොල්ල, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

නවීන තාක්ෂණික සර්පාගාරයක් වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක වැදගත්කමකින් යුත් සර්පයින්ගේ විෂ එක්රැස් කිරීම හා විශ්ලේෂණය, ශ්‍රී ලංකාවේදී දෂ්ටනය සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාවේදී ප්‍රතිවිෂ නිෂ්පාදනය සඳහා අශ්වයින් යොදා ගැනෙන පර්යේෂණ සංකීර්ණයක් ස්ථාපනය කිරීම මෙහි අරමුණ වේ.



ප්‍රමාණවත් ඵලදාවක් පවත්වා ගනිමින් සහ පාංශු සාරවත්භාවය වර්ධනය කරගනිමින් අකාබනික පොහොර භාවිතය අවම කරනු පිණිස පරිසර හිතකාමී වගා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම.

(ප්‍ර:අ: ආචාර්ය සමන් ධර්මකීර්ති, ආචාර්ය ඩබ්.එස්. දන්දෙනිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය)

මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ, ශ්‍රී ලංකාවේ වී වගාවේදී රසායනික පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සහ එමගින් රටෙහි රසායනික පොහොර භාවිතය අවම කිරීම සඳහා පරිසර හිතකාමී සහ ගොවිජන හිතකාමී තාක්ෂණයන් වැඩිදියුණු කිරීමය. එමෙන්ම, ශාකවල මනා පැවැත්ම වැඩිදියුණු කිරීම හා වී වගා බිමෙහි වෙනත් කෘෂි රසායන භාවිතය අවම කිරීම සඳහා මෙම තාක්ෂණයන් ඵලදායී ලෙස යොදාගැනීම පිළිබඳව සොයාබැලීමද මෙමගින් අපේක්ෂිතය. පෞද්ගලික අංශයේ ආයෝජකයින් සමඟ ඇති කරගනු ලබන සහයෝගීතාවයන් හරහා මෙම වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් ගොවීන් වෙත හඳුන්වා දෙනු ඇත.



භූගත ජලයේ දියවී ඇති සමස්ත ඝන ද්‍රව්‍ය සහ ෆ්ලුවොරයිඩ් සඳහා ප්‍රතිකර්ම යෙදීමේ පහසුකමක ආකෘතියක් වැඩිදියුණු කිරීම - වියළි කලාපීය පානීය ජල ගැටලුව සඳහා තිරසර විසඳුමක්
(ප්‍ර:අ: මහාචාර්ය රොහාන් වීරසූරිය, ආචාර්ය එස්.කේ. වේරගොඩ, ජාතික මූලික අධ්‍යයන ආයතනය)


වියළි කලාපයේ ජලයේ තත්ත්වය සම්බන්ධයෙන් පැන නැඟ ඇති ගැටලු සඳහා තිරසර විසඳුමක් ලබාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මේ යටතේ විද්‍යුත් ආතංචනය (electro-coagulation) සහ නිනිති පටල පෙරීමේ ක්‍රමය (nano membrane filtration) යොදා ගනිමින් ජලයේ අඩංගු අතිරික්ත ෆ්ලුවොරයිඩ සහ සමස්ත දියවූ ඝන ද්‍රව්‍ය නියාමනය කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය සහිත ජංගම ප්‍රතිකර්ම පහසුකමක් තැනීමට යෝජිතය. මෙම යෝජිත ජල ප්‍රතිකර්ම ආකෘතිය ආරම්භයේදී කුඩා ගම්මානයක් සඳහා සීමාවනු ඇත. ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලයේ පාලනය යටතේ (NWSDB), ජල ප්‍රභවය ආසන්නයේ පදිංචි ග්‍රාමීය පාරිභෝගිකයන්ගේ එදිනෙදා පරිභෝජනය සඳහා මෙම පිරිසිදු ජලය බෙදාහැරීම සිදුකෙරෙනු ඇත. ජල හිඟයෙන් පීඩා විඳින ප්‍රජාවන්ගේ ගැටලු සඳහා කඩිනම් විසඳුමක් ලබාදීමේ අත්‍යාවශ්‍ය පළමු පියවරක් මේ හරහා තැබෙනු ඇත.



ජල පවිත්‍රකරණය සඳහා උසස් ද්‍රව්‍ය මත පදනම්වූ පෙරහන් වැඩිදියුණු කිරීම

(ප්‍ර:අ: මහාචාර්ය රෝහිණී ද සිල්වා, මහාචාර්ය නලින් ද සිල්වා, කොළඹ විශ්වවිද්‍යාලය)

ජල පවිත්‍රකරණ ක්‍රියාවලිය සඳහා ග්‍රාමීය ප්‍රජාව වෙත විදුලිය අවශ්‍ය නොවන, අඩු වියදම් සහ ඵලදායී ජල පෙරහනක්, සපයාදීම මෙහි මූලික අරමුණවේ. මෙම තිරසර ජල පවිත්‍රකරණ පද්ධතිය දේශීය නිෂ්පාදකයෙකු විසින් නිෂ්පාදනය කෙරෙනු ඇත. මෙහි නිර්මාණය කර ඇති බහුවිධ පද්ධතීන් මගින් බැක්ටීරියා, කාබනික දූෂක ද්‍රව්‍ය, බොර පැහැය, බැරලෝහ සහ අනෙකුත් අකාබනික දූෂක ද්‍රව්‍ය ඉවත් කෙරෙනු ඇත.



දූෂණය පාලනය කිරීම හා අගය එකතුකිරීම සඳහා මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල ගොඩවල් සඳහා විස්තීර්ණ විසඳුමක්

(ප්‍ර.අ: මහාචාර්ය මෙත්තිකා විතානගේ, ආචාර්ය බී.සී. එල්. අතපත්තු මිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය)

නාගරික කාබනික ඝන අපද්‍රව්‍ය කාබනීතෘත ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීම සඳහා - මධ්‍යම හා කුඩා පරිමාණ විවෘත කසල ගොඩවල් කළමනාකරණය සඳහා තිරසාර විස්තීර්ණ විසඳුමකි.



ශ්‍රී ලංකාවේ තෝරාගත් ඖෂධීය ශාක මගින් දියවැඩියාව හා රුධිරගත අධික මේදය යන රෝගී තත්වයන් සඳහා නව බහුශාකසාර සංයුතියක් නිපදවීම.

(ප්‍ර.අ: ආචාර්ය ජේ.එම්.එස්.ජේ.මැණිකේ, නියෝජ්‍ය ප්‍ර:අ: ආචාර්ය කේ.ජී.ඒ.පී.අත්තනායක)

පහත අරමුණු ඉටුකර ගැනීම සඳහා 2020 දෙසැම්බර් මස අවසානයේ මෙම ප්‍රදානය පිරිනමනු ලැබිය;

- ප්‍රමිතියෙන් යුත් විශ්ලේෂණ ක්‍රම භාවිතාකර කරපිංචා කොළ, සුදු ලූණු, ගම්මිරිස් ඇට හා ගොරකා ගෙඩි අඩු උෂ්ණත්වයක් යටතේ වියලා (freeze dried) ලබාගත් කුඩු වලින් සමන්විත බහුශාකසාර සංයුතිය ප්‍රමිතිකරණය.
- බහුශාකසාර සංයුතියේ ස්ථායිතාවය, කල්තබා ගත හැකි කාලය හා ඖෂධ ශරීරය තුල ගමන් කරණ ආකාරය තීරණය කිරීම.
- බහුශාකසාර මිශ්‍රණයේ ආසන්නතම පෝෂණ සංයුතිය තීරණය කිරීම.
- 2 වන ආකාරයේ දියවැඩියා තත්වය සහිත රෝගීන්ගේ රුධිරගත ග්ලූකෝස් මට්ටම අඩුකිරීම කෙරෙහි බහුශාකසාර සංයුතියේ බලපෑම තීරණය කිරීම.
- ඉහත අධ්‍යයන මාතෘකා වල සඳහන් බහුශාකසාර සංයුතියේ අහිතකර/විෂ සහිත බලපෑම තීරණය කිරීම.
- 2 වන ආකාරයේ දියවැඩියා තත්වය සහිත රෝගීන් සඳහා ඔක්සිකරණ ආතති සාධක හා ප්‍රදාහයක් ඇතිවීමේ සාධක, රුධිරගත අධික මේදය කෙරෙහි බහුශාකසාර සංයුතියේ බලපෑම විමර්ශනය කිරීම.
- ජෛව විශ්ලේෂක පාදක මූලධර්ම භාවිතයෙන් බහුශාකසාර සංයුතියේ ප්‍රති දියවැඩියා ද්විතීක පරිවෘත්තජ හඳුනා ගැනීම.
- හඳුනාගත් සංයෝග සඳහා කෘතිම වෙනස්කම් සිදුකර ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය අතර සම්බන්ධතාවයක් ගොඩනැගීම.
- ස්ට්‍රෙප්ටොසොටොසින් මගින් 2 වන ආකාරයේ දියවැඩියාව ඇතිකල මීයන්ගෙන් වෙන්කරගත් සංයෝගයන්හි වැඩිදියුණුවූ සෛලීය ප්‍රතිදියවැඩියා යාන්ත්‍රණයක් විමර්ශනය කිරීම.
- ස්ථූල විස්ටර් රැට් මොඩලය (Wistar rat model) මගින් දියවැඩියාවට එරෙහිව බහුශාකසාර මිශ්‍රණයේ ආරක්ෂාකාරී බලපෑම විමර්ශනය කිරීම
- බහුශාකසාර සංයුතිය වාණිජකරණය සඳහා ඇති හැකියාවන් පිළිබඳව සොයාබැලීම.



අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන

2020 වසරේ අන්වේෂක මත පදනම් පර්යේෂණ ප්‍රදාන වැඩසටහනෙහි ඉතිරිව ඇති ප්‍රදානයන් 23ක් සමගින් 2021 වසර ආරම්භ විය.

වසර තුළ ප්‍රදනයන් 22ක් මූල්‍යයනය කරන ලද අතර එක් අයදුම්කරුවෙකු විසින් මීට පෙර ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානයකදී පෙන්නුම් කරන ලද දුර්වල කාර්යසාධනය හේතුවෙන් එම ව්‍යාපෘතිය ප්‍රතික්ෂේප වූ අතර අනෙකුත් ප්‍රදානයන්හි ක්‍රියාකාරකම් ආරම්භ විය.

වසර තුල ක්‍රියාත්මක ප්‍රදානයන්හි වාර්ෂික ප්‍රගති වාර්තා ඇගයීම් සඳහා යවනු ලැබිය.

ක්‍රියාකාරකම	**2018**	**2019**	**2020**	**2021**
ඇගයීමෙන් පසු මූල්‍යනය සඳහා නෝරාගත් අයැදුම්පත් සංඛ්‍යාව	24 + 4	37	38+4	-
මූල්‍යනය කරනු ලැබූ ප්‍රදාන සංඛ්‍යාව	24 + 4	28	19	22
භාණ්ඩාගාර ප්‍රතිපාදන හරහා පිරිනමනු ලැබූ ප්‍රදානයන්හි මුළු වටිනාකම	*රු.මිලි.* 120.93	*රු.මිලි.* 128.41	*රු.මිලි.* 63.66	*රු.මිලි.* 106.21

2021 වසරේදී මූල්‍යාධාර ලබාදෙන ලද පර්යේෂණ ප්‍රදාන

අයදුම්පත් අංකය	**මූලික අන්වේශක හා ආයතනය**	**මාතෘකාව**
20-005	ආචාර්ය එන්. රොක්වුඩ් ක්ෂුද්‍රජීවී විද්‍යා අධ්‍යනාංශය කොළඹ විශ්වවිද්‍යාලය	Epidemiology and molecular diagnostics for acute undifferentiated febrile illness in Sri Lanka
20-012	ආචාර්ය ඊ.සී. ජයසිලන් උද්භීද විද්‍යා අධ්‍යනාංශය යාපනය විශ්වවිද්‍යාලය	Identification and characterization of major pathogens in grape cultivation and improving the grape production by managing major diseases through eco-friendly control measures.
20-022	මහාචාර්ය එන්.කේ. අදිකාරම් ජාතික මූලික අධ්‍යයන ආයතනය (NIFS)	Study of some postharvest disorders of guava, mango and avocado and their management
20-028	මහාචාර්ය එච්.එම්.ඒ.එම්.සී. හේරත් භෞතික විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	Fabrication of smart printable sensors for detection of toxicants in the environment
20-031	ආචාර්ය එන්.ඩී. වනසේකර රෙදිපිළි හා ඇඟළුම් තාක්ෂණ අධ්‍යනාංශය මොරටුව විශ්වවිද්‍යාලය	Optimizing Wearable Triboelectric Nanogenerators for the Internet of Things (IOT)
20-038	ආචාර්ය සී.කේ. හේමචන්ද්‍ර පාරිසරික තාක්ෂණ අධ්‍යනාංශය කොළඹ විශ්වවිද්‍යාලය	Assessment of Endocrine Disrupting Potential of Industrial Effluents and Surface Water of Kelani River using Bioanalytical Tools
20-047	ආචාර්ය කේ.ජී.ඩී.ඒ.ඩී. තිලකරත්න රසායන විද්‍යා අධ්‍යනාංශය කොළඹ විශ්වවිද්‍යාලය	Investigation of the detection of bacteria in water and food samples using bioconjugated fluorescent nanoparticles
20-051	ආචාර්ය ඩබ්.එම්.ඒ.පී. හල්මිල්ලවැව ක්ෂුද්‍රජීවී විද්‍යා අධ්‍යනාංශය කැලණිය විශ්වවිද්‍යාලය	Characterization of bioactive pigments of mangrove-associated bacteria and screening for their potential biotechnological applications

20-055	ආචාර්ය එම්.එස්. ගුණවර්ධන භෞතික විද්‍යා අධ්‍යනාංශය කොළඹ විශ්වවිද්‍යාලය	Development of surface enhanced Raman spectroscopy (SERS) methods for in-situ detection of hazardous pesticides combined with portable technology
20-073	ආචාර්ය සී.ඩී ගමගේ ක්ෂුද්‍රජීවී විද්‍යා අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	Investigation and characterization of hantavirus infection in selected Districts and enhancement of hantavirus diagnostic facilities in Sri Lanka.
20-079	ආචාර්ය එස්. සී. සෝමසිරි සත්ව හා ආහාර විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	Evaluation of feed efficiency and meat quality parameters of slow growing (label rouge) pasture raised chicken
20-089	ආචාර්ය එච්.ඒ.අයි.ආර්. පෙරේරා මිය රසායන විද්‍යා අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	Fine-Tuning Electronic / Semiconductor Properties of an Iso-reticular Metal Organic Framework Series to be Applied in Dye-Sensitized Solar Cells
20-098	ආචාර්ය ඩී.එන්. විදාන ගමගේ පාංශු විද්‍යා අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය	Investigation of crop water usage and soil hydrological dynamics of oil palm (Elaeis guineensis Jacq.) and rubber (Hevea brasiliensis Muell. Arg.) plantations in the low country wet zone of Sri Lanka.
20-104	ආචාර්ය ඩබ්. අයි.ආර්. ප්‍රනන්දු රසායන විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	Development of pH- and esterase-responsive ß-cyclodextrin-adamantane inclusion-based biodegradable novel supramolecular network towards the fabrication of hydrogel for the controlled drug delivery
20-107	ආචාර්ය එච්.එල්.ටී.යූ.ආරියදාස රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යා අධ්‍යනාංශය මොරටුව විශ්වවිද්‍යාලය	Investigation of the potential of microalgae cultivation in hybrid systems for carotenoids production under Sri Lankan climatic conditions
20-109	ආචාර්ය එල්.කේ.ඩබ්.විජයරත්න ශාක විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	Control of stored-product insects using biorational methods
20-110	ආචාර්ය වයි. ශිවතර්සිනි මිය රසායන විද්‍යා අධ්‍යනාංශය යාපනය විශ්වවිද්‍යාලය	Transition metal chalcogenide embedded TiO2 nanocomposites for Hydrogen energy production and environmental remediation under extended solar irradiation
20-111	මහාචාර්ය එම්. සෙන්තිල්නන්දනන් රසායන විද්‍යා අධ්‍යනාංශය යාපනය විශ්වවිද්‍යාලය	Selected Transition metals and Nitrogen co-doped Titanium dioxide electrode for Dye Sensitized Solar Cells
20-113	ආචාර්ය එම්.ඩී.පී. කුමාරතුංග පොල් පර්යේෂණ ආයතනය	Coconut for the future: How will Coconut respond to global climate change?
20-115	ආචාර්ය ජී.ඩී.ආර්.කේ. පෙරේරා ගොවිපළ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය	Effects of environmental fluoride, hardness and heavy metal (Cd, Pb, As) exposures to the cow milk and their kidney function in CKDu endemic areas of Sri Lanka
20-118	ආචාර්ය කේ.ජී.ඒ.ඩී. වීරකෝන් පරපෝෂ විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	PCR-based molecular evaluation of intestinal parasitic infections among school children in Anuradhapura, Sri Lanka.
20-128	ආචාර්ය එච්.එම්.එල්.අයි. හේරත් ශ්‍රී ලංකා නැනෝතාක්ෂණ ආයතනය (පෞද්.) සමාගම	Engineering Microbial Ecology in Agroecosystem via Bio-encapsulation of Microbial Communities to Improve Soil Health and Fertility

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන

කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් රජය විසින් මහජන ඒකරාශීවීම සඳහා අවසර ලබානොදුන් බැවින් කවුන්සිලයේ තීරණය මගින් 2020 වසරේ විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන උළෙල 2021 වසරට කල්දමනු ලැබීය. නමුත්, ශ්‍රී ලාංකීය ආයතනයකට අනුබද්ධ ශ්‍රී ලාංකීය විද්‍යාඥයින් 20%කට වැඩි දෙනෙකුගේ ලිපි පළකරනු ලබන SCImago සඟරා ශ්‍රේණිගත කිරීම අනුව (SJR) ඉහලම ස්ථානයක ශ්‍රේණිගත කරන ලද සඟරාවල පළවූ ප්‍රකාශන අතරින් හඳුනාගනු ලැබූ ප්‍රමුඛ ප්‍රකාශන 100 (2018 වසරේදී) හඳුනාගෙන සම්මාන උළෙල සඳහා ලයිස්තු ගතකරනු ලැබීය. මෙම තොරතුරු භාවිතයෙන් 2021 වසරේ මුල් කාලයේ තේරීම් කටයුතු නිමකරන ලද අතර සම්මාන උළෙල 2021 අප්‍රේල් 06 වන දින කොළඹ 07, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ ශ්‍රවනාගාරයේදී පැවැත්විණ.

ශ්‍රී ලංකීය විද්‍යාඥයින් විසින් සිදුකරන ලද හෝ දායකත්වය සපයන ලද පිළිගැනීමට ලක්වූ විද්‍යාත්මක සඟරාවන්හි පළවූ ප්‍රථම ස්ථාන 100 හිමිකර ගත් පර්යේෂණ ප්‍රකාශන සඳහා සම්මාන පිරිනමනු ලැබීය. කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීම සඳහා පනවන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් සම්මානලාභීන් 20 දෙනෙකුගේ හා කවුන්සිලයේ පමණක් සහභාගිත්වය ඇතිව අර්ධ මාර්ගගත ඉසව්වක් ලෙස මෙම උළෙල පවත්වනු ලැබීය.



2021 වසරේ පසු කාලීනව ජාතික පර්යේෂණ සභාව Elsevier BV සමාගම විසින් අනුග්‍රාහකත්වයක් ඔශයෙන් 2019 වසරේදී සඟරාවන්හි පළකරන ලද ප්‍රමුඛ පර්යේෂණ පත්‍රිකා 100ක් සඳහා දක්ත කට්ටලයක් නොමිලේ ලබාගනු ලැබීය. වසර අවසානය වන විට, මෙම ප්‍රකාශනයන් සඳහා ශ්‍රී ලංකීය කර්තෘත්වයේ ප්‍රතිශතයක් සඳහා දත්ත තේරීම සහ ජනාධිපති සම්මාන සඳහා තොරතුරු සැකසීම ආරම්භකර ඇත.

රාජ්‍ය-පෞද්ගලික සහයෝගිතා වැඩසටහන

මෙම කාලසීමාව තුලදී රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා (PPP) වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

ක්‍රියාකාරකම්	2019	2020	2021
ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා සංඛ්‍යාව	5	4	3
පෞද්ගලික අංශය සමග එලඹී හවුල්කාරිත්වයන් සංඛ්‍යාව	1	2	1
අවශ්‍ය මුළු අරමුදල් ප්‍රමාණය	රු.මිලි. 42.23	රු.මිලි. 47.70	රු.මිලි. 8.95
පෞද්ගලික අංශය විසින් සපයන ලද අරමුදල් (ආසන්න වශයෙන් 50%)	රු.මිලි. 21.90	- ව්‍යාපෘති ආරම්භකර නැත.	රු.මිලි. 4.49

දැනට ක්‍රියාත්මක රාජ්‍ය පෞද්ගලික සහයෝගිතාවයන් .....

ප්‍රදාන අංකය.	පර්යේෂණ හවුල්කරු	ව්‍යාපෘති මාතෘකාව
PPP 16-03	ආචාර්ය ආර්.එම්. ධර්මදාස කාර්මික තාක්ෂණ ආයතනය	Extraction and formulation of plant protection products from endemic plants for healthy growth of crops free from sucking insects (mealybugs, aphids, whiteflies and thrips) causing yellowing, wilting and leaf-curl
PPP 17-03	ආචාර්ය කුටිල ගුණසේකර මොරටුව විශ්වවිද්‍යාලය	Cross platform for Annotations in Mobile Tablets
PPP 18-01	ආචාර්ය ජේ.සී.පී.එච් ගමගේ මොරටුව විශ්වවිද්‍යාලය	Development of an economical insulation system for externally strengthened FRP/Concrete composites using locally available materials
PPP 18-02	මහාචාර්ය රොහාන් මුණසිංහ මොරටුව විශ්වවිද්‍යාලය	Development of commercial prototypes of multipurpose drones – CeyGull and CeyBell
PPP 19-04	මහාචාර්ය නිල්වලා කෝට්ටෙගොඩ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	Waste Coconut Coir Based Multi-purpose Nano-water Filters
PPP 20-01	ආචාර්ය රුවන් වීරසිංහ කොළඹ විශ්වවිද්‍යාලයිය පරිගණක අධ්‍යනායතනය	Development of a Next-Generation Sequencing (NGS) based test for the diagnosis of Maturity Onset Diabetes of the Young (MODY)

2021 වසරේදී නිමකරන ලද PPP ව්‍යාපෘති ...

PPP 17-01: TomEJC අඹ ප්‍රභේදයේ අපනයනය ප්‍රවනතාවයට අහිතකර ලෙස බලපාන යම් පසුඅස්වනු රෝග හා ආබාධ පිළිබඳ අධ්‍යයනය හා ඒවායේ කළමනාකරණය


(මහාචාර්ය එන්.කේ. අදිකාරම්, ජාතික මූලික අධ්‍යයන ආයතනය)



මෙම ව්‍යාපෘතිය මගින් cv. Tom EJC අඹ ප්‍රභේදයේ පසු අස්වනු රෝග හා ආබාධයන් පිළිබඳ පරීක්ෂා කෙරේ. පසු අස්වනු හානි/ ආබාධ වලට හේතු, මදය අභ්‍යන්තරයේ දුඹුරුපැහැවීම, මතුපිට වල ගැසීම, පොත්ත අවපැහැවීම හා නටුව අග දුඹුරුපැහැවීම සඳහා කළමනාකරණ උපායමාර්ග වැඩිදියුණු කිරීම සඳහා යාන්ත්‍රණයක් හඳුනාගැනීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කරන ලදී. හේතු හඳුනාගෙන ඇති අතර උපායමාර්ග දක්වා ඇති බැවින් ප්‍රතිඵල ප්‍රත්‍යක්ෂය. පෞද්ගලික අංශයේ හවුල්කරු වන එල්ලාවල හෝටිකල්චර් (ප්‍රයිවට්) ලිමිටඩ් මෙම සොයාගැනීම් අනුරාධපුරයේ ඇති සිය වගාබිමෙහි භාවිතා කිරීමට හා ඉන් පිටත වගාවන් සිදුකරන ඔවුන්ගේ වගාකරුවන්ට දැනුම බෙදා දීමට එකඟවී ඇත. මෙමගින් ගොවියන්ගේ ආදායම වැඩිවීමට ඉවහල්වන අතරම 2025 වසර වන විට අපනයනය දෙගුණයක් වන බවට ඇස්තමේන්තුකර ඇති cv. Tom EJC අඹ විශේෂයේ අපනයන ඉලක්ක ලඟාකර ගැනීමට හැකිවේ.

PPP 18-07: තන්තුමය ද්‍රව්‍ය භාවිතයෙන් කාන්දුවීම් පාලනය කිරීමේ සංයුතියක් හා ක්‍රමයක්

(ආචාර්ය ගෝඛිතාස් ධර්මරාජා, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය)



ජලය කාන්දුවන යෙදවුම් සඳහා දැනට භාවිතා කරන සිමෙන්ති මිශ්‍ර ග්‍රවුව් සිමෙන්තිවලට ජලය මිශ්‍රකර සකසාගනු ලබයි. නමුත් ඉහල ජල සංයුතිය හේතුවෙන් මෙම ග්‍රවුට්වල ජලය කාන්දුවීම වැළැක්වීමේ කාර්යක්ෂමතාවය අඩුවේ. ජල සංයුතිය අඩුකර සිලිකා හෝ හමන අළු වැනි ක්ෂුද්‍ර පෙරන ද්‍රව්‍ය හඳුන්වාදීම මගින් කාන්දුවීම අඩුකර ශක්තිමත්බව වැඩිකිරීමට හේතුවන බව සනාථකර ඇත. නමුත් ක්ෂුද්‍ර අංශ හඳුන්වාදීම මගින්. එබැවින් පදම්ගතිය වැඩිකිරීම හා පළුදුවීම් අඩුකිරීම සඳහා සම්මිශ්‍රණ හා ස්වභාවික කෙඳි හඳුන්වා දෙනු ලැබීය. ග්‍රවුට්වල නව හා දැඩි වීමේ ලක්ෂණ පිළිබඳ පරාමිතින් කිපයක් සහිත නවිකරණය කරන ලද මිශ්‍රණය අධ්‍යයනය කරන ලදී.
භෞතික හා යාන්ත්‍රික ගුණ වැඩිදියුණු කිරීම මගින් වාණිමය වශයෙන් භාවිතාවන ග්‍රවුට්වල ජල සංයුතිය 50%කින් අඩුකිරීමට මෙම පර්යේෂණ අධ්‍යයනය ඉවහල්විය. පිළිගත හැකි පදම්ගතියක් හා පාරගම්‍යතාවක් නිරීක්ෂණය විය. ග්‍රවුට්වල සම්පීඩක ශක්තිය, නම්‍යශීලි ශක්තිය වැනි යාන්ත්‍රික ලක්ෂණ වැඩිදියුණු කරන ලදී. එබැවින් ග්‍රවිට් සඳහා ක්ෂුද්‍ර අංශු හා තන්තු හඳුන්වාදීම අදාල යෙදවුම් සඳහා වාසිදායක විය හැකිබව මෙම අධ්‍යයනය මගින් දැක්වේ.



a) Water/Cement: 0.4 b) Water/Cement: 0.6 c) Water / Cement: 0.7

Figure 4: Flowability with increased water cement ratio of a plain mixture



a) Water/Cement: 0.4 + 1% coir b) Water/Cement: 0.6 + 1% coir c) Water / Cement: 0.7 + 1% coir

Figure 5: Flowability of the plain mixture with added 1% coir fibre

ඉක්මන් ප්‍රතිචාර ප්‍රදානයන්

විද්‍යාත්මක නව නිපයුම් (නිෂ්පාදන, ක්‍රියාවලි හෝ කොවිඩ්-19 බෝවීම හා පැතිරීම වලක්වන වෙනත් නවෝත්පාදන) බිහිකිරීම සඳහා පෙර වසරේ ආරම්භ කරන ලද වැඩසටහන් අඛණ්ඩව සිදුකර ගෙන යන අතර ජාතික පර්යේෂණ සභාවට ඉක්මන් ප්‍රතිචාර ප්‍රදානයන් යටතේ තවත් අයදුම්පත් 07ක් ලැබුණි. ඉන් දෙකක් මූල්‍යයනට සඳහා තෝරාගත් අතර 2021 වසරේදී ආරම්භ කරන ලදි.

ප්‍රදාන අංකය	ප්‍රදානලාභියා සහ ආයතනය	මාතෘකාව
CVD 20-38	අචාර්ය සේනක පිලපිටිය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	A two-centre double-blind (treating clinicians and assessors) placebo controlled randomized parallel-group phase 1/2 proof-of-concept clinical trial on effectiveness and safety of Sri Weera Badhra Dhamma Prathishakthi Jeewa Panaya© for mild to moderate symptomatic or asymptomatic SARS-CoV-2 patients
CVD 20-41	වෛද්‍ය ටී.එම්.ආර්.ආර්.ජිනසේන දකුණු කොලඹ ශික්ෂණ රෝහල	Evaluation of the Immune Response to ChAdOx1 nCOV-19 Vaccine, in a cohort of participants in Colombo

ප්‍රථම ඉක්මන් ප්‍රතිචාර ප්‍රදානයන්හි වැදගත් ප්‍රථිපල පහත පරිදි සාරාංශකර දැක්වේ;.

CVD 20-05 කොවිඩ් -19 හා ඒ හා සමාන වසංගත පාලනය කිරීම සඳහා ජංගම දුරකථන පාදක සම්බන්ධතා හඳුනාගැනීමේ හා සොයාගැනීමේ ජංගම දුරකතන යෙදවුමක් (ඇප්) ස්වරක්ෂා වැඩිදියුණු කිරීම

කොළඹ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ තාරකා විද්‍යා හා අභ්‍යවකාශ විද්‍යා ඒකකයේ මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂකයින් කණ්ඩායමක් විසින් කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සඳහා ‘‘ස්වාරක්ෂා’’ යනුවෙන් නම්කරන ලද ජංගම දුරකථන පාදක කරගත් ඇප් එකක් නිර්මාණය කරනු ලැබීය. 100%ක්ම ශ්‍රී ලාංකීය නිපයුමක් වන මෙම ඇප් එක මහජනයාට නොමිලේ බාගත කිරීම කල හැකිය. එමගින් තොරතුරුවල රහස්‍යභාවය සමගින් තත් කාලීන තොරතුරු සැපයේ.

සෞඛ්‍ය බලධාරීන් විසින් දත්ත ඇතුලත් කළවිට මෙම ඇප් එක ක්‍රියාත්මකව තබා සාමාන්‍ය මහජනයාට එතරම් බියක් නොමැතිව ඕනෑම ස්ථානයකට ගමන් කිරීමට හා ආර්ථික කටයුතුවල නියලීමට හැකිවේ. ඔබ පහත සඳහන් පුද්ගලයින් වෙත ප්‍රවේශවූ විට මීටර් 10ක දුරකදී ඔබගේ දුරකථනය බීප් බීප් ශබ්දයක් නැගීම, කම්පනය වීම (vibrates) සිදුවන අතර ඔබ වෙත ලඟාවන පුද්ගලයාගේ අවදානම් මට්ටම වෙනස් වර්ණ 5ක් මගින් තිරයේ දිස්වනු ඇත: Covid-19 සක්‍රීය (රතු)/ වැළඳී සුව වූ (තැඹිලි)/ නිරෝධායනය ලක්වූ (දුඹුරු)/ නිරෝධායනය නිමකරන ලද (කොළ)/ පසුගිය දින 14/28 අතර පිටරට සිට පැමිණි (තද දම්). තවද, ඔබ සාප්පු සංකීර්ණයක් වැනි ස්ථානයකට යාමට පෙර ගතික සිතියමක් මත අනතුරු මට්ටම බලාගැනීමටද හැකිවේ. මෙම ඇප් එක සමගින් අප රටේ ආදායමෙන් 13%ක් උත්පාදනය කරන සංචාරක කර්මාන්තය විවෘත කිරීමේ හැකියාවද ඇත. COVID සැකසහිත පුද්ගලයින් ඔවුන්ගේ නිවෙස්වලම/ හෝටලයක ස්වයං නිරෝධායනයට ලක්කිරීමට අවශ්‍ය වන්නේ නම් Geofencing ආරක්ෂක පහසුකමද පවතී. පුද්ගලයෙකු ආසාදිතවූ විට, අවශ්‍ය වන්නේ නම් පසුගිය දින 14 දක්වා ඔහුගේ/ඇයගේ ආශ්‍රිතයින් හඳුනාගැනීමේ පහසුකම ද මෙම ඇප් එක සතුය. පුද්ගලයෙක්ගේ අවදානම් මට්ටම දක්වන QR කේත ලක්ෂණයද මෙම ඇප් එකෙහි ඇතුලත් බැවින් දැනට සිදුකරන ශරීර උෂ්ණත්වය මැන බැලීමේ ක්‍රමයට අමතරව පොදු ස්ථානයකට ඇතුලුවීමේදී ආරක්ෂක ක්‍රමයක් ලෙස ද භාවිතා කළ හැකිය. අනාගතයේදී ඇතිවිය හැකි වෙනත් වසංගතයන් පාලනය කිරීම සඳහා මෙන්ම ඩෙංගු රෝගී පොකුරු පෙන්නුම් කිරීම සඳහාද මෙම ඇප් එක යොදාගත හැකි වනු ඇත.

COVID-19 රෝගීන් විශාල ලෙස පැතිරීම පාලනය කරන ලද රටවල් බොහොමයක්ම සිය රෝග පාලන වැඩසටහන්වල අත්‍යවශ්‍ය කොටසක් ලෙස ඔවුන්ටම අයත් ජංගම දුරකථන පාදක ඇප් සාර්ථක ලෙස යොදාගෙන ඇත. පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරන අතරම යම් වසංගතයක් පාලනය කිරීම සඳහා ලක්ෂණ විශාල සංඛ්‍යාවකින් සමන්විත මෙය ලෝකයේ නිපදවන ලද වඩාත් උසස් ඇප් වලට බෙහෙවින්

සමානවේ. මෙම ඇප් එක ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) හරහා අවශ්‍ය වන රටවල්වලට නොමිලේ ලබාදීමට පර්යේෂකයින් විසින් සැලසුම්කර තිබුණි.







CVD 20-09 **කොවිඩ් -19 බලපෑමට ලක්වූ අය සඳහා පෝෂක පරිපූරකයක් ලෙස ප්‍රතිශක්තිය ඉහළ නංවන ආහාර සංයුතියක් වැඩිදියුණු කිරීම හා එහි ප්‍රමිතිය ඇගයීම**

කොවිඩ්-19 වසංගතය මගින් ලෝකය වෙනස් කරන ලද අතර මානව චර්යාවන් ද වෙනස් විය. ප්‍රතිශක්තිය ගොඩනගා ගැනීම තුළින් වසංගතය මැඩපැවැත්වීම සඳහා විශේෂයෙන්ම මිනිසාගේ පෝෂණය පිළිබඳ විවිධ ලක්ෂණ කෙරෙහි මිනිසුන් සැළකිලිමක් විය. විද්වත් පර්යේෂකයින්ට සහ ආහාර අංශයේ විශේෂඥයින්ට ආහාර හානිය හා නාස්තිය වැලැක්වීම මෙන්ම පාරිභෝගිකයන්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට ගැළපෙන විකල්ප හා ආරක්ෂිත ප්‍රෝටීන ප්‍රභව හඳුනා ගැනීම පිළිබඳ සුවිශේෂී අභියෝග ගණනාවකට මුහුණදීමට සිදුවනු ඇත. ඒ සමගම ඔවුන්ට සෞඛ්‍යය ප්‍රවර්ධනය කරන සහ පාරිභෝගිකයින්ගේ ප්‍රතිශක්තිකරණ පද්ධතියට සහය වන පෞෂ්ඨ ක්‍රියාකාරී සංයෝග හා ප්‍රතිඔක්සිකාරක ඇතුලත් පිළිගතහැකි හා ආර්ථිකමය වශයෙන් තරගකාරී නිෂ්පාදන පිරිනමන, COVID-19 වසංගත කාලයේදී ඇතිවන ආර්ථික අර්බුදයට සරිලන වේගයෙන් නවෝත්පාදන හඳුන්වාදිය යුතුය. මෙම අධ්‍යයනය මගින් සකස් කරන ලද නිෂ්පාදනය බිටා කැරටින්, ඇස්කෝබික් අම්ලය වැනි ප්‍රතිඔක්සිකාරක සහ සින්ක් (Zn) වැනි ක්ෂුද්‍ර පෝෂකවලින් පොහොසත්ය. ක්ෂුද්‍රජීව විද්‍යාත්මකව එය දින 42ක් ආරක්ෂිතව ගබඩාකර තැබිය හැකිවේ. එසේම මෙම නිෂ්පාදනය එහි සංවේදී හා භෞතික හා රසායනික ලක්ෂණ ආරක්ෂා කරමින් දින 42ක් ශීතකරණයේ (-20°C) ගබඩාකර තැබිය හැකිවේ. අනුරාධපුර ජාතික පසු-අස්වනු කළමනාකරණ ආයතනයේ ආචාර්ය නිලන්ති විජේවර්ධන විසින් මෙම පර්යේෂණය සිදුකරන ලදී.

CVD 20-24 **SARS-COV-2 ආසාදනයන් හඳුනා ගැනීම සඳහා ප්‍රතිදේහජනක හඳුනාගැනීම මගින් ඉක්මන් හඳුනා ගැනීමේ පරීක්ෂාවක් වැඩිදියුණු කිරීම සඳහා වන මූලික සංකල්පය තහවුරු කිරීම**

ජෛවරසායන, අනුක ජීවවිද්‍යා සහ ජෛවතාක්ෂණ ආයතනයේ (IBMBB) ආචාර්ය සිසිර පතිරණ විසින් ප්‍රතිදේහජනක මගින් ඉක්මනින් SARS-COV-2 වෛරසය හඳුනාගැනීම සඳහා වන මූලධර්මයක් සනාථකර ඇත. දැනට වාණිජව භාවිතාවන COVID-19 Ag රැපිඩ් පරීක්ෂණ කට්ටලයට වඩා වැඩි සංවේදීතාවයක් සහිත lateral flow immune assay තාක්ෂණය භාවිතයෙන් විනාඩි 15කට වඩා අඩු කාලයකදී ප්‍රතිඵල ලබාදෙන SARS-CoV-2 ප්‍රතිදේහජනක ඉක්මනින් හඳුනාගැනීම සඳහා පරීක්ෂණ තීරුවක් වැඩිදියුණු කරනු ලැබීය. මෙම වැඩිදියුණු කරන ලද උපකරණය රු. 1000.00කට අඩු මුදලකට ලබාගත හැකි බැවින් එය ආර්ථිකමය වශයෙන් ශක්‍යවන අතර මෙම මිල තවදුරටත් අඩුවීමේ ප්‍රවණතාවක් පවතී.

විශේෂ ප්‍රදානයන්

අයදුම්කරන ලද ආයතනයන්හි ඉල්ලිම් වල ජාතික වැදගත්කම හා භාණ්ඩාගාරයේ හා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශයන් සළකාබලා 2021 වසර තුළ විශේෂ ප්‍රදාන දෙකක් සඳහා මූල්‍යාධාර ලබාදෙනු ලැබීය.

SP 21-01 (සෞභාග්‍යයේ දැක්ම - 4 වන පරිච්ඡේදය හා අදාලවේ)
කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හා විද්‍යා පීඨයේ සහයෝගිතාවය ඇතිව පිළිකා හඳුනා ගැනීම හා පර්යේෂණ සඳහා ජාතික නිර්දේශක මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම (National Referral Centre for Cancer Diagnosis and Research)

<u>අරමුණු</u>

- පිළිකා ප්‍රතිකාර ක්‍රමවේදය, විශාල විෂය පරාසයක විහිදුනු ජානමය පර්යේෂණ හා සාක්ෂි මත පදනම් වූ විශේෂඥතාවයන් රැසක් සමග සම්බන්ධ වන හෙයින්, පිළිකා රෝග විනිශ්චය සහ පර්යේෂණ සඳහා නවතම පහසුකම් වලින් යුත් ජාතික මධ්‍යස්ථානායක් ස්ථාපිත කිරීම. රටේ වත්මන් අවශ්‍යතාවයකි.

- රෝගියාට ජීවිතය බෙරාගැනීම හා පිළිකාවන්හි විශේෂ පෛවවිද්‍යාත්මක හැසිරීමට අනුව සකස්කළ ප්‍රතිකාර යන දෙඅංශයෙන්ම උපරිම ප්‍රතිලාභ ලබාදිය හැකි කාලීන, නිවරදි හා සම්පූර්ණ රෝග විනිශ්චය ලබාදීම මෙන්ම රජය විසින් මහජන මුදල් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම.
- සමාජ තත්වය හා වාසයකරන ස්ථානය නොසළකා සෑම පුරවැසියෙකුටම මෙම පහසුකම් සඳහා විවෘතව ප්‍රවේශ විය හැකි ලෙස ස්ථාපිත ජාතික වශයෙන් පිළිගත් නිර්දේශක පද්ධතියක්

මෙම ව්‍යාපෘතියේ අදියර කීපයක් ඇති අතර පළමු අදියර සඳහා පමණක් ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය සහය අපේක්ෂා කෙරේ. පළමු පියවර යටතේ පිළිකා හඳුනා ගැනීම හා පර්යේෂණ සඳහා ජාතික නිර්දේශක මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලය මගින් ඉඩම හා පරීක්ෂණාගාර පහසුකම් සපයනු ලැබේ. පළමු වසර සඳහා රු.මිලියන 35.1ක මූල්‍යාධාර ඉල්ලුම්කර ඇති අතර ප්‍රධාන අන්වේශක වන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය චන්දු ද සිල්වා සමග නෛතික ගිවිසුම අත්සන්කර ජාතික පර්යේෂණ සභාව විසින් පළමු අදියර සඳහා ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීය. පෞද්ගලික අංශයෙන් නිර්දේශක රෝගීන් සඳහා ගාස්තුවක් අයකිරීම මගින් මධ්‍යස්ථානය ස්වයං ආදායම් උත්පාදන ආයතනයක් ලෙස කටයුතු කරනු ඇත.

SP 21-02 (සෞභාග්‍යයේ දැක්ම - 8 වන පරිච්ඡේදය හා අදාලවේ**)**
කාර්යක්ෂම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සඳහා දේශීය ක්ෂුද්‍රජීවී ගහණය වෙන්කර ගැනීම

<u>අරමුණු</u>

පොදු අරමුණු
බහුවාර්ෂික ප්‍රතිචක්‍රීකරණ ගැටලු විසඳීම සඳහා පෛව භායනයට ලක්වන ඝන අපද්‍රව්‍ය කාර්යක්ෂම හා ඵලදායි ලෙස දිරාපත් කරන ක්ෂුද්‍රජීවී ගහණයක් හෝ ගහණ වෙන්කර ගැනීම


විශේෂිත අරමුණු
1. ස්වභාවිකව ඉක්මනින් දිරාපත් වන කසළ බැහැරකිරීමේ හා කොම්පෝස්ට් සෑදීමේ ස්ථාන හා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි පිහිටි එකී ස්ථානයන්හි කසළ වියෝජනය කිරීම හා සම්බන්ධ විවිධ ක්ෂුද්‍රජීවී ප්‍රජාවන් හඳුනාගැනීම.
2. කාර්යක්ෂම දිරාපත්වීමේ ක්‍රියාවලියක් සඳහා තෝරාගත් ක්ෂුද්‍රජීවී ප්‍රජාවන් රෝපණය කිරීම.
3. තෝරාගත් ක්ෂුද්‍රජීවී ගහණය/ගහණයන්හි ක්‍රියාකාරිත්වය විස්තර කිරීම
4. ගතික ශ්වසනමිතික ඇගයීම් හා හා නියමු ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් මගින් තොරාගත් ක්ෂුද්‍රජීවීන්ගේ පෛවභායන කාර්යක්ෂමතාවය සහ සඵලත්වය ඇගයීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පෛවතාක්ෂණ මධ්‍යස්ථානයේ මහාචාර්ය ප්‍රදීපා බණ්ඩාරනායක සමග නෛතික ගිවිසුමකට එළඹීම මගින් ජාතික පර්යේෂණ සභාව මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 8.6ක් මූල්‍යයනය කරනු ලැබීය. නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම පදනම් කරගෙන කසළ කළමනාකරණ ගැටළු අවම කිරීම සඳහා පරිසර හිතකාමී තිරසාර ක්‍රම හඳුනා ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම් කරනු ලැබීය. හැකි ඉක්මනින් රටේ කසළ බැහැර කිරීමේ ගැටළුව විසඳීම ජාතික ප්‍රමුඛතාවයක් ලෙස රජය විසින් හඳුනාගෙන ඇත.

2021 වසරේ සුභසාධක වැඩසටහන්

1. පර්යේෂණ ප්‍රතිඵල පිළිබඳව මහජනතාවට ප්‍රචාරය කිරීම සඳහා වාර්තාමය වීඩියෝ පටයක් නිර්මාණය කිරීම

අති සාර්ථක පර්යේෂණ ව්‍යාපෘති 6ක් පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සඳහා ජාතික පර්යේෂණ සභාව (NRC) වාර්තාමය වීඩියෝ පටයක් නිර්මාණය කරන ලදී. මෙම වීඩියෝ වැඩසටහන විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති සම්මාන උලෙළේදී දියත් කරන ලද අතර යූටියුබ් හා ජාතික පර්යේෂණ සභාවේ වෙබ් අඩවියේ පළ කර ඇත.





2. මහජනයා දැනුවත් කිරීම හරහා ජල සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ජල ගීතය නිකුත් කිරීම.

සාමාන්‍ය ජනතාවට ජලයේ වැදගත්කම පිළිබඳ පණිවුඩය ගෙන ඒම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් NRC TO 16-015 පර්යේෂණ ව්‍යාපෘතිය සමඟින් 2021 ලෝක ජල දිනය සමරනු ලැබීය. මෙම අවස්ථාවට අදාල පාර්ශවකරුවන් ඇතුළුව 75 දෙනෙක් සහභාගි විය. නිකුත්කරන ලද ජල ගීතයේ වීඩියෝ පටය යූටියුබ් නාලිකාවේ හා ජාතික පර්යේෂණ සභාවේ වෙබ් අඩවියේ පළකර ඇත.



3. ජාතික පර්යේෂණ සභාව මගින් මූල්‍යාධාර සපයන ලද පර්යේෂණ ව්‍යාපෘති: පර්යේෂණ ප්‍රතිඵල කාර්මික යෙදවුම් සඳහා යොදාගැනීම

මීට පෙර නිමකරන ලද පර්යේෂණ ප්‍රදානයන් (NRC මගින් මූල්‍යාධාර සපයන ලද) අතරින් කාර්මික වශයෙන් යොදාගත හැකි පර්යේෂණ ප්‍රතිඵල හඳුනාගැනීමේ වැඩපිළිවෙලක් ජාතික පර්යේෂණ සභාව විසින් ආරම්භකර ඇත. එකී පර්යේෂණ ප්‍රතිඵල යොදාගැනීම සඳහා අදාල පාර්ශවකරුවන් හා අදාල අමාත්‍යාංශ සඳහා මග පෙන්වීමේ සැලසුම් ආයතනය සතුවිය. මෙහි ආරම්භක පියවරක් ලෙස ජාතික පර්යේෂණ සභාවේ කාර්යසාධන හා ඇගයීම් කමිටුව විසින් කාර්මික වශයෙන් යොදාගත හැකි පර්යේෂණ ප්‍රතිඵල ලබා ඇති පර්යේෂණ ව්‍යාපෘති 11ක් හඳුනාගනු ලැබූ අතර ඒවායේ ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල ඉදිරිපත් කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කරන ලෙස උපදෙස් දෙනු ලැබිය.

ප්‍රදාන අංකය	පර්යේෂණ මාතෘකාව
11-178	Synthesis of value-added products from Sri Lankan dolomitic marbles (ශ්‍රී ලංකීය ඩොලමිටික කිරිගරුඩ පාෂාණ වලින් අගය එකතුකරන ලද නිෂ්පාදන සංශ්ලේෂණය)
12-081	Bioactivity studies and activity guided separation of anti-inflammatory compounds from Alpinia calcarata rhizome and leaf (ඕන් අරත්ත (*Alpinia calcarata*) රයිසෝමය හා කොළ වලින් ප්‍රතිඉදිමුම් සංයෝග වෙන්කරගැනිම සඳහා මගසලසන ජෛවක්‍රියාකාරී අධ්‍යයන හා ක්‍රියාකාරිත්වයන්)
12-113	Molecular and biochemical characterization of Sri Lankan pomegranates and expression analysis of major hydrolysable tannin genes under different environmental conditions and maturity stages to popularize cultivation in Sri Lanka (ශ්‍රී ලංකීය දෙළුම්වල අණුක හා ජෛවරසායන ලක්ෂණ සහ ශ්‍රී ලංකාවේ වගාව ප්‍රචලිත කිරීම සඳහා විවිධ පාරිසරික තත්වයන් හා පරිණත තත්වයන් යටතේ ප්‍රධාන ජලවිච්ඡේදීය ටැනින් ජාන විශ්ලේෂණය)
12-145	Unified Framework for Healthcare Application Integration: Clinic Management Solution for Public Sector Health Service Institutes (සෞඛ්‍යය යෙදවුම් සඳහා අනුමත රාමුවක්, ඒකාබද්ධවීම:රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා ආයතන සඳහා සායනික කළමනාකරණ විසඳුමක්)
13-087	Development of natural adsorbents for heavy metal and textile dye contaminated waste water treatment (බැර ලෝහ හා රෙදිපිළි වර්ණක මගින් දූෂිත ජලය සඳහා ස්වභාවික අවශෝෂකයක් වැඩිදියුණු කිරීම)
15-147	Assessment of efficacy of floating macrophytes Eichhornia crassipes, Salvinia molesta and Pistia stratiotes in controlling nutrient content and heavy metal levels in sludge from common waste treatment plant (CWWTP) – Biyagama - Sri Lanka අපජල පවිත්‍රාගාරයන්හි අවශේෂයන්ගේ පෝෂක හා බැරලෝහ මට්ටට පාලනය කිරීම සඳහා Eichhornia crassipes, Salvinia molesta හා Pistia stratiotes වැනි පාවෙන ශාකයන්හි සඵලත්වය ඇගයුම් කිරීම
15-154	Development of postharvest treatments and a storage strategy for enhancement of postharvest life of lime (Citris aurantfolia swingle) දෙහි පසුඅසුවනු ගබඩා කාලය වැඩිදියුණු කිරීම සඳහා පසු අස්වනු ප්‍රතිකර්ම හා ගබඩා කිරීමේ ක්‍රමෝපාය වැඩිදියුණු කිරීම.
15-020	Enhancement of Shelf life of Fish and Fishery Products by Gamma Irradiation
15-087	Identification of prevalence and pathogens of subclinical mastitis development of an enzyme assay system based on enzymes found in milk for early detection of mastitis.
15-155	Treatment of textile effluents using a combination of chemical and physiochemical process
15-139	Use of King Coconut husk to produce an organic potassium source for agricultural use

ආරම්භක පියවරක් ලෙස NRC විසින් 2020 වසරේදි ඉහත නෝරාගත් ප්‍රදානයන් අතරින් පර්යේෂණ 03ක් සඳහා ඉදිරිපත් කිරීම් (විශේෂයෙන් දැක්වීම) කරනු ලැබූ අතර ඒ පිළිබඳව මගපෙන්වීම හා තවදුරටත් වැඩිදියුණු කිරීම් සඳහා එහිදී ලද පාර්ශවකරුවන්ගේ අදහස් රේඛීය අමාත්‍යාංශය වෙත දන්වනු ලැබිය.

4. 2021 ලෝක විද්‍යා සතිය සැමරීම

කොවිඩ්-19 වසංගත තත්වය හේතුවෙන් මහජන ඒකරාශිවීම් සීමාකරනු ලැබූ බැවින් 2021 ලෝක විද්‍යා සතිය සැමරීම සඳහා ජාතික පර්යේෂණ සභාව විසින් වෙබිනාර් මාලාවක් පවත්වනු ලැබීය. ජාතික පර්යේෂණ සභාව මගින් අරමුදල් සපයනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති මගින් ජනනයවූ නව දැනුම ප්‍රචාරය කිරීම සඳහා වෙබිනාර් සැසි 10ක් පවත්වනු ලැබීය. අදාල පාර්ශවකරුවන් සමග 600කට වැඩි පිරිසක් මේ සඳහා ප්‍රේක්ෂකයින් ලෙස සහභාගි විය.

මුහුදු කුඩැල්ලන් (sea cucumber) සැකසීම හා නිෂ්පාදනය පිළිබඳවූ ප්‍රථම වෙබිනාර් වැඩසටහන 2021 සැප්තැම්බර් 28 දින පැවැත්වූ අතර මුහුදු කැකිරි අපනයනකරුවන්, ධීවර අමාත්‍යාංශයේ හා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් ඇතුළුව 100 දෙනෙක් මේ සඳහා සහභාගි විය.



NATIONAL RESEARCH COUNCIL
CELEBRATING WORLD SCIENCE WEEK 2021

National Webinar Series Starting from 10th November 2021

Moderator **Speakers**

Session 1: Management of diabetes and novel aspects and related research

Date: 10th November, 2021 **Time:** 7:00 P.M. - 8:30 P.M

Join Zoom Meeting: https://learn.zoom.us/j/61531703988?pwd=eG01SVBxNHd4bUxEcjJqeUxZMWpoZz09

Meeting ID: 615 3170 3988 **Passcode:** 42889239


Prof. Hemantha Dodampahala


Prof. Mandika Wijeyaratne


Prof. Prasad Katulanda


Dr. Uditha Bulugahapitiya

Session 2: Sustainable waste management for a greener economy

Date: 11th November, 2021 **Time:** 7:00 P.M. - 8:00 P.M

Join Zoom Meeting: https://us02web.zoom.us/j/84639585190?pwd=SDN3T0JrNnJJL2tSTEFMTVFDUzRtdz09

Meeting ID: 846 3958 5190 **Passcode:** 899321


Prof. Pradeepa Bandaranayake


Prof. Meththika Vithanage


Dr. Anurudda Karunarathna

Session 3: Space Weather and its effects on technological and biological systems on the Earth and in space.

Date: 12th November, 2021 **Time:** 7:00 P.M. - 8:00 P.M

Join Zoom Meeting: https://learn.zoom.us/j/65050635052?pwd=bHpsOEhnMFAzakZBZmpKbUFKbFNVQT09

Meeting ID: 831 8995 2504 **Passcode:** 335974


Prof. Chandana Jayaratne

Session 4: Appropriate interventions to improve the dairy production

Date: 13th November, 2021 **Time:** 7:00 P.M. - 8:00 P.M

Join Zoom Meeting: https://us02web.zoom.us/j/87251306165?pwd=aVVWQ2pKalRiOTgzMlpVSlV1a2tlQT09

Meeting ID: 872 5130 6165 **Passcode:** 044203


Prof. Thakshila Serasinghe


Mr. M.B.P. Kumara Mahipala


Dr. Tilak Weerasinghe


Dr. Rasika Jinadasa

Session 5: Introduction of novel tools and approaches to control dengue vectors in Sri Lanka

Date: 14th November, 2021 **Time:** 7:00 P.M. - 8:00 P.M

Join Zoom Meeting: https://us02web.zoom.us/j/82852859325?pwd=SGovYWc1WGpCV3pvVFpOMWF4UXIHQT09

Meeting ID: 828 5285 9325 **Passcode:** 231537


Prof. Hemantha Dodampahala


Prof. Menaka Hapugoda


Prof. B A H Ranjan Premaratne

Session 6: COVID 19

Date: 15th November, 2021 **Time:** 7:00 P.M. - 8:00 P.M

Join Zoom Meeting: https://us02web.zoom.us/j/82626933415?pwd=OEdUQUdacXk0Wjh6TmVOVWpMd0hVUT09

Meeting ID: 826 2693 3415 **Passcode:** 855579


Prof. Hemantha Dodampahala


Dr. Saman Peduruhewa


Dr. Gaya Katulanda

Session 7: Agriculture Towards the Healthy Nation

Date: 16th November, 2021 **Time:** 7:00 P.M. - 8:00 P.M

Join Zoom Meeting: https://us02web.zoom.us/j/84988001285?pwd=OEorSmJ1VnJ0Q1Y0QVRNU0liSIB3Zz09

Meeting ID: 849 8800 1285 **Passcode:** 726642


Prof. Oscar Amarasinghe


Dr. W.M.W. Weerakoon

Webinars will be conducted in Sinhala and English languages

NRC National Research Council Sri Lanka

SPONSORED BY

Sri Lanka College of Obstetricians & Gynaecologists

Research & Innovation State Ministry of Skills Development, Vocational Education, Research & Innovation

5. **ඩෙංගු වාහකයින් පාලනය සඳහා වඳ පිරිමි මදුරුවන් පිළිබඳ නියමු ක්ෂේත්‍ර පරීක්ෂණය සඳහා දෙවන සුභසාධක ප්‍රදානය පිරිනමන ලදී.**

NRC TO 14-04 - "වාහකයින් පාලනය මගින් ශ්‍රී ලංකාවේ ඩෙංගු පාලනය සඳහා මෙහෙයුම් ආකෘතියක්, ආරක්ෂක නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවන් ඒකරාශි කිරීම පිළිබඳ අංගසම්පූර්ණ පර්යේෂණ යෝජනාවක්"යන මැයෙන් වන ඉලක්ක මත පදනම් බහුවිෂයානුබද්ධ පර්යේෂණ ප්‍රදානය.

6. **ජාතික පර්යේෂණ සභාව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා නව නිපයුම්කරුවන්ගේ කොමිසම විසින් සංවිධානය කරන ලද පේටන්ට් දින වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී.**

ආචාර්ය ප්‍රසංග මන්තිලක ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ සඳහා පේටන්ට් 6ක් සහ වෙනත් පර්යේෂණ ව්‍යාපෘති මගින් පේටන්ට් 6ක් සහිත ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදානයන්හි පර්යේෂණ සහකාරවරයෙකි. මෙම වෙබිනාර් වැඩසටහනෙහිදී නව නිපයුම්කරුවන්ට මෙන්ම පර්යේෂකයින්ට පේටන්ට් හා පේටන්ට් වාණිජකරණය පිළිබඳ නව දැනුම බෙදාහරිනු ලැබීය.



7. **"කිරි ගව පාලනයේදී ප්‍රජනනය හා සත්ව සුභසාධනය පිලිබඳ නවතම සොයාගැනීම්" වසරේ අවසන් වැඩමුළුව ලෙස පවත්වන ලදී.** මෙම වැඩමුළුව සඳහා පාර්ශවකරුවන් සමග 98 දෙනෙකු සහභාගිවිය.




2021 මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්

එන්නත්කරණයේ වැදගත්කම පිළිබඳව මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික ජනමාධ්‍ය ඔස්සේ මහජනයා දැනුවත් කිරීම







By Indika Sri Aravinda

The National Research Council of Sri Lanka (NRC) has approved four vaccines that could curtail the spread of COVID-19 and the new variant of the virus reported recently.

The Council's Chairman Professor Hemantha Dodampahala told ***Colombo Gazette*** that all four vaccines are suitable to be used in Sri Lanka.

He said the NRC has proposed to the Health Ministry to take necessary measures to acquire the most suitable vaccine for the country from the four vaccines.

The AstraZeneca vaccine by the Oxford University, Moderna, Pfizer- Biontech, and Sputnik V by Gamaleya vaccines have been approved by the National Research Council of Sri Lanka.

සායනිකයෙකු හා සාක්ෂි මත පදනම් ප්‍රතිකාර පිළිබඳ පර්යේෂකයෙකු ලෙස 2021.06.15 දින පැවති දොරමඩලාව බුද්ධිමය සංවාදය සඳහා සහභාගි වීම (වැඩසටහනෙහි මාතෘකාව - හෘද රෝග, වකුගඩු රෝග, දියවැඩියාව, ගර්භණීබව සහ කොවිඩ් - 19)





ශ්‍රී ලංකා ප්‍රසව හා නාරීවේදට පිළිබඳව විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතන මගින් සංවිධානය කරන ලද ගර්භණී සමයේදී COVID-19 එන්නත්කරණය පිළිබඳව 2021.06.19 දින පවත්වන ලද වෙබිනාර් වැඩසටහන සඳහා මූල්‍යමය නොවන සම-අනුග්‍රහකත්වය ලබාදීම.



ඇමුණුම I

වාර්ෂික ගිණුම් – 2021

ජාතික පර්යේෂණ සභාව

2022 පෙබරවාරි 28

ජාතික පර්යේෂණ සභාව
120/07, විද්‍යා මාවත, කොළඹ 07
වෙබ් අඩවිය: www.nrc.gov.lk ඊ මේල්: admindesk@nrc.gov.lk

මූල්‍ය ප්‍රකාශනයන්හි සංරචක

මූල්‍ය වර්ෂය - 2021දෙසැම්බර් මාසයෙන් අවසන් වන වසර

- මූල්‍ය තත්ව ප්‍රකාශනය
- මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
- මූදල් ප්‍රවාහ ප්‍රකාශනය
- ශුද්ධ වත්කම්/ සම කොටස් වෙනස්වීමේ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන්	2021 රු.	2020 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදලට සමාන දෑ - NRC		40,163,975.35	22,152,635.55
NRC ණය		618,323.48	267,224.29
TO 14-004 මුදල්		25,000.00	-
T/T සඳහා අත්තිකාරම්		1,195,773.04	1,307,271.37
ජා.ප.ස.කාර්ය මණ්ඩල ණය - ජංගම කොටස	1	639,429.06	571,806.00
TO වැඩසටහන	**2**	144,184,761.72	123,357,981.54
ID ප්‍රදානයන්	**2**	225,853,123.60	207,177,548.48
ජා.ප.ස.PPP වැඩසටහන්	**2**	25,581,285.60	26,978,447.09
EWC ප්‍රදානයන්	**2**	7,891,004.11	10,831,322.48
සුභසාධක ප්‍රදානය	**2**	1,785,618.00	1,440,000.00
RR ප්‍රදානයන්	**2**	881,988.43	1,889,661.67
Asbestos ප්‍රදානයන්	**2**	492,966.90	400.00
වෙනත් මූල්‍ය වත්කම්	**3**	42,150.70	257,478.32
		449,355,399.99	**396,231,776.79**
ජංගම නොවන වත්කම්			
ජා.ප.ස.කාර්ය මණ්ඩල ණය	1	1,611,919.53	1,936,933.32
වෙනත් මූල්‍ය වත්කම්	**4**	1,965,000.00	1,965,000.00
දේපළ, පිරියත හා උපකරණ	**5**	241,103,303.56	282,432,591.49
අස්පෘශ්‍ය වත්කම්	**5**	1,408,335.00	1,083,335.00
ජංගම නොවන වත්කම් එකතුව		**246,088,558.09**	**287,417,859.80**
මුළු වත්කම්		**695,443,958.09**	**683,649,636.60**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	**6**	7,421,030.18	7,735,579.88
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ප්‍රතිපාදන	**8**	1,172,767.50	847,420.00
මුළු වගකීම්		8,593,797.68	8,582,999.88
ශුද්ධ වත්කම්		**686,850,160.41**	**675,066,636.72**
ශුද්ධ වත්කම්/සම කොටස්			
ප්‍රාග්ධන දායකත්වයන්;			
ප්‍රාග්ධන ප්‍රදාන		627,491,157.00	616,550,916.58
සමුච්චිත අතිරික්තයන්/ (හිඟයන්)		59,359,003.40	58,515,720.14
ශුද්ධ වත්කම්/සම කොටස් එකතුව		**686,850,160.41**	**675,066,636.72**

පිටු අංක **06** සිට **11** දක්වා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක **12** සිට **21** දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම ජාතික පර්යේෂණ සභාවේ වගකීමක්වේ. මෙම මූල්‍ය ප්‍රකාශන කවුන්සිලය විසින් අනුමත කරන ලද අතර ඒ වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.

මහාචාර්ය එච්.දොඩම්පහල		**ආචාර්ය එන්. එස්.ජයසේකර**	**ආර්.ඩී.එස්. දිසානායක මයා**
සභාපති/ ජා.ප.ස	**කවුන්සිල සාමාජික**	**ප්‍රධාන විධායක නිලධාරි**	**සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය හා පරිපාලන)**

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2021 රු.	2020 රු.
ආදායම			
පුනරාවර්තන ලැබීම් - ජා.ප.ස.පරිපාලනය	**11**	24,845,000.00	28,565,000.00
ප්‍රාග්ධන ප්‍රදාන	**05**	3,128,109.69	2,796,150.98
පුනරාවර්තන ලැබීම් - පර්යේෂණ හා සංවර්ධන	**10**	160,291,603.52	150,847,150.86
වෙනත් ලැබීම්	**13**	1,895,556.77	1,910,373.56
Asbestos සඳහා ලැබීම්		492,566.90	400.00
මාරුකරනලද මුදල් - ජා.ප.ස.		390,046.39	443,312.11
මුළු ආදායම		**191,042,883.27**	**184,562,387.51**
වියදම්			
පුද්ගල වැටුප්		16,256,820.35	16,159,336.81
පර්යේෂණ හා සංවර්ධන	**14**	111,471,855.03	99,327,502.83
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	**10**	11,354,735.16	10,369,573.70
ක්ෂයවීම් වියදම් - ජා.ප.ස.ප්‍රදානයන්	**5**	48,819,748.49	51,519,648.03
ක්ෂයවීම් - ජා.ප.ස.කාර්යාල උපකරණ	**5**	3,128,109.69	2,796,150.98
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා		572,000.00	647,200.00
මූල්‍ය පිරිවැය		9,820.00	3,750.00
මාරුකරනලද මුදල් - ජා.ප.ස.		390,046.39	443,312.11
මුළු වියදම්		**192,003,135.11**	**181,266,474.47**
පරිපාලින සමාගම් වල අතිරික්ත කොටස			
කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)		(960,251.84)	3,295,913.04
ආරෝපණය කළ හැකි			
පාලනය කරන ආයතනයේ හිමිකරුවන්		(960,251.84)	3,295,913.04
සුළු කොටස්කරුවන්ගේ හිමිකම්		-	-
		(960,251.84)	**3,295,913.04**

*පිටු අංක **06** සිට **21** දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.*

වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන්	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මූදල් ප්‍රවාහ			
ලැබීම්			
බදුකරණය			-
භාණ්ඩාගාරයෙන් ලැබීම් (පුනරාවර්තන)		24,845,000.00	28,565,000.00
භාණ්ඩාගාරයෙන් ලැබීම් (සංවර්ධන සහය)		174,750,000.00	75,200,000.00
අවසන්කරන ලද ප්‍රදානයන් මගින් ලැබීම්		36,002,325.74	32,856,653.86
වෙනත් ලැබීම්	**15**	1,849,144.20	2,078,640.82
ලැබූ පොලිය		104,701.47	72,793.56
ලැබූ චාරිකයන්		837,390.72	530,680.39
වෙනත් ලැබීම් - ණය		-	744,750.00
Asbestos ප්‍රදානයන් සඳහා ලැබීම්		1,833,741.00	-
ගෙවීම්			
සේවකයින් සඳහා මූදල් ගෙවීම්	**16**	(16,833,009.28)	(16,319,702.57)
අවසන් කරන ලද ප්‍රදානයන් සඳහා ගෙවීම්		(8,749,614.11)	-
Asbestos ප්‍රදානයන් වෙත අරමුදල් මාරුකිරීම		(1,650,366.90)	-
පර්යේෂණ ප්‍රදාන හා වෙනත් වැඩසටහන්	**14**	(182,937,635.87)	(109,324,387.37)
කාර්ය මණ්ඩල ණය		(590,000.00)	(1,260,000.00)
වෙනත් ගෙවීම්	**17**	(10,420,733.98)	(11,917,773.09)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මූදල් ප්‍රවාහ		**19,040,942.99**	**1,226,655.60**
ආයෝජන ක්‍රියාකාරකම් මගින් මූදල් ප්‍රවාහ			
පිරියත හා උපකරණ මිළදී ගැනීම		(653,504.00)	(859,885.00)
ආයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මූදල් ප්‍රවාහ		**(653,504.00)**	**(859,885.00)**
මූදල් හා මූදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		18,387,438.99	366,770.60
කාලසීමාව ආරම්භයේ මූදල් හා මූදලට සමාන දෑ		22,419,859.84	22,053,089.24
කාලසීමාව අවසානයේ මූදල් හා මූදලට සමාන දෑ		**40,807,298.83**	**22,419,859.84**

පිටු අංක 06 සිට 21 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.
වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ සම කොටස් වෙනස්වීමේ ප්‍රකාශනය

	සටහන්	සමුච්චිත අතිරික්තය හෝ නැවත ප්‍රකාශිත හිඟය	නැවත ප්‍රකාශිත ප්‍රාග්ධන ප්‍රදාන	මුළු ශුද්ධ වත්කම්/සම කොටස්
		රු.	රු.	රු.
2021/01/01 දිනට ශේෂය		**58,515,720.14**	**616,550,916.58**	**675,066,636.72**
2020 වසරේ ලාභය සඳහා ගැලපීම්				
පෙර වසරේ වියදම් අවලංගු කිරීම	**20**	1,175,281.65	-	1,175,281.65
පෙර වසරේ ක්ෂයකිරීම් සඳහා ගැලපීම්	**21**	628,253.45	-	628,253.45
ගැලපීම් සිදුකරන ලද සමුච්චිත අතිරික්තය		**60,319,255.24**	**616,550,916.58**	**676,870,171.82**
2021 වසර තුළ ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන		-	174,750,000.00	174,750,000.00
2021 වසර සඳහා ආදායමක් ලෙස හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රදාන	**18**	-	(76,414,547.37)	(76,414,547.37)
ප්‍රාග්ධන වත්කම් සම්බන්ධයෙන් ක්ෂය කිරීම හා අපහරණය මත පාඩුව	**19**	-	(87,395,212.21)	(87,395,212.21)
		60,319,255.24	627,491,157.00	687,810,412.25
2021 කාලසීමාව සඳහා අතිරික්තය/(හිඟය)		(960,251.84)	-	(960,251.84)
2021/12/31 දිනට ශේෂය		**59,359,003.40**	**627,491,157.00**	**686,850,160.41**

පිටු අංක 06 සිට 21 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි. වරහන් තුල ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය

අංක 1514/28 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපති නියෝගයක් මත විශේෂ ආයතනයක් ලෙස ඇතිකරනු ලැබූ ජාතික පර්යේෂණ සභාව ("NRC"), 2016 ජූලි 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගත් 2016 අංක 11 දරණ පනත මඟින් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ලෙස ස්ථාපනය කෙරිණි.

ජාතික පර්යේෂණ සභාව, අංක 120/7, විද්‍යා මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටා ඇති රාජ්‍ය ආයතනයකි.

මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් සඳහා පිළියෙල කොට ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපතිතුමන් විසින් නිකුත් කරනු ලැබූ නියෝගයක් අනුව අංක 1514/28 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් දක්වා ඇති ජාතික පර්යේෂණ සභාවේ කාර්යයන්, 2016 ජූලි 29 දිනැති ගැසට් පත්‍රයෙහි පළකරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් 2016 අංක 11 දරණ පනත මඟින් සංශෝදනය කරනු ලැබීය. ප්‍රකාශිත අරමුණු ඉටුකර ගැනීම සඳහා වසර තුල පහත දැක්වෙන ප්‍රධාන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබීය.

පර්යේෂණ ප්‍රදාන සහ ආචාර්ය උපාධි වැඩසටහන

- රාජ්‍ය අංශයේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි පර්යේෂණයන් සහ පශ්චාත් උපාධි අධිශිෂ්‍යත්ව සඳහා මූල්‍යාධාර ලබාදීම. මෙම වර්ෂය තුලදී මෙම වැඩසටහන "අන්වේෂක මත පදනම් වූ පර්යේෂණ ප්‍රදාන වැඩසටහන" වශයෙන් එක් වැඩසටහනක් ලෙස ඒකාබද්ධ කෙරිණි.

විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන

- ශ්‍රී ලාංකීය පර්යේෂකයින් සහ පර්යේෂණ ආයතන සඳහා පිළිගැනීමක් ලබාදීම.

මෙම වසර තුලදී මෙම වැඩසටහනෙහි නාමය "විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන" ලෙස වෙනස් කරණු ලැබිණි.

පෞද්ගලික රාජ්‍ය සහයෝගීතා වැඩසටහන

- ඒකාබද්ධ ප්‍රවේශයක් හරහා පෞද්ගලික අංශයේ/රාජ්‍ය අංශයේ පර්යේෂණ අවශ්‍යතාවයන් මූල්‍යනය කිරීම.

පෞද්ගලික අංශයේ සහයෝගීතා වැඩසටහන හරහා පෞද්ගලික අංශයේ ආයෝජන සිදුකෙරෙන අතර මෙම වර්ෂය තුල රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතා ව්‍යාපෘති අටක් ක්‍රියාත්මකව පැවතුණි. ඒ අනුව, 2021 දෙසැම්බර් 31 දිනට මෙම පෞද්ගලික සහයෝගීතා ගිණුම්වල ශේෂයන් රු. 9,641,202.09 ක් විය.

වෙනත් සංවර්ධන වැඩසටහන්

- ජාතික පර්යේෂණ සභාවෙහි අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් වැඩසටහන්

ඉලක්ක මත පදනම් වූ බහුවිෂයානුබද්ධ විශාල ව්‍යාපෘති වැඩසටහන

ජාතික පර්යේෂණ සභාව සිය මූල්‍යයන ප්‍රතිපත්ති සංශෝධනය කර ඇති අතර ඉලක්ක මත පදනම් වූ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යනය කිරීම සඳහා 2014 වසරේ සිට ප්‍රමුඛත්වය හිමිවනු ඇත. රජයේ විද්‍යාත්මක පර්යේෂණ හා සංවර්ධන ආයතනයන්හි සහ විශ්වවිද්‍යාලයන්හි පර්යේෂණ කණ්ඩායම් වෙතින්, රටෙහි ආර්ථික සංවර්ධනය, සමාජීය සුභසාධනය සහ පාරිසරික තිරසරභාවය අරමුණු කරගනිමින් ජාතික ගැටලු විසඳීම කෙරෙහි යොමුවූ ඉලක්කමත පදනම් වූ බහුවිෂයානුබද්ධ පර්යේෂණ ව්‍යාපෘතීන් මූල්‍යයනය කිරීම සඳහා සෑම වර්ෂයකම පූර්ව යෝජනා කැඳවනු ලැබේ. වසර 5ක කාලසීමාවක් සඳහා පිරිනැමෙන මෙම එක් ප්‍රදානයක වටිනාකම රු. මිලියන 50ක් දක්වා වනු ඇත. ජාතික විද්‍යා තාක්ෂණ ප්‍රතිපත්ති වාර්තාවට අනුකූලව ප්‍රමුඛ ක්ෂේත්‍ර කිහිපයක් වෙතින් යෝජනා කැඳවනු ඇත.

1.2 නිකුත් කිරීම සඳහා අවසරය ලබාදෙන දිනය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික පර්යේෂණ සභාවෙහි මූල්‍ය ප්‍රකාශනයන් නිකුත් කිරීම සඳහා කවුන්සිලයේ සාමාජිකයින්ගේ අනුමැතිය ඇතිව පර්යේෂණ සභාවේ සභාපති, ප්‍ර.වි.නි හා ගණකාධිකාරිවරයා විසින් 2022/04/22 දින අවසර ලබාදෙන ලදී.

2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව පිළියෙල කර ඇත.

2.1.1 අනුකූලතා ප්‍රකාශය

ජාතික පර්යේෂණ සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) වලට අනුකූලව පිළියෙල කර ඇත.

2.1.2 අඛණ්ඩ පැවැත්ම

ජාතික පර්යේෂණ සභාවට පුරෝකථනය කරන ලද අනාගතයක් සඳහා සිය ක්‍රියාකාරකම්හි අඛණ්ඩව නියැලීමට අවශ්‍ය පමණ සම්පත් ඇති බවට කවුන්සිලය සෑහීමකට පත්වී ඇත. තවද, සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් පිළිබඳව සභාවේ කවුන්සිල සාමාජිකයන් දැනුවත් වී නොමැත.

2.1.3 මැනීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙලකර ඇති අතර මෙම ගිණුම් සඳහා බලපාන උද්ධමන සාධකයන් සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නැත.

2.1.4 මෙහෙයුම් හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ජාතික පර්යේෂණ සභාවෙහි මෙහෙයුම් මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර වෙනත් ලෙසකින් දක්වා නොමැත්තේ නම් ආසන්න සතයට දක්වනු ලැබේ.

2.4 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්

මූල්‍ය තත්වය ප්‍රකාශනයන්හි දක්වා ඇති යම් යම් ධාරණ අගයන් මැනීමේදී සිදුකරන ලද උපකල්පනයන්ට හා ඇස්තමේන්තුවලට මූල්‍ය ප්‍රකාශනයන් සංවේදී වේ වන අතර ප්‍රමාණයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වේ. මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් මගින් අනාවරණය කර ඇති වත්කම් සහ බැරකම්වල ධාරණ අගයන් සඳහා ප්‍රමාණාත්මක ගැලපීම් සිදුවීමේ සැලකිය යුතු අන්දමේ අවදානමක් මෙමඟින් ප්‍රතිඵල වනු ඇත.

ශ්‍රීලරාඅගිප්‍ර (SLPSAS)ට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම සහ වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් ලෙස වාර්තා කළ අගයන්ට බලපාන විවිධ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනය කිරීම අවශ්‍යවේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ යම් යම් තත්ත්වයන් මත සාධාරණයයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළත් වූ වෙනත් සාධක මත පදනම්වේ. එබැවින්, සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵලයන් මෙම විනිශ්චයන් සහ ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදකවූ උපකල්පනයන්, සිදුකෙරෙමින් පවතින පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම් ඇස්තමේන්තු සඳහා සිදුකරනු ලබන සංශෝධනයන්, එම සංශෝධනය සිදුකරනු ලබන කාලසීමාව සඳහා හා කිසියම් අනාගත කාලසීමාවන් සඳහා පමණක් බලපාන්නේ නම්, එම කාලසීමාව තුළ හඳුනා ගැනේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි සාරාංශය

පහත දැක්වෙන සියළු ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂය හා අනුරූප වේ.

සමහර සංසන්දනාත්මක තොරතුරු වර්තමාන වර්ෂයේ තොරතුරුවලට අනුකූලවීම සඳහා අවශ්‍ය විටක නැවත වර්ගීකරණය කර ඇත.

3.1 විදේශ මුදල් පරිවර්තනය

සියළු විදේශ මුදල් ගනුදෙනු, ගනුදෙනුව සිදුවන දින පැවති විනිමය අනුපාතිකයට මෙහෙයුම් කරන ලද මුදල් වර්ගයට පරිවර්තනය කර ඇත.

3.2 වත්කම් හා ඒවා තක්සේරු කිරීමේ පදනම

සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ වාර්තා කරන දින සිට අවුරුද්දක් තුළ යන දෙකෙන් කෙටි කලකදී උපලබ්දි වීම

අපේක්ෂා කළහැකි මුදල් හා බැංකු ශේෂයන් වත්කම් වර්ගීකරණයේදී ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

3.2.1 දේපළ, පිරියත හා උපකරණ

3.2.1.1 මූලික හඳුනාගැනීම

දේපළ, පිරියත හා උපකරණ වල සියලුම අයිතම පිරිවැයෙන් සම්මුචිත ක්ෂයකිරීම් අඩුකළ අගයට මනිනු ලැබේ. ඒවා මූලිකව පිරිවැයට හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීමේ පිරිවැය හෝ වත්කම් අත්පත් කරගැනීමට හෝ ඉදිකිරීමට සෘජුවම දරණ ලද ආනුශංගික පිරිවැය හා යම් වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒමට හා එම වත්කම් කොටස් කිරීම හා පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඇතුලත්වේ. මීට අමතරව ජා.ප.ස. මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම හේතුවෙන් ගෙවීම් ඉවතලෑම/ප්‍රතික්ෂේප කිරීම සිදුවිය හැකි බැවින් වත්කම් පෙර දිනයක අත්පත්කරගෙන තිබුණද, වත්කම් මිලදී ගැනීමේ දිනය නොසළකා අදාල ආයතනයට ගෙවීමකළ දිනය ජා.ප.ස. විසින් වත්කම් මිලදීගැනීමේ දිනය ලෙස හඳුනාගනු ලැබේ. යම් දේපළ, පිරියත හා උපකරණ කොටස් සඳහා විවිධ ප්‍රයෝජනවත් ආයු කාලයන් ඇති අවස්ථාවන්හිදී ඒවා වෙනම දේපළ, පිරියත හා උපකරණ අයිතම ලෙස ගිණුම් ගත කරනු ලැබේ.

ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන මගින් මිලදී ගන්නා දේපළ, පිරියත හා උපකරණ වත්කම් පවරාදෙන තෙක් හෝ අපහරණය කරන තෙක් ජාතික පර්යේෂණ සභාවේ දේපළ, පිරියත හා උපකරණවල කොටසක් ලෙස තාවකාලිකව හඳුනා ගැනේ.

පහත 3.2.1.3හි විශේෂයෙන් දක්වා ඇති පදනම මත සමුච්චිත ක්ෂය කිරීම් ගණනය කෙරේ.

3.2.1.2. තදනන්තර වියදම්

දේපළ, පිරියත හා උපකරණ වල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන වියදම, එම කොටස මගින් ජාතික පර්යේෂණ සභාවට/ ජාතික පර්යේෂණ සභා ප්‍රදානයන්ට අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාවක් ඇතිනම් හා එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකිනම් එම අයිතමයේ ධාරණ අගය තුල හඳුනාගනී. මෙයට මූලික පරීක්ෂා කිරීම් හා පිළිසකර කිරීම් සඳහා වන වියදම් ඇතුලත්වන අතර වෙනම ගිණුම්ගත කෙරේ.
දේපළ, පිරියත හා උපකරණ එදිනෙදා සේවා කිරීම සඳහා පිරිවැය දරන ආකාරය අනුව ලාභ හා පාඩු ලෙස හඳුනා ගැනේ.

මූලිකව තක්සේරු කරනු ලැබූ කාර්යසාධන ප්‍රමිතිය මඟින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රතිස්ථාපනය හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත හා උපකරණ අළුත්වැඩියා හෝ නඩත්තු කිරීම ඇතුලත් වෙනත් සියලු වියදම් සිදුකරනු ලැබූ විට වියදමක් ලෙස හඳුනාගැනේ.

3.2.1.3 ක්ෂය කිරීම

එකී වියදම් ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුල කපාහැරීම සඳහා ක්ෂය කිරීම් ස්ථාවර වත්කම් වල පිරිවැය මත ගණනය කරන ලද ලාභ හා පාඩු තුල හඳුනා ගැනේ.

වත්කම් භාවිතය සඳහා ලබාගත හැකි දින සිට ඒවායේ ඇස්තමේන්තුගත ආයුකාලය මත සෘජු රේඛා පදනමින් ලාභ හා අලාභ ගිණුමේ ක්ෂයකිරීම් හඳුනා ගනු ලැබේ. තවද, යම් උපකරණයක භාවිතයට සූදානම් නිශ්චිත දිනය හඳුනාගැනීමට ප්‍රායෝගිකව අපහසු බැවින් මෙන්ම ජා.ප.ස. මාර්ගෝපදේශ සියල්ල සපුරාලීම සිදුනොකර එය උපකරණයක් ලෙස සළකනු නොලැබීම හා ගෙවීම සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප විය හැකි බැවින් ප්‍රදානයන්ගෙන් මිලටගත් භාණ්ඩ සඳහා ගෙවීම් සිදුකළ දිනය ඒවා මිලදී ගත් දිනය ලෙස ජා.ප.ස. විසින් හඳුනා ගනු ලැබේ.

ජා.ප.ස. විසින් වත්මන් හා සන්සන්දනාත්මක කාලසීමාවන් සඳහා සාමාන්‍යයෙන් භාවිතාකරන ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය හා වාර්ෂික ක්ෂයකිරීම් ප්‍රතිශතයන් පහත පරිදිවේ:

විවිධ වත්කම්	වසර 2	50.00%
හැඳි ගෑරුප්පු හා පිහන් කෝප්ප	වසර 3	33.33%
කාමර තිර රෙදි	වසර 3	33.33%
ආරක්ෂක උපකරණ	වසර 3	33.33%
පුස්තකාල පොත්	වසර 3	33.33%
පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා උපාංග	වසර 5	20.00%
ගණක යන්ත්‍ර හා ඔරලෝසු	වසර 5	20.00 %
බල සැපයුම් උපකරණ	වසර 5	20.00 %

පිත්තල අයිතම	වසර 5	20.00 %
මෝටර් වාහන	වසර 5	20.00 %
වායු සම්කරණ යන්ත්‍ර/ සේප්පු	වසර 05	20.00 %
ගොඩනැගිලි	වසර 10	10.00 %
පුළුල්කළ හැකි වත්කම්	වසර 10	10.00 %
යන්ත්‍රෝපකරණ හා මෙවලම්	වසර 10	10.00 %
කාර්යාල උපකරණ	වසර 10	10.00 %
ශීතකරණ	වසර 10	10.00 %
CCTV පද්ධති	වසර 5	20.00 %
අස්පෘශ්‍ය වත්කම්	වසර 4	25.00%
ADSL අන්තර්ජාල	වසර 1	100.00%
කොක්සියල් කේබල්	වසර 4	25.00%
MIDAS FEA මෘදුකාංගය	වසර 4	25.00%
Wi-Fi ප්‍රවේශය (Access Point)	වසර 4	25.00%

පර්යේෂණ ප්‍රදානයන් මඟින් මිලදී ගත් දේපළ, පිරියත හා උපකරණ වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයුකාලය ඒවා පවරනු ලබනතෙක් හෝ අපහරණය කරනතෙක් පහත සඳහන් ප්‍රයෝජනවත් ආයුකාලයන් හා ප්‍රතිශතයන්ගෙන් ක්ෂය කෙරේ.

රසායනාගාර උපකරණ (1 කාණ්ඩය)	වසර 10	10%
රසායනාගාර උපකරණ (2 කාණ්ඩය)	වසර 5	20%

ක්ෂය කිරීමේ ක්‍රම, ප්‍රයෝජනවත් ආයු කාලය හා අවශේෂ වටිනාකම් වාර්තා කරන දිනයට යලි තක්සේරු කරනු ලැබේ. මිලදී ගැනීමේ/පවරාදීමේ/අපහරණය කිරීමේ දිනය පදනම්ව ක්ෂයකිරීම් ගණනය කිරීමේ ප්‍රතිපත්තිය වෙනස්වී ඇති අතර 2019 මුදල් වර්ෂයේ සිට ක්‍රියාත්මක නව ක්ෂයකිරීමේ ප්‍රතිපත්තිය අනුව සියලුම ස්ථාවර වත්කම් සඳහා මිලදීගත් දිනය හා අපහරණ/පවරන ලද කළ දින නොසලකා සම්පූර්ණ මාසය සඳහා අපහරණය වෙන් කර ඇත.

3.2.1.2. ශේෂ පත්‍රයෙන් කපාහැරීම

අපහරණය කිරීම හෝ එහි භාවිතය හෝ අපහරණය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා කළ නොහැකි විටදී දේපළ, පිරියත හෝ උපකරණවල ධාරණ අගය හෝ කිසියම් තදනන්තර පිරිවැයක් ශේෂ පත්‍රයෙන් කපාහැරේ. එලෙස වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම තුලින් (අපහරණය මගින් ලද මුදල් හා වත්කම්හි ධාරණ අගයන් අතර වෙනස ලෙස ගණනය කරනු ලැබූ) පැනනගින ලද ලාභ සහ පාඩු, ලාභ හා පාඩු ලෙස හඳුනාගනු ලැබේ. වසරේදී වත්කම් ශේෂ පත්‍රයෙන් කපාහරිනු ලබන අතර ලාභය ආදායම් ලෙස වර්ගීකරණය කරනු නොලැබේ.

3.2.2. අස්පෘෂ්‍ය වත්කම් සහ ක්‍රමක්ෂය

ජාතික පර්යේෂණ සභාවට අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කළ හැකි නම් හා එහි පිරිවැය විශ්වාසදායී ලෙස මැනිය හැකි නම් එම වත්කම් අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගනී. මෙම වත්කම් පිරිවැයෙන් සම්මුවිත ක්‍රමක්ෂය අඩුකළ අගයට ශේෂ පත්‍රයේ දක්වනු ලැබේ. අස්පෘෂ්‍ය වත්කම් ඒවා භාවිතයට සූදානම් දින සිට ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරා ක්‍රමක්ෂය සෘජු රේඛීය ක්‍රමයට ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

3.2.3. භාණ්ඩ තොග

තොග ඓතිහාසික පිරිවැය පදනමට මනිනු ලැබේ.

3.2.4. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ ඒවායේ ඇස්තමේන්තුගත උපලබ්ධි කළ හැකි ප්‍රමාණයන් අනුව දක්වනු ලැබේ.

3.2.5. ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදාන

වසර ගණනාවක් පුරා ප්‍රදානය කළ පර්යේෂණ ප්‍රදානයන්ගේ සමුච්චිත මුළු එකතුව ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානයන්ගෙන් නියෝජනය වේ.

ජාතික පර්යේෂණ සභා ප්‍රදානයන්ගෙන් දරණ වියදම් එම වත්කම් හුවමාරු කරන හෝ අපහරණය කරන තෙක් එම දේපළ, පිරියත හා උපකරණ වල කොටසක් ලෙස හඳුනා ගනු ලබන අවස්ථාවේ ඒවා අත්පත් කරගැනීම්, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුව දායකවන ප්‍රමාණයට හැර එම වියදම් දරණ ලද කාලසීමාව තුල වියදමක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

පර්යේෂණ ප්‍රදානයන් සඳහා ලැබෙන අරමුදල් සෘජුවම සම්මුවිත අරමුදලට ප්‍රාග්ධනිත කෙරෙන අතර වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා දරන ලද වියදම් හැර අනෙක් වියදම් එම වියදම් දරනලද වසරේ ආදායම් ප්‍රකාශයේ දැක්වේ.

දරනලද වියදම් ලෙස හඳුනාගනු ලබන ජාතික පර්යේෂණ සභාවේ ප්‍රදානයන්ගේ වියදම්, එම වියදම් හඳුනාගනු ලැබූ අදාල කාලසීමාව තුල ආදායමේ පුනරාවර්තන ලැබීම් වල කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

දැනට පවතින Covid 19 වසංගතය සඳහා ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම සඳහා ඉක්මන් ප්‍රතිචාර (RR) ප්‍රදානයන් නමින් නව ප්‍රදාන යෝජනා ක්‍රමයක් හඳුන්වාදෙනු ලැබීය.

3.3 වගකීම්

ඉල්ලීම මත හෝ වාර්තාකරනු ලබන දින සිට වසරක් තුල ගැනෙන ගෙවිය යුතු වගකීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කෙරේ. වාර්තාකරන දින සිට වසරකට වැඩි කාලයකට පසුව ගෙවිය යුතු ශේෂයන් ජංගම නොවන වගකීම් වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, හඳුනාගත් සියලු වගකීම් ශේෂ පත්‍රයේ දිනට ගිණුම්ගත කර ඇත. මීට අමතරව 2019 වසරේ සිට බලපැවැත්වෙන පරිදි [ශ්‍රීලරාඅගිප්‍ර (SLPSAS) අංක 61 (අ)අනුව] මූල්‍ය ප්‍රකාශනයන්හි සත්‍ය හා සාධාරණ දැක්ම තත්වය පෙන්නුම් කිරීම සඳහා ඉදිරි මූල්‍ය වසරේ සේවක ඉපයීම් පදනම්ව විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

3.3.1. සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් මණ්ඩලය

අදාල ව්‍යවස්ථාවන්ට හා නීතිරීති වලට අනුකූලව, සේවකයින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය සඳහා දායකත්වයන්ට සුදුසුකම් ලබයි. මෙම අඩුකිරීම් දරනලද වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ .

පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේදී දළ සේවක වැටුපෙන් EPF දායකත්වය සඳහා අඩුකිරීම් පිළිවෙලින් 12% හා 8% සිට පහත පරිදි වැඩිකරනු ලැබීය.

සේව්‍යයා	15%
සේවකයා	10%

දළ වැටුපෙන් ETF සඳහා අඩුකිරීම පහත පරිදිවේ:

සේව්‍යයා	3%

3.3.2. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ

වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ ඒවායේ පිරිවැයට දක්වනු ලැබේ.

3.4. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය (ආදායම් ප්‍රකාශය) ඉදිරිපත් කිරීම සඳහා වියදමේ ස්වභාවය අනුව දැක්වීමේ ක්‍රමය යොදා ගනී.

2021 මූල්‍ය වර්ෂය තුළදී උපකරණ මාරුකිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කර ඇති උපකරණ මාරුකිරීමේ අගය මත පාඩුව රු. 15,719,692.10 සිට රු. 34,704,257.66 දක්වා වැඩිවීම හේතුවෙන් ජා.ප.ස ආදායම් ප්‍රකාශයේ රු. 960,251.81ක පාඩුවක් පෙන්නුම් කරයි. එසේවුවද, 2021 මුදල් වසර තුළ අනෙකුත් පර්යේෂණ හා අදාල වියදම්වල අඩුවීමක් පෙන්නුම්කර ඇත.

3.4.1 ආදායම

සමාලෝචනයට ලක්වන වසර තුල ජා.ප.ස. පරිපාලනයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලැබෙන ප්‍රදානයන් පිළිවෙලින් ආදායම් ප්‍රකාශය හා සම්මුවිත අරමුදල සඳහා හඳුනාගනී. ජා.ප.ස. පර්යේෂණ ප්‍රදානයන් මගින් දරන වියදම් එම වියදම් හඳුනා ගැනෙන අදාල කාල සීමාව සඳහා උපකරණවල වාර්ෂික ක්ෂයවීම් සහ පර්යේෂණ මධ්‍යස්ථාන වෙත උපකරණ පවරාදීමේදි වන පාඩු ආදායම් හඳුනාගන් ලැබූ අදාල කාලසමාවන්හිදී පුනරාවර්තන ආදායමෙහි ලැබීම් වල කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.
අදාල ආයතනයන්හි මූල්‍යමය මාර්ගෝපදේශයන්ට අනුගතව එම ආයතනයන්ට මාරුකර ඇති බැවින් 2021 කාලසීමාව තුළ අමාත්‍යාංශයේ ඇස්බැස්ටස් ප්‍රදාන සඳහා ලැබීම් ආදායමෙන් ප්‍රත්‍යාවර්තනය කර ඇත. කෙසේවුවද, කාලසීමාව අවසානයේදී ජාතික පර්යේෂණ සභාව සතුව මාරුකිරීම සිදුනොකළ හෝ වියදම් නොදරන ලද රු. 492,966.90 ක ශේෂයන් පැවතිණ.

අපහරණය හෝ මාරුකිරීම මත දේපළ පිරියත හා උපකරණයක අයිතම මත පාඩුව දේපළ පිරියත හා උපකරණයන්හි ධාරන අගය සමග ශුද්ධ අලෙවිය හෝ මාරුකරන ලද මුදල් සංසන්දනය කිරීමෙන් තීරණය කරන අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ පාඩුවක් ලෙස හඳුනාලනු ලබන අතර මූල්‍ය තත්ව ප්‍රකාශයේ මෙහෙයුම්වල සත්‍ය ස්වරූපය

පිළිබිඹු කිරීම සඳහා ආදායම සඳහා ඇති බලපෑම ආදායමක් ලෙස හඳුනා ගැනේ. ලාභයන් ඒ ආකාරයෙන් ගැළපුම් කරනු ලැබේ.

3.4.2. වියදම

ජාතික පර්යේෂණ සභාව මෙහෙයුම් සඳහා දරන ලද සෑම වියදමක්ම වසරේ ලාභය/ අලාභය හඳුනාගැනීමේදී ආදායමට ගනු ලැබේ. අඵත්වැඩියාවන් හා අඵත්කිරීම් අදාල වියදම දරන ලද වසරේ ලාභය/ අලාභයට ඇතුලත් කෙරේ. ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ප්‍රදාන මඟින් දරන වියදම් ද එම දේපළ, පිරියත හා උපකරණයන්හි කොටසක් සේ හඳුනාගන්නා අවස්ථාවන්හිදී එම වත්කම් අත්පත් කරගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය සඳහා සෘජුවම බලපාන ලද ප්‍රමාණය හැර එම වියදම් දරන ලද කාලය සඳහා ආදායම් ප්‍රකාශයේ පර්යේෂණ හා සංවර්ධන වියදම් ලෙස හඳුනා ගැනේ.

විදේශ මුදල් ගනුදෙනු පරිවර්තනය තුලින් වන ලාභ හා අලාභයන්ගෙන් සමන්විත මූල්‍ය ආදායම් හා වියදම් එම වියදම් දරන ලද අවස්ථාවේදී ලාභ හා අලාභ ලෙස හඳුනාගනී.

කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගැනේ. අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනාගැනේ.

3.5. ශේෂ පත්‍ර දිනෙන් පසුව සිද්ධීන්

ශේෂ පත්‍ර දිනෙන් පසුව වන සියලු ප්‍රමාණාත්මක සිද්ධීන් පිළිබඳව සලකා බලන ලද අතර මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන්වල සුදුසු පරිදි ගැලපුම් කිරීම් හා හෙළිදරව් කිරීම් සිදු කරන ලදී.

3.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

සෘජු ක්‍රමය යොදාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබේ.

සටහන: 1 **ජා.ප.ස.කාර්ය මණ්ඩල ණය - ජංගම හා දිගු කාලීන කොටස**

සේවකයාගේ නම	ගෙවීමට ඉතිරිව ඇති ප්‍රමාණය	ජංගම කොටස	දිගු කාලීන කොටස
NRC ණය:ඒ. ඊ. කේ. දයාරත්න	139,834.10	50,614.68	89,219.42
NRC ණය:ඒ.කේ.ඩී.එම්. පෙරේරා	176,426.54	49,047.87	127,378.67
NRC ණය:එම්.ඒ.කේ. එල්. පෙරේරා	208,001.12	47,695.91	160,305.21
NRC ණය:කේ.කේ.ටී. සඳරුවන්	139,834.10	50,614.68	89,219.42
NRC ණය:කේ.එන්.කේ. දිසානායක	176,426.54	49,047.87	127,378.67
NRC ණය:එම්.ඩී.ටී.මධුෂානි	164,356.68	49,564.68	114,792.00
NRC ණය:එම්.එස්. සෙව්වන්දි	176,426.54	49,047.87	127,378.67
NRC ණය:ආර්. බී. එස්. දිසානායක	139,834.10	50,614.68	89,219.42
NRC ණය: එස්. එච්. එස්. ප්‍රියංකර	139,834.10	50,614.68	89,219.42
NRC ණය: එස්. එස්.කටුගම්පල	139,834.10	50,614.68	89,219.42
NRC ණය:ඩබ්.ඩී.ටී.ඩී.වික්‍රම	204,102.39	47,862.84	156,239.55
NRC ණය:ඩබ්.ඩී.පී.ප්‍රියදර්ශන	200,190.02	48,030.36	152,159.66
NRC ණය:ඩබ්.එස්.ඩී.පෙරේරා	246,248.27	46,058.24	200,190.03
එකතුව	**2,251,348.60**	**639,429.06**	**1,611,919.54**

සටහන: 2 **ජා.ප.ස. අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන, ඉලක්කමත පදනම් බහුවිෂයානුබද්ධ ප්‍රදාන වැඩසටහන, රාජ්‍ය පෞද්ගලික සහයෝගීතා වැඩසටහන, EWC ප්‍රදානයන්, Asbestos ප්‍රදානයන්, සුභසාධක ප්‍රදානයන් සහ ඉක්මන් ප්‍රතිචාර ප්‍රදානයන්.**

අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන	2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	
	බැංකුව	මුදල්
12-114	-	20,000.00
15-028	-	20,000.00
15-057	-	25,000.00
16-098	-	20,000.00
16-128	-	25,000.00
17-10	1,089,317.55	-
17-74	450,021.36	-
17-94	1,646,449.76	6,774.40
18-05	140,552.05	-
18-08	1,154,299.49	-
18-32	630,517.36	-
18-44	3,974,558.02	-
18-83	-	25,000.00
18-84	2,990,825.00	-
18-91	621,252.86	-
19-05	4,018,201.02	65,629.77
19-06	3,738,988.00	-
19-07	4,019,858.18	-
19-19	881,796.00	-
19-24	4,487,600.00	-
19-28	1,502,887.56	-
19-30	2,968,577.09	-
19-32	690,500.00	-
19-33	1,795,956.36	-

අන්වේෂක මත පදනම් වූ ප්‍රදාන	2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	
	බැංකුව	මුදල්
12-114	-	20,000.00
15-028	-	20,000.00
15-057	-	25,000.00
15-070	-	510.00
16-078	-	25,000.00
16-087	-	20,000.00
16-098	-	20,000.00
16-128	-	25,000.00
17-06	709,466.61	-
17-08	673,217.10	-
17-10	1,691,886.62	-
17-11	-	25,000.00
17-18	2,169,926.88	-
17-20	651,872.27	-
17-25	1,624,044.05	-
17-28	1,557,780.60	-
17-29	632,179.40	-
17-33	1,449,774.45	-
17-38	1,565,424.57	-
17-42	1,548,174.33	10,000.00
17-54	1,323,481.17	-
17-58	227,897.10	-
17-69	1,282,070.66	-
17-72	670,600.00	-

19-40	2,770,520.25	-		17-74	1,003,762.76	-
19-45	1,120,985.00	-		17-86	3,531,054.35	-
19-46	1,492,925.04	-		17-94	2,082,502.36	6,774.40
19-50	1,547,847.83	-		17-95	589,419.22	-
19-51	819,272.40	-		17-98	1,603,467.41	-
19-52	2,579,022.60	-		18-05	140,552.05	-
19-54	5,965,092.36	-		18-07	357,469.55	-
19-60	4,475,000.00	-		18-08	1,746,888.69	-
19-61	750,302.37	-		18-09	461,817.32	-
19-62	1,285,957.74	-		18-12	1,298,124.81	-
19-64	4,165,000.00	-		18-13	1,682,183.72	-
19-65	2,881,840.62	22,127.00		18-28	304,387.12	-
19-72	4,313,250.56	-		18-30	897,606.71	-
19-75	1,441,115.00	20,000.00		18-32	1,576,401.50	-
19-80	1,222,304.00	-		18-44	4,044,558.02	-
19-81	2,098,297.05	52,500.00		18-50	80,679.82	-
19-89	944,389.68	-		18-57	-	7,710.00
19-90	1,675,130.36	-		18-66	659,277.42	-
19-92	2,295,007.90	-		18-79	1,247,242.21	-
19-95	370,249.10	-		18-80	2,270,000.00	-
19-99	2,981,375.51	-		18-83	1,035,924.78	-
20-005	5,000,000.00	-		18-84	2,990,825.00	-
20-007	2,306,116.72	-		18-88	1,156,489.31	-
20-010	2,615,838.80	-		18-91	1,844,520.64	-
20-011	5,000,000.00	-		18-94	505,795.65	-
20-012	5,000,000.00	-		19-05	4,490,542.11	579.68
20-014	749,210.60	-		19-06	4,824,226.97	-
20-022	4,940,390.00	-		19-07	5,000,000.00	-
20-028	5,000,000.00	-		19-19	1,448,796.00	-
20-031	4,792,500.00	-		19-24	4,737,600.00	-
20-038	5,000,000.00	-		19-28	4,064,932.76	-
20-039	4,000,000.00	-		19-30	5,120,426.72	-
20-047	5,000,000.00	-		19-32	1,410,500.00	-
20-051	4,465,599.00	-		19-33	3,304,573.32	25,000.00
20-055	5,000,000.00	-		19-40	4,293,839.81	-
20-066	1,501,000.00	-		19-45	1,807,306.18	100,000.00
20-073	4,680,295.00	15,000.00		19-46	2,703,614.54	-
20-074	1,110,390.28	-		19-50	2,493,944.62	-
20-078	4,324,000.00	-		19-51	1,692,981.44	-
20-079	4,962,600.00	-		19-52	4,519,410.00	-
20-080	3,390,000.00	-		19-54	7,601,900.00	125,000.00
20-083	2,415,000.00	-		19-58	1,758,387.20	-
20-085	2,207,846.00	-		19-60	4,960,000.00	-
20-086	2,450,000.00	-		19-61	994,270.00	-
20-089	4,999,400.00	-		19-62	2,657,512.00	600.00
20-098	5,000,000.00	-		19-64	4,910,000.00	-
20-104	5,000,000.00	-		19-65	4,052,930.55	22,725.00
20-107	4,846,000.00	-		19-72	6,994,705.60	-
20-108	3,215,000.00	-		19-75	2,602,205.30	20,000.00
20-109	4,668,500.00	-		19-80	2,002,304.00	-
20-110	4,992,000.00	-		19-81	3,262,891.85	11,765.00
20-113	3,026,250.00	-		19-89	2,043,878.92	25,000.00

20-115	4,382,500.00	-
20-117	1,735,000.00	25,000.00
20-118	4,875,000.00	-
20-123	2,814,838.76	-
20-124	1,622,000.00	-
20-128	4,426,774.24	-
	225,511,092.43	**342,031.17**
එකතුව	**225,853,123.60**	

19-90	2,961,697.16	-
19-92	3,979,193.60	-
19-95	1,061,166.52	-
19-099	4,505,766.00	
20-007	3,330,200.00	-
20-010	3,539,900.00	-
20-014	900,000.00	-
20-039	4,000,000.00	-
20-066	3,250,000.00	-
20-074	3,708,500.00	-
20-078	4,324,000.00	-
20-080	3,510,000.00	-
20-083	2,440,000.00	-
20-085	3,294,035.00	-
20-086	3,000,000.00	-
20-108	3,215,000.00	-
20-117	2,240,000.00	-
20-123	3,440,000.00	-
20-124	3,300,000.00	-
	206,641,884.40	**535,664.08**
එකතුව		**207,177,548.48**

ඉලක්ක මත පදනම් (TO) ප්‍රදානයන්

TO වැඩසටහන	2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	
	බැංකුව	මුදල්
14-004	-	-
14-010	-	4,320.00
14-018	22,926,873.96	-
14-024	-	-
16-007	13,388,239.87	-
16-015	4,659,196.81	-
16-018	4,245,872.35	70,000.00
18-021	13,847,576.89	78,944.00
20-019	43,957,426.76	-
SP 21-01	35,100,000.00	-
SP21-02	5,906,311.08	-
	144,031,497.72	**153,264.00**
එකතුව		**144,184,761.72**

TO වැඩසටහන	2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	
	බැංකුව	මුදල්
14-004	-	25,000.00
14-010	-	4,320.00
14-018	27,431,296.96	20,000.00
14-024	3,908,625.33	-
16-007	16,159,725.17	-
16-015	25,886,997.34	1,499.00
16-018	5,462,957.85	100,000.00
18-021	20,873,615.89	3,944.00
20-019	23,480,000.00	-
	-	-
	-	-
	123,203,218.54	**154,763.00**
එකතුව		**123,357,981.54**

Asbestos ප්‍රදානයන්

Asbestos වැඩසටහන	2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	
	බැංකුව	මුදල්
එකතුව	**492,966.90**	-

Asbestos වැඩසටහන	2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	
	බැංකුව	මුදල්
එකතුව	**400.00**	-

PPP ප්‍රදානයන්

රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා වැඩසටහන	**2021** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
16-003	622,181.80	-
16-007	34,351.72	-
17-003	912,437.75	-
18-001	1,188.52	-
18-002	55,004.07	-
18-007	2,252,743.49	-
19-004	17,228,378.25	-
20-001	4,475,000.00	-
එකතුව	**25,581,285.60**	**-**
එකතුව		**25,581,285.60**

රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා ප්‍රදානයන්	**2020** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
16-003	622,181.80	-
16-007	34,351.72	-
17-001	137,180.05	-
17-003	1,032,437.75	-
18-001	241,048.52	-
18-007	2,251,062.49	25,000.00
18-002	3,101,156.51	-
19-004	19,534,028.25	-
	26,953,447.09	**25,000.00**
එකතුව		**26,978.447.09**

EWC ප්‍රදානයන්

EWC වැඩසටහන	**2021** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
18-02	2,259,402.80	-
18-03	904,781.28	-
18-04	2,339,265.23	-
18-05	2,362,554.80	25,000.00
	7,866,004.11	**25,000.00**
එකතුව		**7,891,004.11**

EWC වැඩසටහන	**2020** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
18-02	2,259,402.80	-
18-03	1,413,984.60	-
18-04	4,759,244.28	-
18-05	2,398,690.80	-
	10,831,322.48	**-**
එකතුව		**10,831,322.48**

OR ප්‍රදානයන්

OR ප්‍රදාන	**2021** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
20-001	1,380,000.00	-
21-001	405,618.00	-
එකතුව		**1,785,618.00**

OR ප්‍රදාන	**2020** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
OR	1,440,000.00	-
	එකතුව	**1,440,000.00**

RR ප්‍රදානයන්

RR ප්‍රදාන	**2021** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
	839,988.43	42,000.00
එකතුව		**881,988.43**

RR ප්‍රදාන	**2020** දෙසැම්බර් **31** දිනට ශේෂය	
	බැංකුව	මුදල්
	1,847,661.67	42,000.00
	එකතුව	**1,889,661.67**

N-03 වෙනත් ජංගම මූල්‍යමය වත්කම්

	2021 රු.	2020 රු.
උත්සව අත්තිකාරම්	20,000.00	10,000.00
ලැබිය යුතු නිෂ්පාදන භාගය	13,428.00	234,592.00
රක්ෂණ අත්තිකාරම්	8,507.70	12,886.32
වෙනත් වත්කම්	215.00	-
එකතුව	**42,150.70**	**257,478.32**

N-04. වෙනත් මූල්‍යමය වත්කම්

	2021 රු.	2020 රු.
ගොඩනැගිලි බදුකුලී තැන්පතු	1,950,000.00	1,950,000.00
දුරකතන සන්නිවේදන තැන්පතු	15,000.00	15,000.00
එකතුව	**1,965,000.00**	**1,965,000.00**

N-05. දළ ඉදිරියට ගෙනයන ප්‍රමාණයන්

පිරිවැය	**2021/01/01** දිනට ශේෂය (ශ්‍රීලරු)	**2020.01.01** දිනට නිවරදි කිරීම රු.	එකතුකිරීම් (ශ්‍රීලරු)	අපහරණයන් (ශ්‍රීලරු)	**2021/12/31** දිනට ශේෂය (ශ්‍රීලරු)
ජා.ප.ස.කාර්යාල වත්කම්	20,424,849.04	-	3,471,383.80	603,726.43	23,292,506.41
ප්‍රදානයේ මූලික උපකරණ	386,090,399.83	945,775.00	34,850,542.60	72,814,436.29	349,072,281.14
ප්‍රදානයේ අප්‍රධාන උපකරණ	89,708,520.65	38,709.00	7,440,744.42	19,012,312.10	78,175,661.97
එකතුව - වත්කම්	**496,223,769.52**	**984,484.00**	**45,762,670.82**	**92,430,474.82**	**450,540,449.52**

අපහරණය සඳහා ප්‍රතිපාදන

අපහරණය සඳහා ප්‍රතිපාදන	**2021/01/01** දිනට ශේෂය (ශ්‍රීලරු)	**2020.01.01** දිනට නිවරදි කිරීම රු.	එකතුකිරීම් (ශ්‍රීලරු)	අපහරණයන් (ශ්‍රීලරු)	**2021/12/31** දිනට ශේෂය (ශ්‍රීලරු)
ජා.ප.ස.කාර්යාල වත්කම්	9,234,291.92	(50,745.37)	3,128,109.69	213,680.04	12,097,976.19
ප්‍රදානයේ මූලික උපකරණ	152,721,101.10	394,072.92	37,536,515.98	41,903,775.00	148,747,915.03
ප්‍රදානයේ අප්‍රධාන උපකරණ	50,752,450.01	12,903.00	11,283,232.51	14,865,665.73	47,182,919.76
එකතුව - ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන	**212,707,843.03**	**356,230.55**	**51,947,858.17**	**56,983,120.77**	**208,028,310.96**

ශුද්ධ පොත් අගයන්	**2021** (ශ්‍රීලරු)	**2020** (ශ්‍රීලරු)
ජා.ප.ස.කාර්යාල වත්කම්	11,194,530.22	11,190,557.12
ප්‍රදානයේ මූලික උපකරණ	200,324,366.13	233,369,298.73
ප්‍රදානයේ අප්‍රධාන උපකරණ	30,992,742.21	38,956,070.64
එකතුව - ශුද්ධ පොත් අගයන්	**242,511,638.56**	**283,515,926.49**
අඩුකළා - අස්පෘශ්‍ය වත්කම්	1,408,335.00	1,083,335.00
එකතුව - අස්පෘශ්‍ය වත්කම් නොමැතිව ශුද්ධ පොත් අගය	**241,103,803.56**	**282,432,591.49**

N-06. ගෙවිය යුතු දෑ	සටහන්	2021 රු.	2020 රු.
NRC පාර්ශවයන් සඳහා ගෙවිය යුතු		95,559.20	192,434.40
ගෙවිය යුතු දුරකථන සන්නිවේදන		56,088.67	63,222.92
ගෙවිය යුතු විදුලි ගාස්තු		253,508.93	281,685.55
ගෙවිය යුතු ජල ගාස්තු		9,000.00	8,850.00
වෙනත් ගෙවිය යුතු දෑ	7	496,860.88	611,089.51
ගෙවිය යුතු විගණන ගාස්තු - සාමාන්‍ය		428,040.00	428,400.00
ගෙවිය යුතු විගණන ගාස්තු - අභ්‍යන්තර		504,900.00	403,920.00
ගෙවිය යුතු ප්‍රදානයන්		149,772.50	1,557,990.33
ගෙවිය යුතු පශ්චාද් උපාධි දිමනා ප්‍රදාන		5,427,300.00	4,187,987.17
එකතුව		**7,421,030.18**	**7,735,579.88**

N-07. වෙනත් ගෙවිය යුතු දෑ	2021 රු.	2020 රු.
ගෙවිය යුතු දුරකථන සන්නිවේදන	21,640.43	-
ගෙවිය යුතු අතිකාල	4,428.04	28,051.97
Global Parcel සඳහා ගෙවිය යුතු	3,537.00	-
ගෙවිය යුතු කුලිය	433,560.00	-
ගෙවිය යුතු රක්ෂණ	740.17	1,701.94
ගෙවිය යුතු තැපැල් ගාස්තු	7,000.00	2,916.00
හඳුනා නොගත් බැංකු තැන්පතු	25,955.24	83,681.06
ගෙවිය යුතු පවිත්‍රතා සේවා	-	30,270.00
පුහුණුකිරීම් කාර්යමණ්ඩල වැටුප්	-	875.00
රජයේ මුද්‍රණාලයට ගෙවීම්	-	25,449.54
ගෙවිය යුතු නීති ගාස්තු	-	25,750.00
Himanzee සඳහා ගෙවිය යුතු	-	53,294.00
Kent සඳහා ගෙවිය යුතු	-	359,100.00
එකතුව	**496,860.88**	**611,089.51**

N- 08. විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රතිපාදන	2021 රු.
2020/12/31 දිනට ප්‍රතිපාදන	847,420.00
ප්‍රතිපාදන ප්‍රතිවර්තනය	(173,097.50)
21/01/01 දිනට ගැලපුම්කරන ලද ප්‍රතිපාදන	674,322.50
2021 සඳහා ඇස්තමේන්තු කිරීම්	1,172,767.50
(වැඩි)/ හිඟ ප්‍රතිපාදන	**498,445.00**

ජාතික පර්යේෂණ සභාව - ශ්‍රී ලංකාව
2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

N-09. පර්යේෂණ හා සංවර්ධන	**2021** රු.	**2020** රු.
ID ප්‍රදානලාභීන්ගේ පරිභෝජන ද්‍රව්‍ය	15,862,156.57	21,584,393.82
ID ප්‍රදානලාභීන්ගේ PhD පශ්චාද් උපාධි දීමනා	28,714,805.48	20,832,069.06
ID ප්‍රදානලාභීන්ගේ ගමන් වියදම්	1,262,001.42	2,101,194.38
ID ප්‍රදානයන්හි ප්‍රකාශන පිරිවැය	180,699.12	748,140.82
TO වැඩසටහනෙහි පරිභෝජන ද්‍රව්‍ය හා අනෙකුත් වියදම්	6,068,603.08	6,025,057.59
TO ප්‍රදානලාභීන්ගේ PhD පශ්චාද් උපාධි දීමනා	7,945,768.53	13,167,942.74
TO ප්‍රදානලාභීන්ගේ ගමන් වියදම්	117,744.30	1,037,627.37
TO ප්‍රදානලාභීන්ගේ නියමු පිරියත	1,766,850.00	1,162,337.96
PPP වැඩසටහනෙහි පරිභෝජන ද්‍රව්‍ය	439,169.16	488,820.48
PPP ප්‍රදානලාභීන්ගේ PhD පශ්චාද් උපාධි දීමනා	938,214.28	2,087,755.34
PPP ප්‍රදානලාභීන්ගේ ගමන් වියදම්	-	4,926.69
PPP ප්‍රදාන බැහැරින් ඉටුකර ගැනීම	-	63,200.01
EWC ප්‍රදානලාභීන්ගේ පරිභෝජන ද්‍රව්‍ය	471,544.37	473,672.97
EWC ප්‍රදානලාභීන්ගේ PhD පශ්චාද් උපාධි දීමනා	611,500.00	2,122,500.00
EWC ප්‍රදානලාභීන්ගේ ගමන් වියදම්	390.00	7,608.00
OR ප්‍රදානයේ පරිභෝජන ද්‍රව්‍ය	47,382.00	-
OR පශ්චාද් උපාධි දීමනා	220,000.00	-
OR ගමන් වියදම්	95,000.00	-
RR ප්‍රදානයන්හි පරිභෝජන ද්‍රව්‍ය	1,004,682.60	836,295.33
RR ප්‍රදානයන්හි ගමන් වියදම්	-	60,403.00
RR ප්‍රදානයන්හි විවිධ වියදම්	-	18,820.00
RR පශ්චාද් උපාධි දීමනා	150,000.00	-
ප්‍රධාන හා වැඩසටහන් පරිපාලනය	2,282,870.71	3,636,473.23
සුභසාධක වැඩසටහන් වියදම්	855,026.92	582,176.55
මාරුකරන ලද මුදල්	34,704,257.66	15,719,692.10
ජනාධිපති සම්මාන (PASP) වැඩසටහනෙහි වියදම්	1,739,860.24	360,763.75
Asbestos ප්‍රදාන වියදම්	-	39,248.64
ධාරිතා සංවර්ධනය	-	205,150.65
අවසන් කරන ලද ප්‍රදාන වැඩසටහන් වියදම්	5,993,328.59	5,961,232.35
	111,471,855.03	**99,327,502.83**
ප්‍රධාන, අප්‍රධාන උපකරණ ක්ෂය කිරීම	48,819,748.49	51,519,648.03
N-(10)	**160,291,603.52**	**150,847,150.86**
N-(11) භාණ්ඩාගාරයෙන් පුනරාවර්තන නිදහස් කිරීම්	24,845,000.00	28,565,000.00
එකතුව	**185,136,603.52**	**179,412,150.86**

N-12. සැපයුම්, පරිහරණ ද්‍රව්‍ය හා බදු කුළී	**2021** **රු.**	**2020** **රු.**
ගමන් වියදම්	263,752.17	256,534.42
ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	583,940.71	716,562.24
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	46,839.46	92,601.48
ආහාර හා සම්මන්ත්‍රණ	87,734.98	257,425.06
වාහන-අළුත්වැඩියාවන් හා නඩත්තු කිරීම	70,282.14	131,384.57
ගොඩනැගිලි නඩත්තු කිරීම	417,712.00	477,252.89
විගණන ගාස්තු	623,160.00	628,320.00
තැපැල් ගාස්තු	64,065.00	108,764.00
විදුලිය	514,896.50	515,582.37
ජලය	18,000.00	14,850.00
දුරකතන සන්නිවේදන	772,595.60	790,113.66
බලපත්‍ර හා රක්ෂණ	118,329.42	79,458.38
බදු කුළි	5,202,720.00	4,769,205.50
මුද්‍රණ හා වෙළඳ දැන්වීම්	1,119,557.70	315,399.00
PPE නඩත්තු කිරීම්	203,352.56	82,744.92
පරිපාලන වියදම් - Asbestos ප්‍රදාන	87,800.00	54,448.35
අනුග්‍රාහකත්ව වියදම්	324,260.17	608,214.66
වත්කම් අපහරණ වියදම්	-	1,000.00
ධාරිතා සංවර්ධනය	-	-
විශ්‍රාම පාරිතෝෂික වියදම්	498,445.00	-
වෙනත්	337,291.75	469,712.20
එකතුව	**11,354,735.16**	**10,369,573.70**

N- 13. වෙනත් ලැබීම්	**2021** **රු.**	**2020** **රු.**
Asbestos පරිපාලන වියදම්	183,374.10	431,190.00
දණ්ඩන ගාස්තු	-	2,000.00
නිෂ්පාදන භාගය	60,798.00	286,538.00
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	864,500.00	952,500.00
RM ගාස්තු	41,222.20	122,000.00
ණය	104,701.47	72,793.56
හඳුනා නොගත් සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	-	4,000.00
අපහරණය කලයුතු අයිතම ආදායම	3,460.00	15,352.00
අනුග්‍රාහකත්වයන්	600,000.00	-
වෙනත් ලැබීම් - මිලදී ගැනීම් සඳහා	37,501.00	24,000.00
එකතුව	**1,895,556.77**	**1,910,373.56**

N- 14. පර්යේෂණ ප්‍රදාන හා වෙනත් වැඩසටහන්	**2021** **රු.**	**2020** **රු.**
ID ප්‍රදානයන්	98,803,974.00	57,361,635.00
PPP ප්‍රදානයන්	-	-
TO ප්‍රදානයන්	53,300,000.00	7,000,000.00
RR ප්‍රදානයන්	495,504.00	2,805,180.00
Asbestos ප්‍රදානයන්	-	-
ඇගයීම් හා ව්‍යාපෘති අධීක්ෂණය	2,298,620.71	4,109,788.48
ජනාධිපති සම්මාන (PASP)	3,025,760.24	1,663.75
වෙනත් වැඩසටහන්	1,455,026.92	2,371,277.89
ධාරිතා සංවර්ධනය	-	205,150.65
අවසන් කරන ලද ප්‍රදානයන්	23,533,750.00	35,469,691.60
එකතුව	**182,937,635.87**	**109,324,387.37**

N-15. වෙනත් ලැබීම්-C/F	**2021** **රු.**	**2020** **රු.**
Asbestos ප්‍රදාන ලැබීම්	1,833,741.00	431,190.00
නිෂ්පාදන භාගය	281,962.00	235,189.00
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම	885,000.00	956,500.00
RM ගාස්තු	41,222.20	122,000.00
අපහරණය කළයුතු අයිතමයන්ගේ ලැබීම්	3,460.00	15,352.00
අනෙකුත් ලැබීම්	37,500.00	24,000.00
දණ්ඩන ගාස්තු	-	2,000.00
ණය පියවීම සඳහා ලැබීම්	-	208,730.00
හඳුනා නොගත් තැන්පතු	-	83,679.82
අනුග්‍රාහකත්වයන්	600,000.00	-
එකතුව	**1,849,144.20**	**2,078,640.82**

N-16. සේවකයින් සඳහා ගෙවීම් C/F	**2021** **රු.**	**2020** **රු.**
වැටුප් හා වේතන	14,025,212.11	13,438,427.71
EPF	1,817,257.10	1,722,521.65
ETF	363,451.40	344,504.33
අතිකාල	67,088.67	167,048.88
අනෙකුත් දීමනා	560,000.00	647,200.00
එකතුව	**16,833,009.28**	**16,319,702.57**

N-17. අනෙකුත් ගෙවීම් - CF	2021 රු.	2020 රු.
ගමන් වියදම්	263,752.17	256,534.42
ලිපි ද්‍රව්‍ය	583,940.71	691,112.70
ඉන්ධන	46,839.46	92,601.48
ආහාර හා සම්මන්ත්‍රණ	80,558.98	254,185.11
වාහන නඩත්තු කිරීම	70,282.14	131,384.57
කාර්යාලය නඩත්තු කිරීම	447,982.00	479,060.89
PPE නඩත්තු කිරීම	203,352.56	82,744.92
දුරකතන	758,089.42	764,990.71
තැපැල්	56,444.00	111,059.00
විදුලිය	543,073.12	728,896.82
ජලය	17,850.00	21,000.00
බලපත්‍ර හා රක්ෂණ	118,845.80	78,391.76
බදුකුලී	4,769,160.00	5,163,350.50
බැංකු ගාස්තු	9,820.00	3,750.00
මුද්‍රණ හා වෙළඳ දැන්වීම්	1,194,451.70	278,755.00
වෙනත් වියදම්	844,231.75	1,125,812.00
සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම	-	744,750.00
අනුග්‍රාහකත්වය	324,260.17	608,214.66
Asbestos	87,800.00	92,448.35
කාර්යමණ්ඩල ණය	-	208,730.00
එකතුව	**10,420,733.98**	**11,917,773.09**

N-18. ආදායම ලෙස හඳුනාගනු ලැබූ ප්‍රාග්ධන ප්‍රදානයන්	2021 රු.	2020 රු.
පර්යේෂණ හා සංවර්ධන වියදම් එකතුව	111,471,855.03	99,327,502.83
අඩුකළා – මාරුකරන ලද මුදල්	34,704,257.66	15,719,962.10
TO ප්‍රදානයන්හි ආපසු භාරදෙන ලද උපකරණ සඳහා අරමුදලු ලැබීම් 16-018	(353,050.00)	-
එකතුව	**76,414,547.37**	**83,607,810.73**

N-19. ප්‍රාග්ධන වත්කම් මත ක්ෂය කිරීම හා අපහරණය මත පාඩුව	2021 රු.	2020 රු.
2021 වසර සඳහා ක්ෂයකිරීම් එකතුව	51,947,858.17	54,315,799.02
අපහරණය/ මාරුකරන ලද වත්කම් වටිනාකම එකතුව	92,430,474.80	44,156,081.01
අඩුකළා - අපහරණය කරන ලද වත්කම් සඳහා ප්‍රතිපාදන	56,983,120.77	27,993,076.80
එකතුව	**87,395,212.21**	**70,478,803.23**

N-20. 2020 පශ්චාත් උපාධි දීමනා ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය	**2021** **රු.**
ඇමරිකන් වෝටර් අවලංගු කිරීම සඳහා ගෙවීම්	7,176.00
පෙර වසරේ පශ්චාත් උපාධි දීමනා 2021 වසරේ ගෙවීම (18-091)	(80,000.00)
2020 වසරේ ගෙවන ලද විධායක අතිකාල දීමනාව ප්‍රත්‍යාවර්තනය	8,310.00
පශ්චාත් උපාධි දීමනා සඳහා වැඩිපුර ප්‍රතිපාදන ප්‍රත්‍යාවර්තනය	627,500.00
රක්ෂණ ලෙස වැඩිපුර අත්තිකාරම් ලබාදීම ප්‍රත්‍යාවර්තනය	(3,933.23)
ගෙවිය යුතු දෑ ලෙස වැඩිපුර ප්‍රතිපාදන ලබාදීම ප්‍රත්‍යාවර්තනය	303,901.38
ගෙවිය යුතු දෑ මගින් NRC පාර්ශවයන් සඳහා ප්‍රතිපාදන ලබාදීම ප්‍රත්‍යාවර්තනය	123,630.00
වැඩිපුර ප්‍රතිපාදන සලසන ලද විගණන ගාස්තු ප්‍රත්‍යාවර්තනය	15,600.00
විශ්‍රාමික කාර්යමණ්ඩලය සඳහා විශ්‍රාම පාරිතෝෂික ප්‍රත්‍යාවර්තනය	173,097.50
	1,175,281.65

N-21. පෙර වසරේ ක්ෂයකිරීම් සඳහා ගැලපීම්	**2021** **රු.**
හඳුනාගත් පාරිභෝගික ද්‍රව්‍ය උපකරණයක් ලෙස	38,709.00
හඳුනාගත් බැහැරින් සපයාගත් වියදම් උපකරණයක් ලෙස (02 Nos-12-026)	945,775.00
උපකරණ සඳහා ක්ෂයකිරීම් එකතු කිරීම (02) (PPP-12-026)	(406,975.92)
2020 වසරේ වැඩියෙන් ක්ෂයකිරීම	50,745.37
	628,253.45

2020 වසරේ වැඩියෙන් ක්ෂයකිරීම

ඇමුණුම II

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } අයිඑම්ටී/සී/එන්ආර්සී/එෆ්එස්/2021 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජූනි 30 දින

සභාපති
ජාතික පර්යේෂණ සභාව

ජාතික පර්යේෂණ සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ජාතික පර්යේෂණ සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරනලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විතමහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නාලදී.

- භාවිතාකරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන්ඵවිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත්වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 • අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 අනෙකුත් කරුණු

(අ) ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ පර්යේෂණ වසර 05 කින් නිම කළයුතු අතර 2014 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 05 ක් අතරින් පර්යේෂණ 4 ක් පමණක් අවසාන වී තිබුණි. ශ්‍රී ලංකාවේ සර්ප දෂ්ඨ කිරීම් සඳහා බහුසංයුජතා ප්‍රතිවිෂ වර්ගයක් වැඩිදියුණු කිරීමේ පර්යේෂණය වසර 07 ක් ඉක්මවා තිබුණ ද, නිම වී නොතිබුණි.

(ආ) TO-14-04 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් ඩෙංගු වාහකයන් පාලනය කිරීම සඳහා නව කීට ප්‍රභේදයක් සොයාගෙන තිබුණද එම කීටයන් රට තුළ ව්‍යාප්ත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ ඩෙංගු මර්ධනය කිරීමේ සැළැස්මක් ක්‍රියාත්මක කිරීම සිදුවන්නේද යන්න පිළිබඳ අධීක්ෂණයක් ජාතික පර්යේෂණ සභාව විසින් සිදුකිරීම හා ඒ සඳහා පසුවිපරම් කිරීමට අවධානය යොමුකර නොතිබුණි. මේ නිසා උක්ත පර්යේෂණය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) TO-14-05 පර්යේෂණ ව්‍යාපෘතිය මඟින් රු.47,001,209 ක් වැයකර නිදන්ගත වකුගඩු රෝගය පිළිබඳ අධ්‍යයනයක් සිදුකර තිබූ අතර එහි ප්‍රතිඵලය ලෙස වකුගඩු රෝගය වැළඳීමට හේතුව පානීය ජලය තුළ ෆ්ලෝරයිඩ්,කැල්සියම් හා මැග්නීසියම් සංඝටක ඇතුළත්වී තිබීම බව සොයාගෙන තිබුණද එම සංඝටක පානීය ජලය තුල ඇතුළත්වීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා අදාළවන ආයතන සම්බන්ධකර ගැනීම නිසිපරිදි සිදු නොවීම නිසා පර්යේෂණයේ ප්‍රතිඵලය ජාතික අවශ්‍යතාවයට යොදාගැනීම මන්දගාමීවී හෝ මහහැරී ඇති බවත් ඒ පිළිබඳ පසුවිපරම් කිරීම පිළිබඳ ජාතික පර්යේෂණ සභාව අවධානය යොමුකර නොතිබුණ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) පර්යේෂණ ව්‍යාපෘති අංක TO-14-10 මඟින් රු. 41,723,915 ක් වැයකර කිරි නිෂ්පාදනය අතින් ශ්‍රී ලංකාව ස්වයංපෝෂිත කිරීම සඳහා වූ පර්යේෂණය 2020 වර්ෂයේ නිමකර තිබුණ ද, පර්යේෂණය මඟින් හඳුනාගත් තාක්ෂණය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිළිබඳ ප්‍රගතිය

අධික්ෂණය කිරීම හා පසුවිපරම් කිරීමක් ආයතනය සිදුකර නොතිබුණි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව කිරි නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත තත්ත්වයට ළඟාවීමේ අරමුණ ද ඉටු වී නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකාව තුළ විවිධ දේශගුණ තත්ත්වයන්ට ගැළපෙන භෝග ප්‍රභේද සහ වගාකිරීමේ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම හරහා ආහාර සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා වූ පරීක්ෂණය ක්ෂේත්‍ර භෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට ලබාදී තිබූ අතර පර්යේෂණයෙන් වැඩිදියුණු කළ වී, බඩඉරිඟු, මුං ඇට හා අමු මිරිස් ප්‍රභේද පිළිබඳ ප්‍රතිඵලය සමාජගත කිරීම හා එහි ප්‍රගතිය ජාතික පර්යේෂණ සභාව වෙත ලබාගැනීම, ඇගයීම හා පසුවිපරම් කිරීම සිදුවී නොතිබුණි.

(ඊ) පර්යේෂණ සඳහා රජය විසින් සිදුකරන වියදම් ආයෝජනයන් ලෙස ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කිරීම ආයතනයේ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණ ද, උක්ත පර්යේෂණ වියදම් ආයෝජන ලෙස භාවිතා කිරීමට හෝ ආදායම් උත්පාදනය කිරීමට යොමු කිරීමේ විධිමත් වැඩ පිළිවෙලක් නොමැති බව නිරීක්ෂණය විය.

(උ) වසර 05 ක් හෝ ඊට වැඩි කාලයක් වැය වන ඉලක්ක මත පදනම් වූ බහු විෂයානුබද්ධ පර්යේෂණ සඳහා ඇස්තමේන්තුගත වියදම් සිදුවන කාල රාමු හඳුනාගැනීම හා ඒ අනුව අග්‍රිම අවශ්‍යතා සැලසුම් සකස් කර ප්‍රදාන ලබාගෙන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කර නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දින වන විට අවුරුදු 03 සිට 07 දක්වා කාල පරාසය තුළ උපයෝජනය නොවූ එකතුව රු.64,306,587 ක් (පර්යේෂණ 05 ක් සඳහා අදාළ) ජංගම ගිණුම්වල පැවතුණි.

ඩබ්ලිව්.පී.සි. වික්‍රමරත්න

විගණකාධිපති

අයිඑම්ටී/සී/එන්ආර්සී/එෆ්එස්/ 2021

<u>විගණන විමසුම් සඳහා පිළිතුරු</u>

2.3.
(අ) TO 14-18 ව්‍යාපෘතියේ පර්යේෂකයන් නයා, කරවලා, තිත් පොලඟා, කුණකටුවා සහ වැලි පොලඟා යන සර්ප විශේෂ සඳහා එන්නතක් නිෂ්පාදනය කරන අතර මින් පළමු වැන්න නයා, තිත් පොලඟා, කුණකටුවා සහ වැලි පොලඟා යන සර්ප විශේෂ සඳහා නිෂ්පාදනය කල අතර එහි සායනික අත්හදා බැලීම් පේරාදෙණිය ශික්ෂණ රෝහලේ සාර්ථකව නිම කරන ලදී.

කරවලා රහිතව එන්නත නිෂ්පාදනය කිරීමට හේතු වුයේ 2018 අප්‍රේල් 20 වන දින තෙක් කරවල විෂ එකතු කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොදුන් හෙයිනි. කෙසේවෙතත් අප අධ්‍යක්ෂක මණ්ඩලය උපදෙස් ලබා දුන්නේ සර්ප විශේෂ 5ම සඳහා නිෂ්පාදනය සිදු කරන ලෙසයි. 2018 අප්‍රේල් 20 වන දින ලබා දුන් අනුමැතිය මත සර්ප විෂ 2018 ජුලි මස 26 වන දින කොස්ට රිකා රාජ්‍යයේ Universidad de Costa Rica විශ්වවිද්‍යාලය වෙත යවා ඇත.

ඉන්පසු 2019 ඔක්තෝම්බර් 08 වන දින එම විශ්ව විද්‍යාලය, මහාචාර්ය ඉන්දික ගවරම්මාන මහතා හට එන්නත සාර්තක බව දැනුම් දී ඇත. ඉන් මසකට පසු ඔවුන් එන්නතේ තත්ත්ව පාලන වාර්තාව ලබා දී ඇති අතර ඊට අදාල මුල් කෙටුම්පත් හා සායනික ක්‍රමවේදය සකස්කොට 2020 පෙබරවාරි මස 15 වන දින පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුවට (Ethics Review Committee) ඉදිරිපත් කර ඇත. 2020 මැයි 22 වන දින ඔවුන්ගේ අනුමැතිය ලබා දී ඇත. ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් 2020 ජුනි 26 වන දින ආනයන බලපත්‍රය ලබා දී ඇති අතර එන්නත් ගෙන්වීම සඳහා 2020 ජුලි 13 වන දින Universidad de Costa Rica විශ්වවිද්‍යාලය හට විශේෂ තත්ත්ව යටතේ ඉතා අඩු උෂ්ණත්වයකදී එරටින් මෙරටට කුරියර් කිරීම සඳහා ගෙවීම් සිදු කර ඇත.

නමුත් පැවති කොරෝනා තත්වය මත ලෝකයේ ගුවන් ගමන් නැවතීම මත කුරියර් කිරීම කල නොහැකි බව දන්වා ඇත. 2021 අප්‍රේල් මස වන තුරු එය ගෙන්වා ගැනීමට විශේෂ තත්ත්ව සහිත කුරියර් සේවයක් ලබා දීමට අදාල සමාගම් අකැමත්ත ප්‍රකාශ කර තබූ අතර 2021 අප්‍රේල් 30 වන දින අප ආයතනයේ අනුමැතිය එම විශ්වවිද්‍යාලය හරහා වෙන කුරියර් සේවයක් වෙත ලබාදී ලංකාවට 2021 මැයි පළමු සතියේ ලංකාවට පැමිණි අතර ඉන් පසු සායනික අත්හදා බැලීම් සිදු කිරීම ආරම්භ කල අතර ඒ සඳහා සභාව මඟින් අවසර ලබා දී ඇත. ඉහත සඳහන් කල සාධාරණ හේතු මත අප අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ව්‍යාපෘති කාලය දිගු කිරීම සඳහා කටයුතු කරන ලදී.

(ආ) TO 14-04 ව්‍යාපෘතියේ ඉතිරි මුදල රු 3,412,341.52 වන අතර ඔබගේ විගණන නිලධාරීන් විසින් සටහන් කර ඇති අගය නිවැරදි නොවේ. එය ප්‍රතිශතයක් ලෙස ගත් කල 6.9% කි. අවසන් කල සියලු ව්‍යාපෘති වල ඉතිරි මුදල ලබා දුන් මුදලේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 7% කටත් අඩු අගයකි.

TO 14-04 ව්‍යාපෘතිය සෞඛ්‍ය අමාත්‍යංශයේ ඩෙංගු මර්දන ඒකකය සමඟ ඍජුව කටයුතු කරන අතර ඒ සඳහා එම ඒකකයේ ප්‍රධානියා ද සහභාගී වේ. මෙම ව්‍යපෘතියේ සොයා ගැනීම් සිසුන් දැනුවත් කිරීම සඳහා යොදා ගනු ලබයි. පාසල් වල ගුරු අත්පොත් සඳහා මෙම ව්‍යපෘතියේ සොයා ගැනීම් සිසුන් දැනුවත් කිරීම සඳහා යොදා ගනු ලබන අතර ජාතික ඩෙංගු මර්දන ඒකකය අප ව්‍යාපෘතියේ පර්යේෂකයන් සමඟ ඩෙංගු ව්‍යාප්තිය අවම කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ නියමු ව්‍යපෘති සිදු කරන අතර ඒ සඳහා එම ඒකකයේ අධ්‍යක්ෂතුමා සහභාගී වනු ලබයි.

(ඇ) TO 14-05 ව්‍යාපෘතියේ මූලික සොයා ගැනීම වන්නේ වකුගඩු රෝගය සඳහා කැල්සියම් හෝ මැග්නීසියම් සමඟ ෆ්ලෝරයිඩ් ජලයේ පැවතීම වන අතර ඒ පිලිබඳව සෞඛ්‍ය අමාත්‍යංශය දැනුවත් කර ඇති අතර මෙම ව්‍යපෘතියේ සොයා ගැනීම් මහනුවර මහ රෝහලේ වකුගඩු ඒකකය දැනට භාවිතා කරන අතර උතුරු මැද පළාතේ වකුගඩු රෝගයට හේතුවක් වන පිරිසුදු ජල ප්‍රශ්නය නිරකරණය සඳහා අපගේ TO 16-15 ව්‍යාපෘතිය ජාතික ජල සම්පාදන මණ්ඩලය හා එක්ව මේ වන විට කටයුතු කරන අතර ඔවුන් දැනටම ජල පිරිපහදු කිහිපයක් නිපදවා පරිභෝජනයට ලබා දී ඇත. වෙළඳ පොළ ජල පෙරහන් වෙනුවට මෙම රෝගයට සුදුසු පෙරහනක් නිර්මාණය කිරීම TO 16-18 ව්‍යපෘතියෙන් සිදු කරනු ලබයි. මෙම ව්‍යපෘතිය මඟින් සොයා ගත් ජීව ලකුණු (Biomarkers) මහනුවර මහ රෝහලේ අධ්‍යක්ෂතුමා විසින් ලිපියක් මඟින් දන්වා ඇත.

(ඈ)TO 14-10 ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේ කිරි වලින් ස්වයංපෝෂිත රටක් නිර්මාණය කිරීම සඳහා කලයුතු දේ නිර්දේශ කිරීම වන අතර ඔවුන් තම ව්‍යාපෘතිය මඟින් එය සිදු කල අතර ව්‍යාපෘතිය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපල වල සිදු කර ඇත. මෙම ව්‍යපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීම් (Progress review meeting) සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පශු සම්පත් සහ ගොවිපල ප්‍රවර්ධනය සහ කිරි සහ බිත්තර ආශ්‍රිත කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරීන් සහභාගී වූ අතර ඒ පිලිබඳව ඔවුන් දැනුවත් කර ඇත. සත්ව නිෂ්පාදන හා සෞඛය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 2019 ඔක්තෝම්බර් 29 වන දින සමුළුවක් පවත්වා පර්යේෂණයේ නව සොයා ගැනීම පිළිබඳව දැනුවත් කර ඇත. එහිදී ඔවුන් හට ආහාරයට ලබාදෙන නව ආහාර වේල සාදා ගන්නා ආකාරය පිළිබඳව වීඩියෝවක් පැමිණි සියලු දෙනාට ලබාදී ඇත. සත්ව නිෂ්පාදන හා සෞඛය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් ලිපියක් මඟින් මෙම ව්‍යපෘතියේ සොයා ගැනීම් මින්සුන් අතර ප්‍රචලිත කර කිරි වලින් ස්වයංපෝෂිත රටක් නිර්මාණය කිරීම සඳහා කටයුතු කරන බවට දන්වා ඇත. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ රිදියගම ගොවිපලෙහි කිරි ගවයන් අභිජනනය සඳහා මෙම ව්‍යපෘතියේ සොයා ගැනීම් භාවිතා කරන අතර ඒ සඳහා ව්‍යපෘතියේ පර්යේෂකයන් සහභාගී වී ඇත. මධ්‍යම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛය දෙපාර්තමේන්තුවේ කිරි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා වන සංවර්ධන සැලැස්ම සඳහා ව්‍යපෘතියේ සොයා ගැනීම් භාවිතා කර ඇත.

(ඊ) TO 14-24 ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ලංකාවේ කෘෂිකර්මාන්තයේ නියැලෙන පිරිස් එහි ප්‍රතිපල භාවිතයට ගන්නා අතර කෘෂිකර්ම අමාත්‍යාංශය තම නිෂ්පාදන ගොවීන්ට ගෙන යන ව්‍යාපෘති හරහා දැනටම ක්‍රියාත්මක අතර ඒ සඳහා පෞද්ගලික ආයතන හා එක්ව කටයුතු කරයි. ඔවුන්ගෙන් අප මේ වන විට වර්තමාන ප්‍රගතිය විමසා යවා ඇත.

(උ) පර්යේෂක විසින් ව්‍යාපෘති ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳව ව්‍යාපෘති යෝජනාවේ සටහන් කර ඇති අතර අදාල ව්‍යාපෘති ක්‍රියාවට නැවීමට අදාල අමාත්‍යාංශ වල නිලධාරීන් ව්‍යාපෘති වල ඇඟයීම් හමු සඳහා සහභාගී වූ අතර එම අමාත්‍යාංශ වල ලේකම්වරු හට දැනටම මෙම ව්‍යපෘති පිළිබඳව දන්වා යවා ඇති අතර ව්‍යාපෘති වල සොයාගැනීම් අප ආයතනයේ වෙබ් අඩවිය තුලද පලකර ඇත. ජාතික පර්යේෂණ සභාවේ පනත ප්‍රකාරව කර්තව්‍ය වන්නේ රටට ප්‍රයෝජනයක් සහිත ව්‍යාපෘති සඳහා ප්‍රදාන ලබා දීම, පහසුකරලීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ නියාමනය කිරීම වන අතර අප ආයතනය අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ උපරිම උත්සාහය යොදනු ලබයි. මේ කරුණු කාරණා පිළිබඳව විගණන නිලධාරීන් දැනුවත් කර ඇත. පසුගිය අප්‍රියෙල් 27 වන දින අප ආයතනය හා අප අමාත්‍යාංශය සමඟ පැවති සාකච්ඡාවකදී මෙම ව්‍යාපෘති පිළිබඳව සාකච්ඡා සිදු කල අතර ඒ සඳහා අමාත්‍යාංශය යම් පියවරක් ගන්නා බව දන්වා සිටින ලදී.

වසර 5ක් සඳහා ලබාදෙන ඉලක්කගත බහුවිධ පර්යේෂණ ප්‍රදාන සඳහා අපගේ මාර්ගෝපදේශය මඟින් ඔවුන්ට වසරේ සුදුසු කාලයක සුදුසු ආකාරයට මුදල් යොදවා පර්යේෂණ සිදු කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇත. මෙහි අභාවිත කාල ලෙස සටහන් කිරීම නිවැරදි නොවන අතර එම ව්‍යාපෘති සියල්ල තවදුරටත් සිදු කරමින් පවතින පර්යේෂණ වේ. තම ව්‍යාපෘති සඳහා එම මුදල් පර්යේෂකයින් විසින් භාවිතා කිරීම පර්යේෂණ යෝජනාවේ ඇති කාල රාමුව තුල සිදුවේ.

TO 16-18 ව්‍යාපෘතිය දැනට සිදු කරගෙන යන පර්යේෂණයක් වන අතර එය මේ වන විට ඉතා ඉහළ ප්‍රගතියක් පෙන්වයි. එමගින් නිෂ්පාදනය කරනු ලබන ජල පෙරහන් මඟින් වකුගඩු රෝගයට පිළියමක් වන අතර මුදල් ඉපයීමේ මාර්ගයක් වනු ඇත. මෙය දැනට සිදු කරමින් පවතින අවසන් නොවූ ව්‍යාපෘතියකි. මැටි ජල පෙරහන් නිෂ්පාදනය ව්‍යාපෘති ආරම්භයේ නොතිබූ දෙයක් වන අතර මෙම පෙරහන් වාණිජ නිෂ්පාදනය ව්‍යාපෘතියේ පර්යේෂකයන්ගේ කාර්යයක් වන අතර දැනටම ඊට අදාල පුද්ගලයන් සමඟ කටයුතු කරනු ලබයි. ඊට අදාල සහය ඔවුන් ව්‍යාපෘතිය අවසන් කල පසු අප විසින් ලබා දීමට කටයුතු කරන්නෙමු.

මෙම කරුණු සලකා බැලීමෙන් අනතුරුව පර්යේෂණ තෝරාගැනීමේදී අනුගමනය කරන ක්‍රියා පටිපාටිය දැනට වඩා තර කිරීමට ජාතික පර්යේෂණ සභාවේ ඉහළ කළමණාකාරීත්වය තීරණය කරන ලදී.

සම්බන්ධවීම සඳහා තොරතුරු

ජාතික පර්යේෂණ සභාව

120/7, විද්‍යා මාවත, කොළඹ 07.

පොදු දුරකථන:	**011-2675176**	ෆැක්ස්:	**011-2675136**
ඊමේල්:	admin@nrc.gov.lk	වෙබ් අඩවිය:	www.nrc.gov.lk